නොපැමිණීමේ අවසරය: චන්ද්‍ර කරුණාරත්න මයා.

வராதிருக்க அனுமதி: திரு. சந்திர கருணரத்ன

Leave of Absence: Mr. Chandra Karunaratne

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That Mr. Chandra Karunaratne, Member for Nawalapitiya, be granted leave under Section 24 (1) (*e*) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the sittings of the House for a period of three months from 24th November, 1966."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

කෙටුම්පත් පනත් පිළිගැන්වීම

කෙටුම්පත් පනත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

Bills Presented

සමුපකාර තොග වෙළඳ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත

கூட்டுறவு மொத்த விற்பனவு நிலையம் (திருத்த மசோதா

CO-OPERATIVE WHOLESALE ESTABLISHMENT (AMENDMENT) BILL

"to amend the Co-operative Wholesale Establishment Act."

පිළිගන්වන ලද්දේ රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍ය තුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමති ගේත් පාර්ලිමේන්තු ලේකම් ගරු ජේ. ආර්. ජයවර්ධන විසිනි. 1966 දෙසැම්බර් 6 වන අඟහරුවාදා එය දෙවන වර කියවිය යුතුයසිද, එය මුද්‍රණය කළ යුතුයසිද නියෝග කරන ලදි.

இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளி விவகார அமைச்சரதும் பாராளு மன்றக் காரியதரிசியுமான கௌரவ ஜே. ஆர். ஜயவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1966 டிசம்பர் 6, செவ்வாய்க்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமென வும் ஆணையிடப்பட்டது.

Presented by the Hon. J. R. Jayewardene, Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs; to be read a Second time upon Tuesday, 6th December 1966, and to be printed.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

I would like to know before the commencement of Public Business what the arrangements are with regard to the Debate today.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

We are going on till 1 o'clock. We start again at 2 p.m. and go on till 4.30 p.m., when the Question will be put to the House.

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොල)

(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)

(Mr. T. B. Subasinghe—Katugampola)

Each side has two and a half hours? Are you sure you require two and a half hours?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We may be able to demolish your case quicker.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

In the absence of the Hon. Leader of the House will the Hon. Minister of State please inform us of the intention of the Government with regard to the next Sitting of the House ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We shall be meeting in the first week of December, according to the Standing Orders. We may not meet on the 23rd and 24th.

ඇටෝර්නි ජනරාල් : රාජනීතිඥ ඒ. සී. එම්. අමීර් මහතා පත් කිරීම

சட்டத்துறை தலைமை அதிபதி : ஜனாப் ஏ. சி. எம். அமீர், கியு. சி. நியமனம்

ATTORNEY-GENERAL : APPOINTMENT OF MR. A. C. M. AMEER, Q.C.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Motion No. 1.

අනිල් මුණසිංහ මයා. (අගලවත්ත)
(திரு. அனில் முனசிங்க—அகலவத்தை)
(Mr. Anil Moonesinghe—Agalawatta)

ගරු කථානායකතුමනි,—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I rise to a point of Order. Under the Standing Orders he cannot move the Motion.

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

මට අවසර දී තිබෙනවා මේ යෝජනාව ඉදිරිපත් කර—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Under the Standing Orders you cannot move it.

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

මා ඒ ගැන වචන සවලපයක් කථා කරන්න කැමතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ගැන කථා කරන්න බැහැ නොවැ.

Under the Standing Orders you cannot move it.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I rise to a point of Order. Not one of the signatories is present here.

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
(Mr. Anil Moonesinghe)

ඒ වීති ප්‍රශ්නය ගැන වචන සවලපයක් කථා කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මේ වැදගත් යෝජනාව ගැන දැනුම් දෙන විට පළමුවෙන්ම එයට තම අත්සන තබා තිබෙන විරුද්ධ පාර්ශ්වයේ ගරු නායක තුමිය මට කිව්වා, එතුමිය වෙනුවෙන් මේ යෝජනාව ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලෙස.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම බැහැ කියලයි මා කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Please sit down. කරුණා කර වාඩි වෙන්න. I uphold the point of Order, and the Motion lapses. Now we go to the next item—Item No. 2, Inland Revenue (Amendment) Bill.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
We are not moving Item No. 2.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Item No. 3

ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபரதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)
ගරු කථානායකතුමනි,—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
I am sorry the hon. Member is too late.—[*Interruption*]. This is not a laughing matter.

කරුණා කර හිතේ තියා ගන්න මෙය ගරු සභාවක් බව. මීට පෙර නොයෙක් වර නොයෙක් අවස්ථාවල මා කියා තිබෙනව යම් යෝජනාවක් හෝ යම් ප්‍රශ්නයක් හෝ මේ ගරු සභාවට ඉදිරිපත් කළොත් එය ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරයා නිය මිත වේලාවට මේ ගරු සභාව තුළ ඉන්න ඕනෑ බව. එහෙම නැත්නම් එය මේ ගරු සභාවට කරන අගෞරවයක්.

I have pointed out before this that Members who have given notice of Motions or Questions must be present or else they must duly authorize another Member in writing to move the item; otherwise, it is an insult to this House. I have made my Order. The Motion has lapsed.

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் முனசிங்க)
Mr. Anil Moonesinghe)
ගරු කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට මට ලියවිල්ලකින් අවසර දී තිබෙනව.

ඇතෝර්නි-ජනරාල් : රාජනීතිඥ ඒ. සී. එම්. අමීර් මහතා පත් කිරීම

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ තීන්දුව දී ඉවරයි.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)
Since this is a matter of public importance and one of the Movers has arrived here just in time—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
He has not arrived. Where is he?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ගරු කථානායකතුමනි,—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
I am moving—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Will the Hon. Minister of State please sit down?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මට කියන්නට තිබෙන්නේ මොකක්ද කියා කරුණාකර ඇහුම්කන් දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඉඩ දෙන්නෙ නැහැ කිව්වොත් ඉඩ නොදෙන බව දන්නවනෙ. කරුණාකර වාඩි වෙන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ඔබතුමාට යම්කිසි ප්‍රකාශයක් කිරීමටයි මා නැගී සිටියේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ගැන මගේ තීන්දුව දී ඉවරයි. කරුණාකර වාඩිවෙන්න. හබරාදුව ගරු මන්ත්‍රීතුමා නිතරම ඔය විධියට නැගිට නැගිට කථා කරන්න හදනවා. ඒ ගැන මට කන්ගාවුයි. කරුණාකර වාඩි වෙන්න.

ආණඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
அரசமைப்புத் திருத்தம்
REVISION OF THE CONSTITUTION

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That a Select Committee of fifteen Members be appointed to join with a Select Committee to be appointed by the Senate as a Joint Select Committee to consider the revision of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, and other written law with reference to the following among such other matters as the Committee may consider necessary—

(1) the establishment of a Republic ;

(2) the guaranteeing of fundamental rights ;

(3) the position of the Senate and Appointed Members of the House of Representatives ; and

(4) the Public Service Commission and Judicial Service Commission ;

that the Committee have power to send for persons, papers and records ; that the Committee do sit notwithstanding the adjournment of the House and that six Members be the quorum of the Committee."

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවට මීට කලින් පිළිගත් යෝජනාවක් අනුව ක්‍රියා කිරීමටයි, මේ යෝජනාව ගෙනෙන්නෙ. ආණඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා මේ ගරු සභාවෙන් හා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය කියන යෝජනාවක් මේ ගරු සභාව පිළිගත්ත. ඒ යෝජනාව අනුව ඒ විශේෂ කාරක සභාවට මන්ත්‍රීවරුන් 15 දෙනෙකු පත් කළ යුතුය කියලයි, මේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ. මේ යෝජනාව මේ ගරු සභාවට පිළිගැන්වීම සඳහා දීර්ඝ කථාවක් කළ යුතුය කියා මා අදහස් කරන්නෙ නැහැ. ඒ නිසා මේ යෝජනාව පිළිගත යුතුය කියා මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.
வினா எடுத்தியம்பப் பெற்றது.
Question proposed.

පූ. භා. 10.25

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I do not think it is necessary to appoint fifteen Members of this House to sit on this Select Committee and I should like to state why. The Opposition has already indicated to the Government, in discussion in your Chambers, that no Member of the Opposition intends to participate in this Select Committee. As is known, there is a sharp difference of opinion between the Government and the Opposition in the matter of the Constitution. When we were not in this House the Government sponsored a Motion for the appointment of a Select Committee to revise the existing Constitution. That Motion was passed in our absence.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Why ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

It was passed in our absence.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Who asked you to be absent ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

In spite of our absence it was passed. Even prior to our absence we had given notice of a Motion, which

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

appears on the Order Paper, demanding not a revision of the existing Constitution but the appointment of a Select Committee to prepare a draft for an entirely new and free Constitution. It has been our position that no purpose would be served in trying to amend a fundamentally unamendable and reactionary Constitution—within the eighteen or so years after this Constitution has been in existence we have recognized the essentially reactionary character and weaknesses of this Constitution—and that the interests of this country demand that we repudiate it altogether and set about doing what we should have done in the first instance, namely, the drafting of a new Constitution. For that reason no Member of the Opposition intends—I am authorized to say this by the Opposition—to serve as a Member of this Select Committee.

If the Government wishes to have a Select Committee of its own, then I do not see the need for the appointment of fifteen Members. My Friends may as well have a group meeting and decide whatever they want to do and put forward their suggestions and proposals in the form of a draft Bill to this House. Then we will have an opportunity of commenting on it. It seems to me that there is no need to perpetuate a farce; and that is what will happen by accepting this Motion to have a Select Committee in which both sides of the House are not going to participate.

If you want to set up a Select Committee, it is far better to reduce the number to that proportion which the Government would normally have. Then let the Government carry on with whatever they want, and we shall take whatever remedial action we can. That is why I say that I do not think that the attempt to throw sand in the eyes of the people will succeed. It is not necessary to have such a large number of Members to form the Select Committee. The wisest thing for the Government to do is to withdraw the Motion itself in view of the stalemate reached in this matter.

ප. භා. 10.30

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr Leslie Goonewardene)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම ටිකක් පුදුම වෙනව. මක්නිසාද, මෙම යෝජනාව පිළිබඳව විරුද්ධ පක්ෂය දරණ මතය කුමක්ද කියා අද ඊයේ සිට නොවෙයි පසුගිය වර්ෂයේ සිටම ආණ්ඩු පක්ෂය දන්න නිසයි. ආණ්ඩුව විසින් මේ අන්දමේ යෝජනාවක් පසුගිය වර්ෂයේත් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ අවස්ථාවේදී විරුද්ධ පක්ෂය විසිනුත් වෙන විධියේ යෝජනාවක්—මේ යෝජනාවෙන් අදහස් කර තිබෙන පරිදි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් කිරීමට නොව, මේ රටට සරිලන අන්දමට, මේ රටේ ස්වාධීනතාව රැකෙන ආකාරයට අභිනව ව්‍යවස්ථාවක් සකස් කළයුතුය කියා—යෝජනාවක් ඉදිරිපත් කළා. පසුගිය වර්ෂයේදී ඒ යෝජනා දෙකම න්‍යාය පත්‍රයේ තිබුණේවී නමුත් විරුද්ධ පක්ෂයේ සහාය නැතිව මේ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් වැඩක් නැත යන්න ආණ්ඩුව විසින් පිළිගෙන මේ යෝජනාව ඉදිරිපත් කළේ නැහැ. මේ යෝජනාව ඉදිරිපත් වූ සෑම අවස්ථාවකදීම මේ යෝජනාව ඉදිරිපත් නොකර වෙන වැඩ, වෙන යෝජනා හා කෙටුම්පත් පනත් ඉදිරිපත් කළා. මේ යෝජනාව සම්බන්ධව එවැනි තත්ත්වයක් තිබියදී මේ වර්ෂයේදීත් මේ යෝජනාව මේ අන්දමට ගරු සභාව ඉදිරිපිට තැබීමට ක්‍රියා කරන්නේ කුමක් නිසාද කියා මේ යෝජනාව ඉදිරිපත් කළ රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අපට කියා දුන්නෙ නැහැ. මේ යෝජනාව නැවතත් ඉදිරිපත් කරන්නෙ කුමක් නිසාද කියා අපට තෝරා දීමට එතුමාට යුතුකමක් තිබුණා. සමහර විට එක්තරා න්‍යායක් උඩ එතුමා ක්‍රියා කරනවාද කියා මා දන්නෙ නැහැ. මේ යෝජනාවට සම්බන්ධ මුල් යෝජනාව සම්මත වූ අවස්ථාවේදී විරුද්ධ පක්ෂය වෙනයම් හේතුවක් කරනකොටගෙන මේ ගරු සභාව වර්ජනය කරමින් සිටියා. විරුද්ධ පක්ෂය නොසිටි නිසා එම යෝජනාවත් තවත් යෝජනා හතළිස් ගණනකුත් කිසිම විවාදයක් නැතිව එක දවසේදීම සම්මත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

වුණා. ඉතින් මේ ආණ්ඩුව ඒක ප්‍රජාතන්ත්‍රවාදය කියා කල්පනා කරනවා නම් මගේ විරුද්ධත්වයක් ඇත්තෙ නැහැ. විරුද්ධ පක්ෂය මේ ගරු සභාවේ නොසිටි නිසා එක දවසකදි යෝජනා හතළිස් ගණනක් සම්මත කර ගන්නට පුළුවන් වූ නිසා, ඒ අනුව මේ ගරු සභාවේ ක්‍රියා කිරීමටත් බලය තිබෙනවාය යන අදහසින් මේ ආණ්ඩුව වැඩ කරගෙන යනවා නම්, මේ ආණ්ඩුව ආරක්ෂා කරන වාය කියන ප්‍රජාතන්ත්‍රවාදයෙ හැටි රටටත් මහජනතාවටත් පෙන්නුම් කර දීමට එය හොඳම නිදර්ශනයක් වෙනව. මක්නිසාද, විරුද්ධ පක්ෂයේ ආධාරය නැතිව දැන් මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධ කටයුතු කරන්නට කොහෙත්ම පුළුවන් කමක් නැති නිසයි.

ගරු කථානායකතුමනී, විරුද්ධ පක්ෂය කරුණු කීපයක් නිසා මේ යෝජනාවට විරුද්ධ වී තිබෙනවා. මේ යෝජ නාව පිළිබඳව ආණ්ඩු පක්ෂය අපේ අදහස්වලට එකඟ නොවන බව මා දන්නව. මීට පෙර වතීවලදී විරුද්ධ පක්ෂය මේ යෝජ නාවට පක්ෂ වුණා නම්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණයක් කිරීමට විරුද්ධ පක්ෂය සතුටු වුණා නම්, දැන් හදිසියෙන්ම මේ යෝජනාවට විරුද්ධ වුණේ මක්නිසාද කියා විරුද්ධ පක්ෂයෙන් ප්‍රශ්න කරනව. ඇත්ත වශයෙන්ම යුක්ති සහගත අදහස් උඩ තමයි විරුද්ධ පක්ෂය මේ යෝජනාව පිළිබඳව කලින් දැරූ අද හස් වෙනස් කළේ. මේ යෝජනාව පිළි බඳව විරුද්ධ පක්ෂය මුලින් දැරූ අදහස් වෙනස් කිරීමට පසුගිය අවුරුදු එකහමාරක් දෙකක් වූ කාලය ඇතුළත යුක්තිසහගත හේතූන් ඇතිවී තිබෙනවා. අපේ රටට සම්පූර්ණ ජාතික නිදහස තිබෙනවාය කිව් වත්, පසුගිය කාලයේ වූ යම් යම් සිද්ධීන් නිසා අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව ඒ කියන ජාතික නිදහසේ සෑහෙන සීමා වක් තිබෙන බව අපට පිළිගන්නට සිද්ධ වී තිබෙනවා. එසේ නැතිව අප මේ යෝජ නාවට විරුද්ධ වූයේ ආණ්ඩුවේ වැඩ කඩා කප්පල් කිරීමේ අදහසින්වත්, අපේ රටට සුදුසු ආකාරයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සියළුම පක්ෂවල සහාය ඇතිව සකස් කිරී මට අපේ තිබෙන විරුද්ධත්වයක් නිසා වත් නොවෙයි. සියළුම පක්ෂවල සහාය ඇතිව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරී මට විරුද්ධ පක්ෂය සූදානම්ව සිටිනව. ඒ නිසා තමයි අපි ගිය වතීයේ සිටම යෝජ නාවකුත් ඉදිරිපත් කළේ, අළුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට නම් අපි ආණ්ඩු පක්ෂයත් සමග සහයෝගයෙන් ක්‍රියා කරන්න සූදානම්ය කියා. මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට සතුටු වීමට ගිය අවුරුද්දේ අපට කිසිම පුළුවන්කමක් තිබුනෙත් නැහැ; මේ අවුරුද්දේ කිසිම පුළුවන්කමක් ඇත්තෙත් නැහැ.

ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)

(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

ඒ ඇයි?

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

ඒ ඇයි කියා අගමැතිතුමා අහනව. මම ඒ ප්‍රශ්නයට කෙටියෙන් පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙනව, තමුන්නාන්සේ ගෙ අවසරය ඇතිව. මක්නිසාද අපට ඒ විධියේ පුළුවන්කමක් නැත්තෙ? මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ අපට—මේ ගරු සභාවට—මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වුනත් වෙනස් කිරීමට බලය නැති බව රාජාධිකරණයේ නඩු තීන්දුවක් දුන් නඩු කාර මහත්වරු කියා තිබෙනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ලෝඩ් පියර්ස් මේ ගැන තමන්ගෙ මතය ඉතා පැහැදිලිව කියා තිබෙනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ ගැන නඩු තීන්දුවක් තියෙනවද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මේ ප්‍රශ්නය ගැන නඩු තීන්දුවක් නම් ඇති වෙලා නැති බව මම පිළිගන්නව. මේ ගැන කටයුතු කරන්න මේ සම්බන්ධයෙන්ම නඩු තීන්දුවක් ඇති වන තෙක් අප ඉන්න ඕනෑය කියා මම හිතන්නෙ නැහැ. මේ ප්‍රශ්නයට හුරු ප්‍රශ්නයක් ගැන නඩු තීන්දුවක් දෙන අවස්ථාවකදී ලෝඩ් පියර්ස් මේ සම්බන්ධව තමන්ගේ මතය පැහැදිලිව කියා තිබෙනවා. එසේ නැතිව රාජාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය මේ ප්‍රශ්නය ගැනම තීන්දුවක් දීල නැහැ. ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ "එන්ට්‍රෙන්ච්ඩ් ක්ලෝස්"—entrenched clause—කියා කොටසක් තිබෙනවය, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා අනුව පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන්වත් එය වෙනස් කරන්න බලයක් නැත කියා ලෝඩ් පියර්ස් පැහැදිලිව කියා තිබෙනව. මේ ප්‍රශ්නය ගැනම තීන්දුවක් ලබා ගැනීම සඳහා නඩුවක් රාජාධිකරණයට ඉදිරිපත් වෙලා නැතත් මීට හුරු ප්‍රශ්නයක් සම්බන්ධ නඩුවකදී කියා තිබෙනව, එන්ට්‍රෙන්ච්ඩ් ක්ලෝස් එකක් වන 29 වැනි වගන්තිය යටතේ තිබෙන කිසිවක් වෙනස් කිරීමට පාර්ලිමේන්තුවට බලයක් නැත කියා.

මෙය නඩු තීන්දුවකින් තීරණය කළ දෙයක් නොවේය කියා මේ ගැන නිදහසට කරුණු කියන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙන බව මම දන්නව. ලතින් භාෂාවෙන් මෙවැනි ප්‍රකාශයකට කියන්නෙ "ඔබිටර් ඩික්ටා" කියලයි. යම් කිසි නඩුවක තීන්දුවක් දෙන අවස්ථාවකදී වෙන යම් කාරණාවක් සම්බන්ධව කී දෙයක්. එවැනි දේකට නඩු තීන්දුවක බලයක් නැත කියා තර්කයක් වශයෙන් ඉදිරිපත් කරන්න පුළුවනි. නමුත් ගරු කථානායක තුමනි, මේ සම්බන්ධව අපේ සිත්වල ලොකු සැකයක් තියෙනව. මේ "ඔබිටර් ඩික්ටා" කියන ඒවා බලපාන්නෙ නැත කියා කිව්වත් පසුව ඒ අනුව නඩු තීන්දු දීල තියෙනව. ඒ කාරණය ගැන මම එක නිදසුනක් පමණක් සඳහන් කරන්න බලාපොරොත්තු වෙනව.

අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව "ලෙජිස්ලේචර්"— Legislature— හෙවත් නීති සම්පාදනය කරන කොටස—ඒ කියන්නෙ සෙනෙට් සභාව සහ මේ ගරු සභාව, Executive—"එක්සෙකටිව්" හෙවත් නීති ක්‍රියාවේ යොදන කොටස, "ජුඩිෂියරි"—Judiciary—හෙවත් විනිශ්චය දෙන කොටස යනුවෙන් කොටස් තුනක් වෙන් කර තිබෙනවය, ඒ ගැන නොසලකා පනතක් සම්මත කර ගන්න බැරිය කියන කාරණය "ඔබිටර් ඩික්ටා" එකක් හැටියට නඩු තීන්දුවකදී කියා තිබුනා. මේක නඩු තීන්දුවක් නොවන නිසා—මේ ප්‍රශ්නය ගැන දුන්න තීරණයක් නොවන නිසා—මේකේ ඒ තරම් බලපෑමක් නැත කියා මේ රටේ සිටින උසස් නීතිඥ මහත්වරු ඒ කාලයේ කල්පනා කළා. නමුත් කුමන්ත්‍රණ නඩුවෙදි මොකද වුනේ? කලින් obiter dicta එකක් හැටියට සලකා වලංගු නැතෙයි කියපු තීන්දුවක් කුමන්ත්‍රණ නඩුවෙ ඇපෑලෙදි වලංගු දෙයක් හැටියට පත් වුණා. [බාධා කිරීමක්] මම කියන්නෙ ලෝඩ් පියර්ස් කළ ප්‍රකාශයක්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එහෙම කියා නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
එක්තරා කාරණයක් පිළිබඳව නඩු තීන්දුවක් දෙන අවස්ථාවේදී කරන ලද ප්‍රකාශයක් එය. එය ප්‍රකාශ කර තිබෙනව. මේ පිළිබඳව අපි වෙනත් ආකාරයකට කල්පනා කළත් හෙට ඒ ආකාරයට සිදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

වෙන්ට ඉඩ තියෙනව. Legislature, Executive Judiciary යනුවෙන් කොටස් තුනකට අපේ ආණ්ඩු ව්‍යවස්ථාව සකස් කර තිබෙනවාය, ඊට පටහැනිව මෙහි නීති සකස් කරන්ට බැරිය කියන ප්‍රකාශය කලින් ඇති වුණාම අපේ රටේ උසස් විශේෂඥයන් කිව එය බලපාන්නෙ නැති බව. එම ප්‍රකාශය කර තිබෙන්නෙ වෙනත් කාරණයක් පිළිබඳ නඩු තීන්දුවක් දෙන අවස්ථාවකය, එම නිසා එය obiter dicta එකක් හැටියට සැලකෙනවය කිව. නමුත් කුමන්ත්‍රණ නඩුවෙ ඇපෑලෙදී ඒ කාරණය ප්‍රිවි කවුන්සලය මගින් පිළිගන්ට යෙදුණ. දැන් නීතිගත කර තිබෙනව ඒ පිළිගැනීම.

එම වැරදිකරුවන් නිදහස් වුණේ කොහොමද? අපේ රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ Legislature, Executive, Judiciary, යන කොටස් තුන ගැන සඳහන් වෙනව. විශෙෂයෙන් Judiciary යනුවෙන් කොටසක් සඳහන් වෙනව. ඊට අයිති දේ මෙම ගරු සභාවෙ කරන්ට බැරිය කියා කලින් ප්‍රකාශ වුණාම එය සැලකුවෙ obiter dicta එකක් වශයෙනුයි. නමුත් එය අද පිළිගත් නීතිය වෙලා තියෙනව. එම නිසා මේ පිළිබඳව අපේ යුක්ති සහගත සැකයක් පවතිනව. අප මෙහි රැස් වී 2/3 ක් ඡන්දය ඇතුව නීතියක් සම්මත කර ගත්තත් ප්‍රිවි කවුන්සලයට ඇපෑලක් දමා එය 29 වන වගන්තියට විරුද්ධය කියා පෙන්නුම් කරන්ට පුළුවනි. මෙම සභාවෙ 213 ඡන්දයෙන්ම එම වගන්තිය වෙනස් කරන්ට බැරිය කියන තීන්දුව ප්‍රිවි කවුන්සලයෙන් ලැබෙන්ට ඉඩ තිබෙනවය කියන යුක්ති සහගත සැකය අප තුළ පවතිනව.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක්ය කියන දෙය සෙල්ලම් කරන්ට පුළුවන් දෙයක් නොවෙයි. එහි සඳහන් වන වගන්ති යුක්ති සහගත ලෙස අපි ක්‍රියාවට යොදනව නම්, අප ඇති කරන යම් යම් ව්‍යවස්ථා වලංගුද නැද්ද කියන ප්‍රශ්නය පිළිබඳව සැක ඇති වන විදියට ක්‍රියා කරන්ට අපට බැහැ. එසේ කරනව නම් එය වගකීමෙන් තොර වැඩක්.

ලංකාවට නිදහස ලැබුණු අවස්ථාවෙදි බුරුමය ඉන්දියාව වැනි රටවල් මෙන් අපි එකතු වෙලා අපට වුවමනා කරන විදියට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගත්තෙ නැහැ. ඉන්දියාවට නිදහස ලැබුණට පස්සෙ ඒ රටේ මැතිවරණයක් තබා එමගින් පත් වෙච්ච මන්ත්‍රීවරුන් රැස්වී ඒ රටට සුදුසුයයි කිවහැකි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගත්ත. එම ව්‍යවස්ථාව තමයි අද ඉන්දියාණ්ඩුව පිළිගෙන තිබෙන්නෙ. බුරුමයත් ක්‍රියා කළේ ඒ අන්දමටයි. නමුත් ලංකාවෙ අපට නිදහස ලැබුණට පස්සෙ වෙනත් පිළිවෙළකටයි කටයුතු කෙරුණෙ. මහජන ඡන්දයෙන් පත්වෙච්ච අපේ මන්ත්‍රීන් එකතු වෙලා මේ රටට ගැළපෙන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළේ නැහැ. ඒ වෙනුවට මොකද කළේ? අද අපට බලපාන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කළේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසිනුයි. එම නිසා ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අපේම වුවමනා එපාකම් අනුව මේ රටට සරිලන අන්දමට සාදන ලද ව්‍යවස්ථාවක්ය කියා අපට පිළිගන්ට අමාරුයි. මෙපමණ කාලයක් අපි මෙම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ වැඩ කළා. අප රටට නිදහස ලැබී තිබුණත්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි නොයෙකුත් අඩුපාඩුකම් තිබුණා. ඒ සියළු අඩුපාඩුකම් ගැන නොසලකා, එයින් තුනෙන් දෙකක්වත් හෙමින් හෙමින් හදාගෙන කටයුතු කර ගෙන යන්න පුළුවන්යයි හැඟීමක් අප තුළ තිබුණ. නමුත් ගරු කථානායකතුමනි, ඊයෙ-පෙරේදා සිට අපේ හිත්වල ලොකු සැකයක් ඇති වී තිබෙනව. ඒ සැකයට හේතුව මෙයයි. මෙම ව්‍යවස්ථාව සකස් කර තිබෙන්නෙ කලින් අපේ රට පාලනය කරගෙන සිටි පාලකයින්ගෙ බලය ඉතුරු වන ආකාරයටය කියන සැකය තහවුරු වන විධියේ නඩු තීන්දු කීපයක් පසුගිය වර්ෂ එකක—දෙකක කාලය තුළදි, ප්‍රිවිකවුන්සලය මගින් දී තිබෙනව. යම්කිසි විධියකින් ආණ්ඩුව පිළිගන්නවා නම්, ආණ්ඩු පක්ෂයෙන් කියනවා නම්, මෙය පිළියෙළ වී ඇති ආකාරය වැරදියි, එය සකස් කිරීම ප්‍රමාද වුණාය කියා ඇත්ත වශයෙන්ම අපි එය පිළිගන්න සූදානම්. මන්ද? මේ අන්දමෙ නඩු තීන්දු දෙන ලද්දේ අද ඊයේ සිට නොවෙයි, 1964 අවුරුද්දේ සිටයි. එම නිසා 1964 සිට මේ ප්‍රශ්නය ගැන උනන්දුවක් දක්වන්න යුතුකමක් තිබුණාය, එහෙත් එය ප්‍රමාද වුණාය කියනවා නම්, එය මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිගන්න සූදානම්. ඇත්ත වශයෙන්ම අප මේ ප්‍රශ්නය ගැන දැක්විය යුතු සැලකිල්ල දැක්වීම ප්‍රමාද වී තිබෙනවා. නමුත් පමා වී නමුදු, අවුරුද්දකින්—දෙකකින් පමා වී නමුදු මේ කාරණය ගැන සැලකිලිමත් විය යුතු නිසාත්, නිශ්ශබ්ද වීමෙන් රටට කරන්නෙ වරදක් නිසාත් තමයි අප මේ කාරණය ගැන වඩාත් උනන්දුවෙන් ක්‍රියා කළ යුතු බව පෙන්නා දෙන්නෙ. එසේ නැතිනම් අපට බැරිකමක් නැහැ මේ යෝජනාව හොඳයයි කියා පිළිගෙන ඊට අපේ සහයෝගය දී වර්තමාන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අඩුපාඩුකම් රාශියක් හරිගස්සා ගැනීමට ක්‍රියා කිරීමට. නමුත් එසින් ප්‍රශ්නය නියම ආකාරයෙන් විසඳෙනවාය කියන කාරණය ගැන අප සිත් තුළ ඇත්තෙ විශාල සැකයක්. අන්න ඒ නිසා තමයි, අප මේ කාරණය ගැන මේ අන්දමට ක්‍රියා කරන්නෙ. එසේ නැතුව ආණ්ඩු පක්ෂය තුළ අප දරන දේශපාලන අදහස්වලට වඩා විරුද්ධ අදහස් තිබෙනවාය, දේශපාලන මත භේද තිබෙනවාය කියා කල්පනා කර, තාවකාලික වශයෙන් දේශපාලන වාසි ලබාගැනීමේ අටියෙන් ගන්නා පියවරක් නොවන බව මේ අවස්ථාවේදී විශෙෂයෙන්ම තමුන්නාන්සේට තරයේ කියා සිටිනවා. මේ ප්‍රශ්නය ගැන මට කියන්න ඇත්තෙ, අපට දැන් වුවමනා කර තිබෙන්නෙ රටට සරිලන අන්දමේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් බවයි.

ඊළඟ කාරණය: එසේ සකස් කරන ව්‍යවස්ථා, මේ ගරු සභාවේ ස්වාධීනත්වයට බාධාවක් නොවන අන්දමට, කාටවත් යටත් නොවී තීරණ ගැනීමට පුළුවන් ආකාරයට සකස් විය යුතුයි. ආණ්ඩු පක්ෂය මොන මොන විධියෙ දේවල් කිවත් ආණ්ඩු පක්ෂයේ කියුම් හැකි තරම් දුරට පිළිගත්තත්, 29 වන වගන්තිය ඒ ආකාරයෙන්ම තිබෙන තුරු අපට නියම නිදහසක් තිබෙනවාද කියන සැකයක් කා තුළත් ඇති වෙනවා. එපමණක් නොවෙයි, ඒ අන්දමට වගන්තිය තිබෙන තුරු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට බලයක් තිබෙනවාද කියන කාරණය ගැන ලොකු සැකයක්, ස්වාධීනව කල්පනා කරන කා තුළ වුණත් ඇති වීම සාධාරණයි.

ගරු කථානායකතුමනි, සමහර විට අප කවුරුත් එක විධියට කල්පනා නොකරන, සමහර විට මෙම රජයත් වැදගත් කොට නොසලකන, ප්‍රශ්නයක් නම් ආගම පිළිබඳ ප්‍රශ්නයයි. රජයට, රජයක් වශයෙන් ආගමක් නැති වුණත් මේ රටේ වැඩි දෙනා බෞද්ධයන් නිසා බෞද්ධාගමට විශෙෂ තැනක් දීම යුතුකමක්. ඒ විශෙෂ තැන දිය හැක්කේ බුද්ධාගම රජයේ ආගම කිරීමෙන්ය කිවත්, වෙනත් විධියකින්ය කිවත්, 29 වන වගන්තිය ඒ ආකාරයෙන්ම තිබෙන තුරු ඊට ඉඩක් තිබෙනවාද නැද්ද කියන කාරණය ගැනත් සලකා බැලීම වැදගත්. අන්න ඒ අනුව කල්පනා කරන විට, මෙයත් වැදගත් ප්‍රශ්නයක්. මේ රටේ පවතින තත්ත්වය යටතේ වැඩි දෙනා වන බෞද්ධයන්ගේ මතයට යටත් විය යුතු යයි මා නම් කල්පනා කරනවා. එසේ වුවද වෙන කිසිම ආගමකට හානියක් කළ යුතු නැහැ. වෙනත් ආගම් අදහන්නවුන්ට කිසිම වරදක් කරන්නැයි මා කියන්නේ නැහැ. මේ රටේ වැඩි දෙනා වන බෞද්ධයන්ට ඔවුන්ගේ ආගම සඳහා රජයෙන් සැලකිල්ලක් ලැබිය යුතුය යන මතයක් ඔවුන් දරණ නිසා අප ඒ මතය පිළිගත යුතුයි.

එය ඒ තරම් භයානක කාරණයක් නොවෙයි. එංගලන්තය දෙස බලන විට එහි රජයේ ආගම ක්‍රිස්තියානිය බව අපට පෙනෙනවා. එහි රජයේ කටයුතු පටන් ගන්නේ එංගලන්ත සභාවේ පූජකවරුන්ගේ දේව මෙහෙයන් පැවැත්වීමෙන් පසුවයි. ඉන් එහි සිටින අනිකුත් ආගමික කොටස්වලට හානියක් වෙතැයි මා හිතන්නේ නෑ.

ලංකාවේත් බෞද්ධාගමට ඒ විධියේ තත්ත්වයක් දෙන්නට පුළුවනි. වෙනත් කිසිම ආගමක් අදහන කෙනකුට හානියක් නොවන පරිදි ඒ තත්ත්වය දෙන්නට පුළුවනි. මේ රටේ වැඩි දෙනා වන බෞද්ධයන් මේ කාරණය තදින් අපේක්ෂා කරනවා නම් අප එය ඉෂ්ට කිරීමට මැළි විය යුතු නැහැ. එහෙත් දැනට ඇති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 29 වැනි වගන්තිය යටතේ මේ කටයුත්ත කළ නොහැකියි. ඒ වගන්තිය නිසා අඩු ගාණේ මේ පිළිබඳව සැකයක්වත් ඇති වෙනවා. බුද්ධාගමට විශේෂ තැනක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

දෙන්නට ගියොත් 29 වැනි වගන්තිය අනුව එක් කොටසකට විශේෂ තැනක් දුන්නා සේ සලකන්නට පුළුවන් වෙනවා. බෞද්ධයන් වන වැඩි පිරිස රජයත් සමඟ විශේෂ සම්බන්ධ කමක් ඇති කරගෙන තිබෙනවා යයි කියමින් ප්‍රිවි කවුන්සලයට ඇපෑලක් ඉදිරිපත් කරන්නට සමහරුන්ට ඉඩ තිබෙනවා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
කොමිටියට කියන්න.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ඊට වඩා පිරිසිදුව මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්නට ඕනෑ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
වාර්තාව දෙස බලන්නෙ නැද්ද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
වාර්තාව ඒ පැත්තට බරව ලියන්නටත් පුළුවනි, මේ පැත්තට බරව ලියන්නටත් පුළුවනි, නමුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව නීති ගත වෙලා තියෙනවා. ලේ බිදක්වත් නොහෙළා ජාතික නිදහස දිනා ගත්තා යයි ඩී. එස්. සේනානායක මහතා ඒ කාලයේදි කියද්දි අපට නම් ලොකු සැකයක් ඇති වුණා. එහෙයින් අප එදා කීවේ එය ව්‍යාජ නිදහසක් බවයි. නමුත් කල් යෑමේදී සෑහෙන තරමක් දුරට අපට බලය පැවරී ඇති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ලැබී තිබෙන බව අපට කල්පනා වුණා. එසේ වුවද දැන් අපට නැවත පෙනී යන්නේ අප මුලින් ව්‍යාජ නිදහස යනුවෙන් කී දෙයෙහි සත්‍යතාවක් ඇති බවයි. ව්‍යාජ නිදහස කියන මතයෙහි යම්කිසි ඇත්තකුත් තිබෙන බව දැන් පෙනෙනවා. අපට සම්පූර්ණ වශයෙන්ම ජාතික නිදහස ලැබී නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කාටද යටත්?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අප යටත් වී සිටින්නේ අධිරාජ්‍යවාදීන් විසින් අප වෙත පවරනු ලැබ ඇති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවටයි. තුනෙන් දෙකක ඡන්දය ලබාගෙනවත් එහි 29 වන වගන්තිය වෙනස් කරන්නට පුළුවන්ද කියන කාරණය ගැන යටත් පිරිසෙයින් අප තුළ සැකයක් තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එහෙම නම් කොහොමද වෙනස් කරන්නෙ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
වැරදි මාර්ගයක ගොස් වැඩක් නැහැ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
වෙනස් කරල බලමු.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
බැලුවා ඇති. 1948 සිටම බැලුවා. නමුත් දැන් බලන කොට බැහැ. අපට පෙනෙන්නෙ එහෙමයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
දුර බලමු. [බාධා කිරීමක්]

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
හැමදාම බලමු බලමු කියන්නෙ නැතුව, අග්නිදිග ආසියාවේ වෙනත් රටවල් කර තිබෙන්නා වගේ පැහැදිලි විධියට අපටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණඩුක්‍රම ව්‍යවස්ථාවක් අළුතෙන් හදා ගන්ට බැරි ඇයි? හැතැප්ම දහස් ගණනක් එහා එංගලන්තයේ වෙන කවුරු වත් සකස් කළ ආණඩු ක්‍රම ව්‍යවස්ථාවක් පිළිගෙන, ඒක වෙනස් කරන්ට පුළුවන්ද බැරිද කියන සැකයට භාජන වන තත්ත්වයට ඉඩ නොතබා, ඉන්දියාව කළා වගේ, බුරුමය කළා වගේ අපිම එකතු වෙලා අපේම ආණඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගනිමු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒකයි මේ කරන්ට යන්නෙ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
නැහැ. මේ කරන්ට යන්නෙ—

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)
(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்சிசை அமைச்சரும் சபை முதல் வரும்)
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)
තමුන්නාන්සේලා ළං වෙන්නකෝ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
—දැනට තිබෙන ආණඩුක්‍රම පනත සංශෝධනය කිරීමයි. සංශෝධනය කරන්ට යාමෙදි මොකද වෙන්නෙ? අන්තිමේදි සංශෝධනය කරන්ට බැරි දේවලුත් ඔතන තිබෙන්න පුළුවන්. මොකද? අද පවතින ආණඩුක්‍රම ව්‍යවස්ථාවේ බලය එන්නෙ කොහේ සිටද කියා ආණඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා අහන්ට කැමතියි. ලේ බිඳක් හලන්නෙ නැතුව ලබා ගත්තාය කියන මේ ජාතික නිදහස කියන එකේ බලයේ උල්පත කොහේද? ඉන්දියාවෙ වගේ ජනතාව අත නොවෙයි. මේ බලයේ උල්පත එංගලන්තයේ මහ රැජිණයි. අපේ ආණඩු ක්‍රම පනත අනුව බලයේ උල්පත රැජිණයි.

ආණඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක අපි වෙනස් කරමු.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
රැජිණ බලයේ උල්පත වීම වෙනස් කරන්ට නම් කළ යුත්තෙ මේ දැනට තිබෙන ආණඩු ක්‍රම පනත සංශෝධනය කිරීම නොවෙයි. එහෙම නම් අප කළ යුතුව තිබෙන්නෙ බලයේ උල්පත මහ ජනතාව වන ආකාරයට මේ ගරු සභාවෙන් සකස් කරන ආණඩුක්‍රම ව්‍යවස්ථාවක් භාර ගැනීමයි. මේ අපේ නිදහස කියන එක අපට සතුටක් නැතිව ලැබීම හේතු කොටගෙන යම්කිසි වැදගත් පළුදු වගයක්, අඩුපාඩු වගයක් පවතින නිසා ඒවා හරි ගැස්සිය යුතුව තිබෙනවා. එහෙත්, ඒවා හරි ගැස්සිය යුත්තෙ පැලැස්තර දමා නොවෙයි. දැනට තිබෙන ආණඩුක්‍රම පනත මුළුමණින්ම වෙනස් කර අළුත් ව්‍යවස්ථාවක් සකස් කරන්ට ඕනෑ. අපේ රට පාලනය වන ආණඩුක්‍රම ව්‍යවස්ථාවට බලය ලැබෙන්නෙ මේ රටේ මහජනයාගෙන්ය කියන කාරණය තහවුරු වන අන්දමට මහජනයාගේ බලය උඩ අපි අළුත් ආණඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්ට ඕනෑ. අද තිබෙන ආණඩුක්‍රම ව්‍යවස්ථාවට පැලැස්තර දමා එය සංශෝධනය කරන්ට ගියොත්, අනාගතයේදීත් ඒ බලය පැවරෙන්නෙ එංගලන්තයේ මහ රැජිණටයි. ඒකෙන් අපි වෙන් වෙන්ට ඕනෑ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක බොහොම ලෙහෙසියෙන් වෙනස් කරන්ට පුළුවන්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
නමින් වෙනස් කරන එක බොහොම ලෙහෙසියි. මගේ ප්‍රශ්නය නමින් වෙනස් කරන එක ගැන නොවෙයි. ඇත්ත වශයෙන්ම මෙතැන තිබෙන ප්‍රශ්නය, රැජිණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

නමින් ඉන්නවද, නැද්ද කියන එක නොවෙයි. වරදවා තේරුම් ගන්න එපා. ප්‍රශ්නය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලයේ උල්පත තිබෙන්නෙ ලංකාවෙද, නැත්නම් රැජිණ අතේද කියන එකයි. මන්ද? උල්පත එතැන තිබෙන තුරු අපි මේ විධියට පැලැස්තර දමා මොන විධියේ ව්‍යවස්ථාවක් සම්මත කර ගත්තත් ඒක පෙරළන්ට රාජාධිකරණයට බලය තිබෙනවා. රාජාධිකරණය නොපෙරළුවත්, ලංකාවේ සුප්‍රීම් උසාවිය තිබෙනවා, ප්‍රතිඝාමිත්ත්වය වෙනුවෙන් ඒක පෙරළන්න. එයින් බේරීමට, එයින් නිදහස් වීමට තිබෙන මාර්ගය කුමක්ද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

උසාවිය පෙරළමු.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

මා දන්නවා, තමුන්නාන්සෙට ආණ්ඩු පෙරළා පුරුද්දක් තිබෙන බව.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)
(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)
(Mr. W. P. G. Ariyadasa—Haputale)

බෙලි කපල—[බාධාකිරීමක්]

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

මා නරක වචන, හිත රිදෙන වචන පාවිච්චි කරන්නෙ නැහැ. මා ඒ නිසයි කිව්වෙ, ආණ්ඩු පෙරළල පුරුද්දක් තිබෙනවා කියා. ඒ නිසා අපට ලොකු සැකයක් තිබෙනවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෙරළා දමන්ටත් අනාගතයෙදි ඉදිරිපත් වෙයි කියා. ඒ නිසා මේ යෝජනාවට එකඟ වෙන්ට අපට පුළුවන්කමක් නැහැ. මේවා සින් මුළාවන්ට පුළුවන්කමක් නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

අපි දෙගොල්ල එකතු වෙලා කරමු.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ආණ්ඩුක්‍රම පනතේ 29 වෙනි වගන්තිය පැහැදිලිව වෙනස් කරන්ට බලයක් තිබෙන මණ්ඩලයක් ඒ සඳහා පත් කිරීම අවශ්‍යයි. ඒ සඳහා ගතයුතු එකම ක්‍රියා මාර්ගය නම්, ඉන්දියාව කළා වගේ, බුරුමය කළා වගේ අප විසින්ම අපේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට පියවර ගැනීමයි. ඒ සම්බන්ධයෙන් මත භේදයක් තිබෙනවා. මේ වෙලාවෙදී ඒ මත භේදයට ඇති හේතු ගැන මා සඳහන් කරන්ට අදහස් කරන්නෙ නැහැ. මන්ද? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මා සමග තරහවන්ඩ ඉඩ තිබෙන නිසයි. ඊයෙ සවසත් ඒ අයට තරහ ගියා. බහින්බස් වීමක් වුණා. ඒ නිසා මා හේතූන් කියන්ට යන්නෙ නැහැ. අපි එක මතයක් දරන්නෙ මක්නිසාද, තමුන්නාන්සෙලා තවත් මතයක් දරන්නෙ මක්නිසාද, අපි කවුරු පදනම් කරගෙන ක්‍රියා කරනවාද, ආණ්ඩු පක්ෂය කොයි පන්තිය පදනම් කරගෙන ක්‍රියා කරනවාද කියන ප්‍රශ්න ගැන මා මේ වෙලාවෙදි කථා කරන්ට යන්නෙ නැහැ. නමුත් එක දෙයක් විතරක් මා කියන්ට කැමතියි. ඒක මා මුලිනුත් කිව්ව දේයි.

විරුද්ධ පක්ෂය මේ යෝජනාවට විරුද්ධ බව හොඳටම දැනගෙනත් ආණ්ඩු පක්ෂය මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මා පුදුම වන බව මා කිව්ව. මොකක්ද මේකෙ තේරුම? ඇයි කොමිටියක් පත් කරගෙන, විරුද්ධ පක්ෂය නැතිව මේ කට යුත්ත කරන්ට යන්නෙ? ඇත්ත වශයෙන්ම විරුද්ධ පක්ෂයේ සහාය නැතිව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ඇති කරන්ට බලාපොරොත්තු වෙනවාද කියන ප්‍රශ්නය මා අහන්ට කැමතියි. විරුද්ධ පක්ෂයේ සහාය නැතිව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන්ට බලාපොරොත්තු වෙනවාද කියා රාජ්‍ය ඇමතිතුමා අපට කියනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම නැත්නම් මේ යෝජනාව ගැන කථා කරල වැඩක් නැහැ. මේක අයින් කර දමන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඇයි?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
විරුද්ධ පක්ෂයෙ සහාය මේ යෝජනාවට ලැබෙන්නෙ නැති නිසා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
අඳත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ලැබෙනව.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මෙතැන තිබෙන්නෙ, අඳත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොවෙයි. මේක පරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කරන්ට යෑමක්. මේකට අපේ ආධාර ලැබෙන්නෙ නැහැ. අපේ ආධාරය නොලැබ මේ කටයුත්ත කරන්ට බලා පොරොත්තු වෙනවාද කියා මා අහනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ කාලෙ වන විට ආධාර ලැබෙයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අපි කියනව, ආධාර දෙන්ට ලෑස්ති නැහැ, මේකට අපි විරුද්ධයි කියල.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මම දන්නව, ආධාර ලැබෙන බව.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
එහෙනම් මෙතැන මොකක් හෝ කුමන්ත්‍රණයක් ඇති. අපි මේකට විරුද්ධයි. අපි මේකට සහාය දෙන්නෙ නැහැ. රාජ්‍ය ඇමතිතුමා කියනව, ඒ කාලෙ වන විට සහාය ලැබේය කියල. මෙතැන මොකක් හරි එකක් ඇති.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එච්චර හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට තමුන්නාන්සෙල ඔක්කොම පක්ෂ වේවි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අපි ඉන්න අය ඔක්කොම පක්ෂ වේවි? ඉතිරි අය, හිරේ හිටිවිද?

කෙසේ වෙතත් මීට වඩා කථා කරන්ට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. මේ යෝජනාව ගැන රාජ්‍ය ඇමතිතුමාගෙන් එක ප්‍රශ්නයක් විතරක් අහනව. ඒ, විරුද්ධ පක්ෂයේ සහාය නැතිව මේක කරගෙන යනවාද කියන ප්‍රශ්නයයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මම උත්තර දෙන්නම්.

පූ. භා. 11.04

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
මේ යෝජනාව ගැන විරුද්ධ පක්ෂයේ අදහස් මොනවාද යන්න මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් රාජ්‍ය ඇමතිතුමාට ඉතා පැහැදිලි ලෙස විස්තර කර දුන්න. ඒ නිසා රජය මේ යෝජනාව සම්මත කර ගැනීමට මහන්සි ගන්නවා නම් එය සාධාරණය කියා අපට පිළිගන්නට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

රාජ්‍ය ඇමතිතුමා කියනවා නම් අපේ ආණඩුක්‍රම ව්‍යවස්ථාව යල් පැනපු එකක්ය, ඒ නිසා අපේ දෙපාර්තමේන්තුවල වැඩ මේකෙන් පරක්කු වෙනවය, අපේ රටේ සංවර්ධන වැඩ වේගයෙන් කරගෙන යන්ට ඕනෑය, ඒ නිසා අපේ පරිපාලනය වෙනස් කිරීම අත්‍යවශ්‍යය, එබැවින් අපි ඔක්කොම එකතුවෙලා මේ කාරණය සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය, ඒ නිසා මේකට සහයෝගය දෙන්නට කියා, ඒ සඳහා ගැල පෙන යෝජනාව විරුද්ධ පක්ෂයේ යෝජනාව බව මම කියන්ට කැමතියි. සභා නායකතුමාගේ යෝජනාවෙන් අදහස් කරන්නෙ මෙන්න මේකයි:

මම ඒ යෝජනාව දැන් නැවතත් කියවන්නම්:

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය විසින් පත් කරනු ලබන විශේෂ කාරක සභාවක් සමග ඒකාබද්ධ විශේෂ කාරක සභාවක් වශයෙන් එක්වී 1946 සහ 1947 ලංකා (ආණ්ඩු ක්‍රම සහ ස්වාධීනතා) රාජාඥාවන් සහ අනිකුත් ලිඛිත නීති පිළිබඳව කාරක සභාව අවශ්‍යයයි අදහස් කරන අනිකුත් කරුණු අතර—

(1) සමූහාණ්ඩුවක් පිහිටුවීම,

(2) මූලික අයිතිවාසිකම් සහතික කිරීම,

(3) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය,

(4) රජයේ සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම, යන කරුණු ද සම්බන්ධයෙන් සංශෝධනය කිරීම සලකා බැලීම පිණිස, මන්ත්‍රීන් පහළොස් දෙනෙකුගෙන් යුත් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය; අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමේ සහ අවශ්‍ය පුද්ගලයන් කැඳවීමේ බලය කාරක සභාවට තිබිය යුතුය; මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් කාරක සභාව රැස්විය යුතුය; කාරක සභාවේ ගණපූරණය මන්ත්‍රීන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතුය."

දැන් අපි ඊළඟට විරුද්ධ පාර්ශවයේ ගරු නායකතුමිය ඇතුළු ගරු මන්ත්‍රීන් කීප දෙනකු විසින් දී තිබෙන යෝජනාව ගැනත් ටිකක් කල්පනා කර බලමු. ගරු රාජ්‍ය ඇමතිතුමාගේත්, ගරු සභානායකතුමාගේත් පරමාර්ථය රටට හිතකර වූ ආණඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගැනීම නම් ඒ සඳහා කළ යුතුව තිබෙන්නෙ දැනට තිබෙන ව්‍යවස්ථාව අරන් එහාට මෙහාට කර පැලැස්තර අලවා අලුත්වැඩියා කිරීම නොවෙයි. අප දෙගොල්ලන්ගෙම පරමාර්ථය වී තිබෙන්නේ රටට අවශ්‍ය ව්‍යවස්ථාවක් සකස් කර ගැනීම නිසා අප විසින් කළ යුතුව තිබෙන්නෙ දෙගොල්ලන්ම එකට එකතු වී සම්පූර්ණයෙන්ම අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමයි.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன— சமூக சேவை அமைச்சர்)

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ඒ නිසා ඒ සියල්ලම සාකච්ඡා කරන්න තමයි විශේෂ කාරක සභාවක් පත් කරන්න හදන්නෙ.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennekoon)

හරි.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)

(The Hon. N. H. A. M. Karunaratne)

ඔව්, අමුතු දෙයක් කරන්න නොවෙයි හදන්නෙ.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennekoon)

මට පෙන්වා දීමට වුවමනා කරන්නෙ ආණ්ඩුවේ පරමාර්ථයත් විරුද්ධ පාර්ශ්වයේ පරමාර්ථයත් එක හා සමාන නම්—රටට අවශ්‍ය හොඳ ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට නම්—කාගෙත් බලාපොරොත්තුව මේ රටේ සංවර්ධනය වේගයෙන් ඵලදායක ලෙස කරගෙන යාම නම් ඒ පරමාර්ථය ඉටු කර ගැනීමට විරුද්ධ පාර්ශ්වයෙන් කල් දී තිබෙන යෝජනාවෙන් මීටත් වඩා පැහැදිලි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙන බවයි. එය බොහොම පැහැදිලියි. ආණ්ඩුවේ යෝජනාව සීමා සහිත එකක්. මෙන්න එය:

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය විසින් පත් කරනු ලබන විශේෂ කාරක සභාවක් සමග ඒකාබද්ධ විශේෂ කාරක සභාවක් වශයෙන් එක්වී 1946 සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1947 ලංකා (ආණ්ඩු ක්‍රම සහ ස්වාධීනතා) රාජාඥාවන් සහ අනිකුත් ලිඛිත නීති පිළිබඳව, කාරක සභාව අවශ්‍යයයි අදහස් කරන අනිකුත් කරුණු අතර—

(1) සමූහාණ්ඩුවක් පිහිටුවීම,

(2) මූලික අයිතිවාසිකම් සහතික කිරීම,

(3) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය,

(4) රජයේ සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම, යන කරුණු ද සම්බන්ධයෙන් සංශෝධනය කිරීම සළකා බැලීම පිණිස, මන්ත්‍රීන් පහළොස් දෙනෙකුගෙන් යුත් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය; අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමේ සහ අවශ්‍ය පුද්ගලයන් කැඳවීමේ බලය කාරක සභාවට තිබිය යුතුය; මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් කාරක සභාව රැස්විය යුතුය; කාරක සභාවේ ගණපූරණය මන්ත්‍රීන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතුය."

ඔන්න ඔකයි රජයේ යෝජනාව. ඒ යෝජනාවත් සමග විරුද්ධ පක්ෂයෙන් කල් දී තිබෙන අනික් යෝජනාව අපි සංසන්දනය කර බලමු. එය දින නියමයක් නැතිව න්‍යාය පුස්තකයේ සඳහන් වී තිබෙන යෝජනාවක්. එම යෝජනාව සඳහා කල් දී තිබෙන්නේ, සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මිය හා ආචාර්ය එන්. එම්. පෙරේරා, වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ, පී. ජී. බී. කෙනමන්, ආර්. ජී. සේනානායක, ප්‍රින්ස් ගුණසේකර යන මහත්වරුන් විසිනුයි. ඒ යෝජනාව මෙහෙමයි:

"ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම පිළිබඳ විශේෂ කාරක සභාව— අනිකුත් කරුණු අතර පහත සඳහන් කරුණු ද ඉටු වන පරිදි ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කිරීම සඳහා මෙම මන්ත්‍රී මණ්ඩලයේ විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි:—"

පරමාර්ථය මොකක්ද, වැඩේ ඉටු වෙන්නෙ කොයි විධියටද කියන එක පැහැදිලිව පෙනෙනව. මට පෙන්වා දෙන්නට ඕන කරන්නේ මේකයි: මේ රටේ පොදු යහපත පිණිස වැඩ කරගෙන යන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාධා ඇති වී තිබෙනවාය; එය සකස් කරගෙන පොදු මහජනතාවගේ යහපත පිණිස කටයුතු කරන්නට ආණ්ඩුව යෝජනාවක් ගෙනා විට විරුද්ධ පක්ෂය එයට සහයෝගය දෙන්නේ නැත; ආණ්ඩුව කරන්නට සූදානම් වන හොඳ වැඩවලට විරුද්ධ පක්ෂයේ අය ඉඩ දෙන්නේ නැත; ඔවුන්ට ඕනෑ වී තිබෙන්නේ කොතරම් හොඳ යෝජනාවක් ගෙනා වත් විරුද්ධ පක්ෂයේ ඉදගෙන එයට විරුද්ධ වීමටය යනාදී වශයෙන් ආණ්ඩුව හිතනවා නම්, ආණ්ඩුව කියනවා නම්, ආණ්ඩුවෙන් විරුද්ධ පක්ෂයට චෝදනා එල්ල කරනවා නම්, එහි නියම තත්ත්වය මෙන්න මේකයි කියා මහජනයාට පෙන්වා දීමයි මට වුවමනා කර තිබෙන්නෙ. විරුද්ධ පක්ෂයෙන් කල් දී තිබෙන යෝජනාවේ ඉතිරි ටික මම දැන් කියවන්නම්.

"(අ) සියලු බලය ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් ව්‍යුත්පන්න, පූර්ණ ස්වාධීන හා ස්වාධිපත්‍ය සමූහාණ්ඩුවක් පිහිටුවීම;

(ආ) ශ්‍රී ලංකාව නොබෙදිය හැකිවීම සහ රාජ්‍යයේ ඒකීය භාවය සහතික කිරීම;

මේ යෝජනාව කොතරම් පැහැදිළිද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අපේ යෝජනාවද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

නැහැ. විරුද්ධ පක්ෂයේ යෝජනාව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අපේ යෝජනාවත් එහෙමයි.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

ආණ්ඩුවේ යෝජනාවේ පරමාර්ථයන් එතරම් පැහැදිලි නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අපට පැහැදිළියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

වැඩි දෙනකුට පැහැදිළි වන විධියක් බාර ගනිමු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

වැඩිදෙනා සිටින්නෙ මේ පැත්තෙනෙ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

ගරු කථානායකතුමනි, පරමාර්ථයන් හැකිතරම් පෙන්නුම් කරන, ඒ පරමාර්ථ ඉටුකරගත හැකි පාරක ගමන් කිරීම නේද වඩා හරි කියා පිළිගන්න ඕනෑ.

ඊළඟට මෙහෙමයි තිබෙන්නෙ:

"(ඉ) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලිය පත් කළ මන්ත්‍රීන් වැනි ප්‍රජාතන්ත්‍රවාදී නොවූ ලක්ෂණයන් ගෙන් නිදහස් වීම;

(ඊ) වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 29 වෙනි වගන්තියෙහි සහ අනිකුත් කොටස් වල අන්තර්ගතව තිබෙන පාර්ලිමේන්තු ස්වාධිපත්‍යයේ සියලුම සීමා කිරීම් ඉවත් කිරීම;

(උ) ශ්‍රී ලංකා ජනතාවගේ සමාජවාදී අරමුණු ප්‍රකාශ කිරීම හා කථා කිරීමේ නිදහස, සමිති සමාගම් පැවැත්වීමේ, රැස්වීමේ, ආගම් ඇදහීමේ, වැඩ කිරීමේ අයිතිවාසිකම් වැනි මූලික ප්‍රජාතන්ත්‍රවාදී—"

මේ ආණ්ඩුව නිතරම ප්‍රකාශ කරණ එකක් තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන එක. ඔහේ කියනව.

"—හා අනිකුත් අයිතිවාසිකම් සහතික කිරීම; සහ

(ඌ) කායක්ෂම පාලනයට සහ ජාතික හා ආර්ථික ප්‍රගතියේ ශීඝ්‍ර ගමනට....."

අපේ රාජ්‍ය ඇමතිතුමා නොයෙක් විට කර තිබෙන කථාවක් මා සඳහන් කරන්නට සතුටුයි. එතුමා කියනවා අපට සංස්ථාවන් වුවමනා කරනවාය කියා. රජයේ දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි, පරිපාලන රෙගුලාසි අර රෙගුලාසි මේ රෙගුලාසි තිබෙනවාය, එමනිසා පොදු මහජනතාවගේ යහපත පිණිස කාර්යක්ෂම හා වේගවත් වැඩ පිළිවෙළක් ඇති කරන්ට නම් සංස්ථා පිහිටුවිය යුතුය කියා එතුමා සමහර ස්ථානවල දී කියා තිබෙනවා. ඒ අදහස බොහොම හොඳයි. මේ යෝජනාවෙත් ඒ අදහස තිබෙනව. අප දෙගොල්ලන්ටම බොහොම ලෙහෙසියෙන් එකතුවී මේ අදහස් ඉෂ්ට කරගන්ට පුලුවන්.

"කායක්ෂම පාලනයට සහ ජාතික හා ආර්ථික ප්‍රගතියේ ශීඝ්‍ර ගමනට බාධා පමුණුවන හෝ බලයට පත්ව සිටින රජයේ පාලනය සහ විධායක ක්‍රියා පිළිබඳ වගකීම් සීමා කෙරෙන යටත් විජිත කාලයේ සිට පැවත එන, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තිබෙන ලක්ෂණ සියල්ලක්ම....."

පළාත් පාලන ඇමතිතුමාත් මේ යෝජනාවට සම්පූර්ණයෙන්ම කැමති වේවිය කියා මා විශ්වාස කරනවා. ඔය දැන් තිබෙන නොයෙකුත් අපහසුකම්, වැඩ කිරීමට තිබෙන නොයෙකුත් අපහසුකම් මග හරවා ගැනීමට එතුමා බලාපොරොත්තු වෙනවා නම් එතුමාත් මේ යෝජනාවට කැමති වෙනවා ඇති.

"සියල්ලක්ම (නිදසුනක් වශයෙන් රාජ සේවා කොමිෂන් සභාව) අහෝසි කිරීම;

තවද, එකී විශේෂ කාරක සභාවට සඵකිය ගණපූරණය නියම කිරීමටත්, අවශ්‍ය පුද්ගලයන් කැඳවීමටත් හා අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමටත්, වරින්වර වාර්තා කිරීමටත්, මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් රැස්වීම් පවත්වාගෙන යාමටත් බලය තිබිය යුතුය."

මේ යෝජනා දෙකම ගැන කල්පනා කර බලන විට, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම ගැන රජය ඉදිරිපත් කළ යෝජනා වෙන් රජය අදහස් කරන්නේ මොන පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට ද කියා සිතීම අමාරුයි. මා මුලින් සඳහන් කළා වාගේ රජයේ යෝජනාව බොහොම සීමා සහිතයි.

"...කාරක සභාවක් වශයෙන් එක්වී 1946 සහ 1947 ලංකා (ආණ්ඩු ක්‍රම සහ ස්වාධීනතා) රාජාඥාවන් සහ අනිකුත් ලිඛිත නීති පිළිබඳව, කාරක සභාව....."

බොහොම සීමා සහිතයි. මේ අනුව සූදානම් වන්නේ කුමකට ද? 1946 සහ 1947 නීති අරගෙනම යමක් කරන්ට පුලුවන් වෙයි ද, අර කෑල්ලෙන් යමක් කරන්ට පුලුවන් වෙයිද, තවත් කෑල්ලක් අරගෙන යමක් කරන්ට පුලුන් වෙයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන යම් සංශෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධනයක් කිරීමෙන් යමක් කරන්ට පුලු වන් වෙයි ද, අධිකරණ සේවා කොමිෂන් සභාව ගැන යම් සංශෝධනයක් කිරීමෙන් යමක් කරන්ට පුලුවන් වෙයි ද එහෙම නැත්නම් දෙපාර්තමේන්තුවල අද තිබෙන ව්‍යවස්ථාවල සංශෝධනයක් කිරීමෙන් යමක් කරන්ට පුලුවන් වෙයි ද, භාණ්ඩාගාරයේ මුදල් පිළිබඳ ව්‍යවස්ථාවල යම් යම් කොටස් සංශෝධනය කර මුදල් ඇමතිතුමාට එහෙම නැත්නම් අනිකුත් ඇමතිවරුන්ට දැනට වඩා නිදහසක් දෙන්ට පුලුවන් වෙයි ද, එසේ කිරීමෙන් දැනට වඩා ටිකක් දුරට වැඩ කරගෙන යන්ට පුලුවන් වෙයි ද යනාදි කරුණු සොයා බැලීමටයි මේ යෝජනාවෙන් අදහස් කරන්නෙ. මහජනතාව වෙනුවෙන් වගකීම භාර අරගෙන ආර්ථික ප්‍රගතියේ සීඝ්‍ර ගමනට බාධා පමුණුවන ව්‍යවස්ථා නැති කිරීම මේ ආණ්ඩුවේ පරමාර්ථය නම් ආණ්ඩුවේ මේ යෝජනාව ඉල්ලා අස්කරගෙන විරුද්ධ පක්ෂයේ යෝජනාව නොපිළිගන්නේ මක්නිසාද කියා අපට තේරුම් ගැනීම අමාරුයි. රාජ්‍ය ඇමතිතුමාත් මා සමග එකඟවනවා ඇත කියා මා විශ්වාස කරනවා. අපේ පරමාර්ථය ඒවා නම් අප දෙගොල්ලන්ටම එකතුවී මේ වැඩේ බොහොම ලෙහෙසියෙන් කර ගන්න පුලුවන්. විරුද්ධ පක්ෂයේ පරමාර්ථ නම් ඉතාම පැහැදිලි ලෙස මේ යෝජනාවෙන් දක්වා තිබෙනව:

"(ඌ) කායක්ෂම පාලනයට සහ ජාතික හා ආර්ථික ප්‍රගතියේ සීඝ්‍ර ගමනට බාධා පමුණුවන හෝ බලයට පත්ව සිටින රජයේ පාලනය සහ විධායක ක්‍රියා පිළිබඳ....."

මෙයින් පැහැදිලි වශයෙන්ම විරුද්ධ පක්ෂයේ පරමාර්ථ දක්වා තිබෙනව. ඇත්ත වශයෙන්ම මේ කොටස නැවත නැවතත් කියවිය යුතුයි.

මෙහි (ඌ) කොටස මම තව සැරයක් කියවන්නම්:

"කාර්යක්ෂම පාලනයට සහ ජාතික හා ආර්ථික ප්‍රගතියේ සීඝ්‍ර ගමනට බාධා පමුණුවන හෝ බලයට පත්ව සිටින රජයේ පාලන සහ විධායක ක්‍රියා පිළිබඳ වගකීම සීමා කෙරෙන....."

ගරු කථානායකතුමනි, දැන් බලයට පත්ව සිටින්නෙ අපි නොවෙයි. සමහර විටක මේ ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණොත් වැඩිපුර වාසි සැලසෙන්නෙ බලයට පත්ව සිටින පක්ෂයටයි. රජයේ ප්‍රජාතන්ත්‍රවාදය මහජනතාව හැම වෙලේම ගරු කරනවය යන විශ්වාසය තිබෙනව නම්, විරුද්ධ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන්නෙ නැත යන චෝදනාව හැමවිටම අපට එල්ල කිරීමෙන් ඇති වැඩක් නෑ. මේ ව්‍යවස්ථා ක්‍රියාත්මක වුණොත් වැඩි ප්‍රයෝජනය ලැබෙන්නෙ විරුද්ධ පක්ෂයට නොවෙයි, ආණ්ඩු පක්ෂයටයි.

ඊළඟට එම කොටසෙම තවදුරටත් මෙසේ කියා තිබෙනව:

"විධායක ක්‍රියා පිළිබඳ වගකීම් සීමා කෙරෙන, යටත් විජිත කාලයේ සිට පැවත එන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තිබෙන ලක්ෂණ සියල්ලක්ම අහෝසි කිරීම;"

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් එක් කරුණක් පැහැදිලිව මේ අවස්ථාවෙදි කියන්න අපට වුවමනා කරනවා මේ යෝජනාව ගැන හැමදාම සාකච්ඡා කරමින් රජය මෙන්න මෙහෙම කියයි "පරණ නීති රීති වෙනස් කර පරණ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා වෙනස් කර, මහජන ප්‍රගතියටත් සීඝ්‍රගාමී ගමනටත් උදව් වක් වන අන්දමට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් නියම මහජන මතය අනුව රට පාලනය කිරීමටත් අපි ලැහැස්තියි; ඒ සඳහා ව්‍යවස්ථා සංශෝධනය කර ගන්න වුවමනා වී තිබෙනව, නමුත් විරුද්ධ පක්ෂය ඊට හරස් කපනව; ඒ උදවිය මේකට ඉඩ දෙන්නෙ නෑ. ඒ නිසා වරද අපේ අතේ නොවෙයි; අපට තනියම මේක කරන්න බෑ; විරුද්ධ පක්ෂයෙ සහයෝගය නොලැබෙන නිසා අපට මේ කටයුත්ත කරන්න බෑ. එම නිසා මේ රටේ ප්‍රගතියට බාධා කරන්නෙ අප නොව විරුද්ධ පක්ෂයයි." මෙන්න මේ චෝදනාව අප වෙත එල්ල කරන්න ආණ්ඩුව ලැහැස්ති වෙනව නම්, අප ඊට කිසිසේත්ම වගකිවයුත්තන් නොවන බව මේ අවස්ථාවෙදි පැහැදිලිවම ප්‍රකාශ කළයුතුව තිබෙනව.

විරුද්ධ පක්ෂයෙ පරමාර්ථ පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනව. රටේ නියම තත්ත්වය නොදත් පිරිසක් විසින් සකස් කර තිබෙන මේ ව්‍යවස්ථා වෙනස් කරන්න අපටත් වුවමනාව තියෙනවා. අපට සම්පාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

නය වී තිබෙන්නෙ, රටේ ජාතික ආගමික හා ආර්ථික සංවර්ධනයටත් නියම මහ ජන මතය අනුව රටේ ප්‍රජාතන්ත්‍රවාදී දියුණුවටත් උපයෝගී වන අන්දමේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් නොවෙයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කළ අය එදා අවස්ථාවෙ හැටියට තරමක් දුරට හරියයි කියා හිතෙන විධියෙ ව්‍යවස්ථාවක් සකස් කළා. එහෙත් එය දැන් අපේ රටේ ජාතික සංවර්ධනයටත් ආගමික සහ ආර්ථික සුභසිද්ධියටත්, පොදු වශයෙන් සාමාජික දියුණුවටත්, කොහෙත්ම උපයෝගී නොවන බව නොයෙක් නොයෙක් අවස්ථාවලදී නොයෙක් නොයෙක් කරුණු වලින් ලැබුණු අත්දැකීම්වලින් අපට පෙනී ගොස් තිබෙනව.

නිලධාරී මහත්වරුන්ට වගකීම් දිය යුතුය යන කරුණ තමුන්නාන්සේ හැම විටම ප්‍රකාශ කරන දෙයක්. ඒ නිලධාරීන් ඔවුන්ගෙ වගකීම් අනුව කටයුතු නොකර තොත් ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ක්‍රියා කළයුතු බවත් තමුන්නාන්සෙ කියනව. ඒ අදහස ගැන අපි බොහොම සන්තෝස වෙනව. නමුත් ව්‍යවස්ථා අනුව එසේ කරන්න ඉඩක් නැති බව අපට නොයෙක් විට පෙනී ගොස් තිබෙනවා. කාර්යක්ෂමතාව, ක්‍රියාකාරිත්වය, සීඝ්‍රගාමී භාවය, ප්‍රජාතන්ත්‍රීය ස්වභාව ගැබ් වන ව්‍යවස්ථා අපට කෝ? ඒක නැහැ. ඒ නිසයි, අප කියන්නෙ 1946 ගැනත් අමතක කර, 1947 ගැනත් අමතක කර ඒ දෙකම පැත්තකින් තබමු කියා.

"ශ්‍රී ලංකාවට නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම" කියන යෝජනාව ගරු සභානායකතුමාට පිළිගන්න බැරි යැයි කියන කාරණය මට තේරෙන්නෙ නැහැ. යම් යම් අය සමඟ ඇති කර ගත් පොරොන්දු නිසා, ගිවිසුම් නිසා, කොන්දේසි නිසා මේ යෝජනාවට එකඟ වන්න බැරිකමක් තිබෙනවද කියා අපි දන්නෙ නැහැ.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

සමූහාණ්ඩුවක් වුනොත් නව ආණ්ඩුවක් නොවෙයිද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

"ශ්‍රී ලංකාව නොබෙදිය හැකි වීම සහ රාජ්‍යයේ ඒකීය භාවය සහතික කිරීම" වැනි දේවලට එකඟ වන්න බැරිකමක් ඒ අයට තිබෙනවද කියා මම දන්නෙ නැහැ. නමුත් එවැනි කරුණු පැහැදිළිව නීතියට ඇතුළු වීම අපට වුවමනා කරනව. සමහර විට ඒ වගේ දෙයක් කෙළින්ම කියන්නට රජයට යම් යම් අපහසුකම් ඇති. නමුත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන පොදු මහජනතාවගේ මතය ඒකයි. එය එසේ නොවෙයි කියා රජය කියනව නම් අපි ඒකත් දැන ගන්න කැමතියි. අද මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ සඳහන් කර තිබෙන "සමූහාණ්ඩුවක් පිහිටුවීම, මූලික අයිතිවාසිකම් සහතික කිරීම, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය" කියන කරුණුවලට වඩා පැහැදිළිව සම්පූර්ණ වශයෙන් අපේ යෝජනාවේ සඳහන් කර තිබෙනව, "සියලු බලය ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් ව්‍යුත්පන්න පූර්ණ ස්වාධීන හා ස්වාධිපත්‍ය සමූහාණ්ඩුවක් පිහිටුවීම" කියා.

ගරු සමාජ සේවා ඇමතිතුමා කිව්වා, සමූහාණ්ඩුවක් පිහිටුවනවය කියා. මේක ඊට වඩා ලක්ෂණ නැද්ද?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

"ටර්මිස් ඔෆ් රෙෆරන්ස්" සීමා කරල නැහැ. හොඳට වචන කියවා බලන්න.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

තමුන්නාන්සේලාගේ යෝජනාවෙන් කියන්නෙ "සමූහාණ්ඩුවක් පිහිටුවීම" කියායි. විරුද්ධ පාර්ශ්වයේ යෝජනාවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන් ඊට වඩා ලක්ෂණට කියනව, "සියලු බලය ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් ව්‍යුත් පන්න පූර්ණ ස්වාධීන හා ස්වාධිපත්‍ය සමූහාණ්ඩුවක් පිහිටුවීම" කියා ඒ වචන ටිකම මදිද?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

වචන නොවෙයි, අපට වුවමනා කරන්නෙ ක්‍රියාවල්. වචනවලින් කරපු හරිය අපි දන්නව.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

සමාජ සේවා ඇමතිතුමාගෙ ක්‍රියා කිරීම ගැන අපි ඒ තරම් දන්නෙ නැහැ. ක්‍රියා කිරීම සම්බන්ධයෙනුත් වුවමනාවට වඩා නිදහස දුන්නම ක්‍රියා කිරීමත් සීමාව ඉක්මවා යනව. "සමූහාණ්ඩුවක් පිහිටුවීම" කියන එකට වඩා "සියලු බලය ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් ව්‍යුත්පන්න පූර්ණ ස්වාධීන හා සාධිපත්‍ය සමූහාණ්ඩුවක් පිහිටුවීම" කියන එක හොඳ නැද්ද? අපට වුවමනා කරනව, මේ තත්ත්වය පැහැදිලි කර ගැනීම. අපේ ස්වාධීන භාවය ආරක්ෂා කර ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකර ගැනීම, ආගමික හා ආර්ථික වශයෙන් අපේ ජාතික සංවර්ධනය ඇති කර ගැනීම අපට අවශ්‍ය වෙනව. එයයි, අපේ පරමාර්ථය. ඒ පරමාර්ථය ඉටු කර ගැනීම පිණිසයි, අපි මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ යෝජනා දෙක ගැන බලන විට අපේ යෝජනාව වඩා හොඳය කියා ගරු සභා නායක තුමත්, ගරු රාජ්‍ය ඇමතිතුමත් සාධාරණව, හිතට එකඟව පිළිගන්නවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව. අපේ යෝජනාව පිළිගන්න තිබෙන අමාරුව මොකක්ද කියා මට තේරුම් ගන්න අමාරුයි. තමුන්නාන්සේලගෙ යෝජනාවෙ 2 වන කොටසෙ සඳහන් වෙනව "මූලික අයිතිවාසිකම් සහතික කිරීම" යනුවෙන්. ඊට වඩා පිරිසුදු නැද්ද අපි කියන හැටියට "ශ්‍රී ලංකාව නොබෙදිය හැකිවීම සහ රාජ්‍යයේ ඒකීය භාවය සහතික කිරීම" යනුවෙන් සඳහන් කළාම? [බාධා කිරීමක්] අපේ යෝජනාවෙ බොහොම හොඳට පිරිසුදු විදියට පැහැදිලි කරනව. අපි දන්නා කතා කරන්නෙ මේ යෝජනා දෙකෙන් වඩා හොඳ කෝකද කියන එක ගැනයි.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

නැහැ, අපේ යෝජනාව ගැන.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

යෝජනා 2 ක් තිබෙනව.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

දැන් විවාදය තියෙන්නෙ එකක් ගැනයි.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

තමුන්නාන්සෙලගෙ යෝජනාව ඉල්ලා අස් කර ගෙන අපේ යෝජනාව ගෙනෙන්න. අපේ යෝජනාවෙ පරමාර්ථ පැහැදිලිසි රාජ්‍ය ඇමතිතුමා එය පිළිගන්නවද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

යෝජනා කරන්ට කවුරුවත් ආවේ නැහැ.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹெரத்)
(Mr. T. B. M. Herath)

ඒ වෙන එකක්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මේකත් ඒ විධියයි.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

අනික් දවසෙ එම යෝජනාව ගෙනෙන විට තවත් දේ ඉටු කර ගන්න පුළුවන් වන නිසා අපට ඒකෙන් පාඩුවක් වෙන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

නැහැ. අද රාජ්‍ය ඇමතිතුමා වේදිකාවට ගොස් කියනවා ඇති, විරුද්ධ පාර්ශ්වය අපට වැඩ කරන්න දෙන්නෙ නැත කියා. "සී. ඩබ්ලිව්. ඊ. එකේ එහෙම බල තල අතට අරගෙන වැඩ කරන්ට අපි ලෑස්තියි. නමුත් අපට දැනට තිබෙන්නෙ සීමාසහිත බලතලයි. නීති රීතිවලට අනුව අපට අවස්ථාව නැහැ ඒවා පිළිබඳව නිසි විදියට කටයුතු කරන්ට. එම නිසා පරණ ව්‍යවස්ථා අයින් කර අළුත් ව්‍යවස්ථාවලට අනුව කටයුතු කරන්ට ඕනෑ. එම නිසයි අපි මෙම යෝජනා ඉදිරිපත් කරන්නෙ. නමුත් විරුද්ධ පාර්ශ්වය එම ක්‍රියා මාර්ග කඩාකප්පල් කරනවා" යනුවෙන් එතුමා කියන්ට පුළුවනි. පාර්ලිමේන්තුවෙදි දවස් ගණන් කතා කොට අපේ යෝජනා සම්මත කරගන්ට ඉඩ දෙන්නෙ නැතැයි කියා චෝදනා කරන්ට පුළුවනි. එම චෝදනාවට ලක් වන්ට අපට බැහැ. ජාතික ආගමික සහ ආර්ථික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට අනුව සීඝ්‍ර ලෙස රට දියුණු කිරීම උදෙසා ව්‍යවස්ථා ඇති කිරීමයි, අපේ පරමාර්ථය වන්නෙ. අපේ යෝජනාවෙ මෙස් සඳහන් වෙනව:

"ආ) ශ්‍රී ලංකාව නොබෙදිය හැකිවීම සහ රාජ්‍යයේ ඒකීය භාවය සහතික කිරීම."

එවැනි කොන්දේසියකට එකඟ වෙන්න බැරිකමක් තිබෙනවද කියන්ට අපි දන්නෙ නැහැ. බැරිකමක් තිබෙනව නම් අපට පුළුවනි ඒ ගැන සාකච්ඡා කරන්ට.

නමුත් නාන්සෙලගෙ යෝජනාවෙ 3 වන ඡේදයෙ මෙසේ සඳහන් වෙනව:

"(3) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය".

නමුත් අපේ යෝජනාවෙ ඒ කාරණය පැහැදිලිව සඳහන් කරනව. විරුද්ධ පක්ෂය ඉදිරිපත් කරන යෝජනාවේ එය පැහැදිලි වශයෙන් පෙන්නුම් කරනව. එහි කියා තිබෙනව—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන සෑහෙන තරම් කථා කරන්න ඉඩ දුන්න. අනික් යෝජනාව ගැන කථා කරන්න වුවමනා කරන්නෙ ඒ යෝජනාව සභාව ඉදිරිපිට තැබුවාට පසුවයි. දැන්, ඉදිරිපත් කර ඇති යෝජනාව ගැන පමණයි කථා කරන්න ඉඩ දෙන්න පුළුවන්. න්‍යාය පුස්තකයේ පසුව ඇති යෝජනාවක් ගැන දැන් කථා කිරීම නීති විරෝධී බවයි ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න තිබෙන්නෙ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

ඒ යෝජනාවත් මේ කාරණය ගැනමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ යෝජනාව ගැන සඳහන් කිරීමට සෑහෙන තරම් ඉඩ දුන්න. ඒ පිළිබඳව ඊට වඩා කථා කරන්න ඉඩ නොදෙන්න අවස්ථාව පැමිණ තිබෙනව. ඒ තරම් දුරට ඒ ගැන කථා කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකර සභාව ඉදිරිපිට තිබෙන යෝජනාව ගැන පමණක් කථා කරන්න.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

සභාව ඉදිරිපිට තිබෙන යෝජනාව ගැන මිස පිටස්තර කාරණා ගැන නොවෙයි මම සඳහන් කළේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කථා කළා පමණක් නොවෙයි, යෝජනාව පවා කියවන්න යෙදුණා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අපට විකුණන්නත් හැදුව.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)

කෑගහ කරන්නයි හදන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මේ යෝජනාව පළමුවෙන්ම ඉදිරිපත් කළ අවස්ථාවේ දී මැද කොළඹ තුන්වන මන්ත්‍රී (පී. ජී. බී. කෙනමන් මයා.) නැගිට කීව, විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කරන යෝජනාවට එකඟ වෙන්නෙ නැති නම් මේ යෝජනාව ගැන කථා කිරීමෙන් වැඩක් වෙන්නෙ නැත, ඒ යෝජනාව පිළිගන්නවා නම් අපට වැඩ කටයුතු ඉක්මණින් කර ගෙන යන්න පුළුවන් වෙනවා ය කියා. ඇත්ත වශයෙන්ම මම උත්සාහ ගත්තෙත් මේ යෝජනාව ඒ අනුව තවත් පැහැදිලි කර පෙන්වීමටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝගවලට අනුකූලව එය වැරදියි.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)
එහෙම නම් අපි කරුණු ඉදිරිපත් කරන්නෙ කොහොමද, මේ යෝජනාව ගැන?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවෙන් මේ යෝජනාව ගැන කථා කර ඡන්දය විමසුවාට පසු අනික් යෝජනාව ඉදිරිපත් කර ඒ ගැන කථා කරන්න පුළුවනි. නීති විරෝධී වුණත් මම සෑහෙන තරම් දුරට ඒ ගැන සඳහන් කරන්නටත් ඉඩ දුන්නා.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)
ගරු කථානායකතුමනි, කාලය ගත කිරීම නොවෙයි අපේ පරමාර්ථය. ව්‍යවස්ථා සම්පාදනය කර වැඩ කටයුතු වේගයෙන් කරගෙන යන්න දෙන්නෙ නැත යන චෝදනාවකට විරුද්ධ පක්ෂය වශයෙන් අපට යම් චෝදනාවක් එල්ල වෙනව. අන්න ඒ විධියෙ චෝදනාවකින් අපි ගැළවෙන්නටයි මෙවැනි කාරණා ඉදිරිපත් කර පැහැදිලිකර දෙන්න වෑයම් කරන්නෙ.

මෙම යෝජනාවෙ තිබෙනවා: "සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය," යනුවෙන්. සලකා බැලීම සඳහා මේ කාරණය ඉදිරිපත් කර ඇතත්, විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවේ ඒ කාරණය වඩාත් පැහැදිලි කර වෙනත් ආකාරයකින් ඉදිරිපත් කර තිබෙනව. ඒ කියන්නෙ, විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කරන යෝජනාවෙ, පත් කළ මන්ත්‍රීවරුන් වැනි "ප්‍රජාතන්ත්‍රවාදී නොවූ ලක්ෂණයන්ගෙන් නිදහස් වීම" යනුවෙන් ඒ කාරණය වඩාත් පැහැදිලි ආකාරයෙන් ඉදිරිපත් කර තිබෙනව.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඒ මොකක්ද ඒ යෝජනාව?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennekoon)
න්‍යාය පුස්තකයේ තිබෙන සඳහන් කරන්න එපාය කී විරුද්ධ පක්ෂයේ යෝජනාව.

අනික් වැදගත් කාරණය, වර්තමාන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 29 වන වගන්තිය. ඒ ගැනත් මෙහි කිසිවක් සඳහන් කර නැහැ. මෙහි තිබෙන්නේ, "රජයේ සේවා කොමිසම, හා අධිකරණ සේවා කොමිසම යන කරුණුද සම්බන්ධයෙන් සංශෝධනය කිරීම සලකා බැලීම පිණිස" ආදී වශයෙනුයි. මේ කාරණය ගැන සලකා බැලීම ගැන පමණයි තිබෙන්නෙ. කොතැනකවත් නැහැ ක්‍රියාවට පරිවර්තනය කරනවාය කියා. සලකා බැලීම පමණක් අපට අවශ්‍ය නැහැ. මන්ද? යම්කිසි විධියකින්, "අපි ඒ කාරණා ගැන සලකා බැලුවාය, රටේ තත්ත්වය හොඳය, ඒ නිසා ඒ ගැන කිසිවක් කිරීමට වුවමනා නැත" කියා පසුව නිශ්ශබ්ද වෙන්න පුළුවනි. අපේ යෝජනාවේ, සලකා බැලීමට වඩා වැදගත් කාරණා ගැන, වැදගත් පියවර ගැන, සඳහන්ව තිබෙනව. ඒ කියන්නෙ කාර්යක්ෂම පාලනයට සහ ජාතික හා ආර්ථික ප්‍රගතියේ ශීඝ්‍ර ගමනට බාධා පමුණුවන හැම ලක්ෂණයක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අහෝසි කිරීමට පියවර ගැනීමක් ගැන එම යෝජනාවේ සඳහන් වෙනව. ඒ අනුව ගන්න ක්‍රියා මාර්ගය පැහැදිලි කර තිබෙනව. එහෙම නම් මේ යෝජනාවෙන් ඒ අන්දමට පැහැදිලි කරන්න බැරි මන්ද?

ගරු කථානායකතුමනි, මෙම විශෙෂ කාරක සභාව, අවශ්‍යයයි අදහස් කරන සංශෝධනයන් සම්බන්ධයෙන් සලකා බැලීම පිණිස පත් කිරීම පිළිබඳවයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. ඇත්ත වශයෙන්ම විරුද්ධ පාර්ශ්වය මෙබඳු යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් අදහස් කරන්නෙ කුමක්ද? මේ රටේ පාලන කටයුතු ප්‍රජාතන්ත්‍රවාදීව, රටේ දියුණුවට අදාළ වන අන්දමට කරගෙන යාමට යම් යම් බාධාවන් තිබෙනවා නම් ඒවා සම්පූර්ණයෙන්ම නැති කර රටේ මහජනතාවගේ වැඩි කැමැත්ත අනුව ක්‍රියාත්මක වන ආණ්ඩුවකින්, මහජනතාවගේ සිතුම් පැතුම් අනුව, මහජනතාවගේ සම්පූර්ණ දියුණුවක් ඇති වීමට වේගවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිණිස නීතිගත බලතල අලුත් ව්‍යවස්ථාවකින් දීමයි, මෙවැනි යෝජනාවකින් විරුද්ධ පාර්ශ්වය බලාපොරොත්තු වෙන්නෙ. දැන් විරුද්ධ පාර්ශ්වයේ අදහස් ඉදිරිපත් කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ සිටින්නේ බාධාකාරී පිරිසකැයි නොසලකා, ඒ වගේම විරුද්ධ පාර්ශ්වයට අභූත චෝදනා ඉදිරිපත් නොකර, විරුද්ධ පාර්ශ්වය අවංකහිතින් ඉදිරිපත් කරන අදහස් රටේ පොදු දියුණුව සඳහා උපයෝගී කර ගන්නා ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

පූ. භා. 11.40.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු කථානායකතුමනි, මා වැඩිපුර කාලය ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ යෝජනාව ගැන කරුණක් දෙකක් කෙටියෙන් සඳහන් කරන්නටයි, මා අදහස් කරන්නෙ.

රටක පාලන ව්‍යවස්ථාව ඒ රටේ පාලනය සඳහා පමණක් නොව, අනාගතය සඳහාත් ඉතාමත්ම වැදගත් අත්තිවාරමක් වෙනවා. සාකච්ඡාවට භාජන වී ඇති මෙම යෝජනාව සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ සිටින ඒ ඒ පක්ෂවල මන්ත්‍රීවරුන් අතර ඇති මතභේද දෙස බැලූ විට පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) කීවාක් මෙන් මටද පෙනී යන්නේ අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේ දී, මේ රටේ මහජනයාගේ සහභාගිත්වයක් ඇති නොවුණු නිසා එවැනි මතභේද ඇති වන බවයි. 1947දී සකස් කරන ලද ව්‍යවස්ථාවත් 1948 පෙබරවාරි මාසයේදී ස්වාධිනත්වය ලැබීම පිණිස සංශෝධනය කරන ලද ව්‍යවස්ථාවත් යන දෙකම සකස් කරන ලද්දේ අපේ රටේ ජනතාවගේ සහභාගිත්වය නැතිවයි. එංගලන්තයේ යටත් විජිත භාර ඇමතිවරයා විසින් පත් කරනු ලැබ, මේ රටට එවන ලද රාජකීය කොමිසන් සභාව එවකට මේ රටේ සිටි නායකයන් සේ පෙනී හිය සීමාසහිත පිරිසක් සමග සාකච්ඡා කිරීමෙන් පසු ලියන ලද රිපෝර්තුවක් උඩ කෙටුම්පත් කරන ලද ව්‍යවස්ථාවකුයි, අප භාර ගත්තෙ. එම ව්‍යවස්ථාව පිළියෙල කිරීමට පෙර සෝල්බරි කොමිසන් සභාවේ වාර්තාව සකස් කිරීම පිණිස ආධාර දෙන්නට ඇත්තේ සමහර විට එදා නායකයන් මෙන් පෙනී සිටි අයයි. නමුත් විශාල පිරිසක් එම රාජකීය කොමිෂන් සභාවත් සමග කිසිම ගනුදෙනුවක්, සම්බන්ධකමක්, සාකච්ඡාවක්, ඇතිව සිටියේ නැහැ. ඒ වගේම ඒ කොමිෂම මගින් කරන ලද යෝජනාද මහජනයා සමග සාකච්ඡා කොට මහජනයාගේ සහභාගිත්වයද ඇතිව කරුණු පරීක්ෂා කිරීමෙන් පසු කරන ලද යෝජනා නොවෙයි. ඇත්තෙන්ම යම් යම් කොටස්වල නායකයන් අතර එදා පැවති පරස්පර විරෝධතා නිසා ඒ රාජකීය කොමිෂන් සභාවට නිගමනයකට බැසීමට පවා බැරි තත්ත්වයක් පැවතුණා. කෙසේ හෝ ව්‍යවස්ථාවක් සකස් කිරීමෙන් පසු බොහෝ කාලයක් තිස්සේ ජීවිතය දික් කරගෙන සිටි රාජ්‍ය මන්ත්‍රණ සභාව එය අනුමත කළා. එදා හිටපු නායකයන් කළ මූලික වැරැද්දක් නම් රටේ සාමාන්‍ය ජනතාවගේ සහභාගිත්වයක් නැතිව මේ ව්‍යවස්ථාව සකස් කිරීමයි. විශේෂයෙන්ම පිටරටක—මේ රටේ මහජනයාගෙන් ඈත් වුණු—නීති සම්පාදක පිරිසක් යටත් විජිත කාර්‍යාලයේ නිලධාරීන් සමග එකතුව සකස් කරන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ව්‍යවස්ථාවක් නිසයි, දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ රටට අද නොගැළපෙන ස්වභාවයක පවතින්නෙ.

අප අද මේ වාඩිවී සිටින්නෙ මේ රටේ ඇති වුණු 6 වැනි පාර්ලිමේන්තුවේයි. 1947 සිට මේ දක්වා පාර්ලිමේන්තු 6 ක් මේ ව්‍යවස්ථාව යටතේ පිහිටුවා තිබෙනව. 1947 සිට මේ පාර්ලිමේන්තුවට පත්වුණු යම් පිරිසක් සිටිනව නම් ඒ සෑම කෙනෙකුටම පැහැදිලියි, මේ ව්‍යවස්ථාව මේ රටට නොගැළපෙන බවත්, මෙහි අඩුපාඩුකම් රාශියක් තිබෙන බවත්. ඒ වගේම අළුතෙන් නිදහස ලබාගත් රටවල් දෙස බලන විට පෙනී යනව, එදා අධිරාජ්‍යවාදී පාලකයින් විසින් සකස් කර ඒ රටවලට බාර දෙන ලද ව්‍යවස්ථා බොහොමයක් අද ඒ රටවල් විසින් වෙනස් කරගෙන තිබෙන බව. ඒව වෙනස් කිරීම වැළැක්විය නොහැකිව තිබෙනව. අපේ රටත් අවුරුදු 18 ක, 20 ක පමණ කාලයක් තිස්සේ ලබන ලද අත්දැකීමෙන් ඉගෙන ගෙන තිබෙනව, අද පවතින සමාජ තත්ත්වයට ගැළපෙන අළුත්ම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය බව. ඒ ප්‍රශ්නය ගැන, එවැන්නක අවශ්‍යතාව ගැන, අප අතර ප්‍රශ්නයක් නැතැයි මා විශ්වාස කරනව. එහෙත්, අද අපට අමාරුවක්ව තිබෙන්නෙ අළුත් ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට කුමන සම්ප්‍රදායයක් අනුගමනය කළ යුතුද යන්න නිරාකරණය කර ගැනීමයි. අප අතර තිබෙන මූලික මත භේද රාශියක් නිසා ඒ ප්‍රශ්නයට ආවාම අපේ පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට අප හසු තත්ත්වයක් තිබෙනව.

පළමුවෙනි වරට 1956 න් පසුව මේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ චේතනාවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේත්, සෙනෙට් සභාවේත් නියෝජිතයන්ගෙන් සමන්විත කාරකසභා වරින්වර පත් වුණා. එහෙත්, ඒ එක කාරකසභාවකින් වත් අවසාන රපෝර්තුවක් නිකුත් වුණේ නැහැ. මා දන්නා හැටියට, අප අතර තිබෙන යම් යම් මූලික මතභේද නිසා ඒ සෑම කාරකසභාවකම වැඩ කටයුතු ප්‍රමාද වුණා. එසේ ප්‍රමාද වන විට එක්කොපාර්ලිමේන්තු සැසි වාරය අහෝසි වුණා; එහෙම නැත්නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය. දැන් මේ 6 වෙනි පාර්ලිමේන්තුව ආරම්භ කර අවුරුදු 2 ක පමණ කාලයක් ගත වන්ට කිට්ටුවන විට මේ යෝජනාව අර පෙර පිළිවෙළටම ඉදිරිපත් කර තිබෙනව. එහෙත්, පළමුවෙන් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළ දා සිට අද වන විට, මේ රටේ සමාජයීය තත්ත්වයත්, ආර්ථික පදනමත්, දේශපාලන වටපිටාවත් නොයෙක් ආකාරයෙන් වෙනස් වී තිබෙනව. ඒ නිසා 1956 දී නැත්නම් 1957 දී අප පිළිගත්ත යම් වැඩ පිළිවෙළක් අනුව මේ ව්‍යවස්ථාව අපි අද සකස් කරන්ට අදහස් කරනව නම් මා හිතන්නෙ ඒක විශාල මෝඩකමක්ය කියායි. මට පෙර කථා කළ පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ප්‍රිවි කවුන්සලයේ—රාජාධිකරණයේ—පියර් සාම්වරයා විසින් දෙන ලද නඩු තීන්දුවකට මේ සභාවේ අවධානය යොමු කළා. ඒ අවස්ථාවෙදි රාජ්‍ය ඇමතිතුමාත්, අගමැතිතුමාත් ඒ මතය පිළිගන්නෙ නැති ආකාරයට කථා කරමින් කිව්ව, ඒක වැරදිය කියල. මම ඒ නඩු තීන්දුවෙන් කොටසක් නැවත වරක් මේ සභාව ඉදිරියෙ කියවන්න කැමතියි.

I am quoting from the New Law Reports Volume 66, Privy Council Judgment, page 77-78.

"There follow (b), (c) and (d) which set out further entrenched religious and racial matters which shall not be the subject of legislation. They represent the solemn balance of rights between the citizens of Ceylon, the fundamental conditions on which, *inter se*, they accepted the Constitution. All these are, therefore, unalterable under the Constitution."

Mark those words, "All these are, therefore, unalterable under the Constitution."

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

That says, "under the Constitution", so we have to alter the Constitution.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

They are unalterable under the Constitution.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

Yes, under the Constitution.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

This is the section that deals with what is unalterable under the Constitution.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

We have to stop those.

සුබසිංහ මයා.

(திரு. சுபசிங்க)

(Mr. Subasinghe)

මේ ගැන අපිට තර්ක කරන්ට පුළුවන් බව ඇත්ත. ප්‍රිවි කවුන්සලය මොනවා කිව්වත්, දැන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට අපි අළුතින් ව්‍යවස්ථාවක් සකස් කළ යුතුය කියල මේ රටේ මහ ජනයා හිතට ගත්තොත්, ඒක කාටවත් වළක්වන්ට බැහැ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පත් වී සිටින මේ පාර්ලිමේන්තුවට ඒක කරන්ට බැහැ. නමුත් වෙනත් මාගී තිබෙනව, ඒක කරන්ට. විරුද්ධ පාර්ශවය කියන්නෙ අද තිබෙන තත්ත්වයේ හැටියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තේරුම් කර දී තිබෙන හැටියට, පාර්ලිමේන්තුවේ සාමාජිකයන් වන අපට මේ කටයුත්ත කරන්ට බලයක් නැති බවයි. දේශපාලන මත අනුව මේ පාර්ලිමේන්තුව ඇතුලෙ බෙදීම් තිබෙන ආකාරයට, තමුන්නාන්සෙල කොපමණ වැයම් කළත්, උන්නැහෙලාගෙ ආධාර ඇතිව මේ කාරක සභාව පත් කළත්, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අළුත්වැඩියා කිරීමට විරුද්ධව මෙන්න මේ ගල් ගුහාව ඇතුලේ ආරක්ෂාව සොයමින් සිටින පිරිසක් ඉන්නව. ඒ නිසා තමුන්නාන්සෙලාට බෑ, මේ කාරක සභාව—

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

තමුන්නාන්සේලා යෝජනාව ක්‍රියාවෙ යොදවන්නෙ කොහොමද?

සුබසිංහ මයා.

(திரு. சுபசிங்க)

(Mr. Subasinghe)

ඒකත් ප්‍රශ්නයක්. ඔව්, බොහොම අමාරුයි. ඒ ප්‍රශ්නයට මම පිළිතුරක් සපයන්නම්. මේ විදියෙ කරදරයක් තිබෙන බව අපි දෙගොල්ලම පිළිගන්නව. මේ ප්‍රශ්නය, මේ රටේ ජනතාවගෙ ප්‍රශ්නයක්. සමූහාණ්ඩුවක් මේ රටේ ඇති කිරීමට කටයුතු කරනවය කිව්වා විතා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංවිධානය කිරීම මූලික ප්‍රශ්නයක් හැටියට කිසිම දේශපාලන පක්ෂයක්, කිසිම මැතිවරණයකදි මහජනයා ඉදිරිපිට තබා නැහැ. සමාජවාදය ගැන අප කථා කරනව. ඒක ඇත්තක්. සමූහාණ්ඩුවක් ගැනත් අප කථා කරනව. ඒකත් ඇත්තක්. ඒ සමගම අප තවත් කාරණයක් ගැන තර්ක කරනව. පොදු රාජ්‍ය මණ්ඩලය තුළම අප සිටිය යුතුද, ඉන් පිටත සිටිය යුතුද යනුවෙනුත් අප කථා කරනව. ඒ කොයි හැටි වෙතත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙතෙක් කල් අප කවුරුවත් මහජනයා ඉදිරියේ විශාල උද්ඝෝෂණයක් ගෙන ගොස් නැහැ. පාර්ලිමේන්තුවට ආවාම—අලුතින් පාර්ලිමේන්තුව රැස් වුණාම—අප නොවරදවාම යෝජනාවක් ගෙන එනව. මන්ත්‍රී මණ්ඩල දෙකෙන්ම —නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය යන දෙකෙන්ම —මන්ත්‍රීවරුන් තෝරා ගෙන ඒ කණ්ඩායම් දෙකම එකට එකතු වී කමිටුවක් හැටියට ක්‍රියා කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සකස් කළ යුතුය යනුවෙන් යෝජනාවක් වරින් වර ගෙන එනව. වෙනත් වැඩක් නැති වෙලාවක මේ ගැන සාකච්ඡා කරන්න නයි ක්‍රියා කරන්නෙ. අප කළ යුත්තේ එසේ නොවේයයි මා කල්පනා කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටට හිතකර, රටට වැඩදායක නියම ව්‍යවස්ථාවක් සකස් කර ගන්න අපට වුව මනා නම් මීට වඩා නීතිමය සීමාවලින් පිට තට ගොස් ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට සුදුසු මාර්ගය කුමක්දැයි අප විසින් සොයා බැලිය යුතුය යනු මා කල්පනා කරන හැටියි. මගේ පෞද්ගලික අදහසයි ඒ. එහෙත් මේ පැත්තේ විරුද්ධ පාර්ශ්වයට අයිති පක්ෂ සියල්ලක්ම මගේ ඒ අදහස අනුමත කරනු ඇතැයි මා විශ්වාස කරනව. මේ ප්‍රශ්නය සාකච්ඡා කරන විට මෙවැනි තවත් ප්‍රශ්න මතු කරන්න අපට හොඳටම ඉඩ තිබෙනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ කයි අපිත් කියන්නෙ.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)
එහෙත් අද කරන මේ වැඩ පිළිවෙළ කිසිම වැඩක් නැති පිළිවෙළක් බවයි මා කියන්නෙ. අප දෙගොල්ල එකට එකතු වී සාකච්ඡා කරන විට අපට එකඟ වෙන්න පුළුවන් ප්‍රශ්න සම්බන්ධයෙන් එකඟත්වයක් ඇති කර ගන්නත් අපට පුළුවනි. එසේ ක්‍රියා කරගෙන යන අවස්ථාවේදී යම් නීති ප්‍රශ්නයක් පැන නඟින්න බැරි කමක් නැහැ. සමහර විට එවැනි අවස්ථාවක අප හැම දෙනාටම එකඟත්වයකට එන්න බැරි දෙයක් පැන නඟින්න පුළුවනි. එවැනි තත්ත්වයක් ඇති වුණොත් අපට එකටම යන්න පුළුවන් වේවි, මහජනයා ඉදිරියට. එක් කණ්ඩායමක් හැටියට නොවෙයි අප එසේ වුණොත් යන්නෙ. මා කියන්න අදහස් කළේ යම් ප්‍රශ්නයක් මතු වුණොත්, එහිදී අපට එකඟත්වයකට පැමිණීමට බැරි වුණොත්, ඒ ප්‍රශ්නය මහජනයා ඉදිරිපිට තබන්නත් පුළුවන් බවයි. මේ ආණ්ඩුව වුවත් පුළුවන් තරම් වෑයම් කරනු ඇති, මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණෙන්න. මේ රටට ෆෙඩරල් ක්‍රමයක් නුසුදුසුයයි අද රටේ බහුතර ජනතාවගෙන් වැඩි දෙනෙක් කියනව. එය වැඩි දෙනාගේ මතයයි. ඒ අතර ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන් කියනවා ෆෙඩරල් ක්‍රමය ඒ අය අනුගමනය කරනවය කියා. ෆෙඩරල් ක්‍රමය නුසුදුසුයයි අනෙකුත් පක්ෂ කියනවා නම් එක්සත් ජාතික පක්ෂය ෆෙඩරල් ක්‍රමය සුදුසුයයි කියන්නන් සමඟ එකඟත්වයකට පැමිණෙන්නෙ කොහොමද? එවැනි තීරණයකට බහින්න පුළුවන්දැයි මා අහනව. තීරණයකට බැසීමෙන් පසු කළ යුතු තවත් දෙයක් තිබෙනව. ඒ අනුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවකට මේ ගරු සභාවෙදි තුනෙන් දෙකක ඡන්දයක් ගන්න පුළුවන් වෙයිද? අන්න එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන නිසා ඒ ගැන කල්පනා කළ යුතුව තිබෙනව. එවැනි අවහිරකම් පෙනි පෙනී ඉදිරිපත් කරන යෝජනාවක තේරුමක් නැහැ.

තවත් ප්‍රශ්නයක් අහන්නට මා බලා පොරොත්තු වෙනව. මේ ව්‍යවස්ථාව වෙනස් කරන්න අපට බලයක් නැතැයි ඒ අය කියන්නෙ නැද්ද? මේ නඩු තීන්දුව උන්නැහෙල පිළිගන්නවද? උන්නැහෙල මේ නඩු තීන්දුව පිළිගන්නෙ නැද්ද? මේවා වැදගත් ප්‍රශ්න නොවෙයිද? ඒවා ගැන නොසලකා ක්‍රියා කරතොත් අප කරන්නෙ දේශපාලන විහිලුවක් බවයි මා කියන්නෙ. යෝජනාවක් නම් ඉදිරිපත් කරනවා තමයි. එහෙත් එයින් පමණක් සෑහීමකට පත් වෙන්න බැහැ. කමිටුවක් පත් වුණාම ඒ මහින් යම් යම් වාර්තා ඉදිරිපත් කරනු ඇති. ඒ කොයි හැටි වෙතත් ඒ මහින් අපේ ප්‍රශ්න—අපේ ඉතාමත් වැදගත් ප්‍රශ්න—විසඳෙනවාදැයි අහන්න කැමතියි. අපේ ප්‍රශ්න එයින් විසඳෙන්නෙ නැහැ. එහෙම නම් නිකරුණේ කාලය මිඩංගු කළා වෙනවා නොවෙයිද? මේ ප්‍රශ්න විසඳීමට මූලික එකඟත්වයක් අවශ්‍යයි. ඒ එකඟත්වය අද තිබෙනවද? අන්න ඒ ප්‍රශ්නයයි දැන් අප ඉදිරිපිට තිබෙන්නෙ. එවැනි එකඟත්වයක් නැත්නම් මොකක්ද ඇති වන තත්ත්වය? නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කිව්වා වාගේ මෙය ද්වේෂසහගත චේතනාවකින් අපට චෝදනා කරමින් ඉදිරිපත් කර තිබෙන්නකැයි කියන්නයි සිදු වන්නෙ. මේ 20 වන ශත වර්ෂයේ අවසාන කොටසේ අපේ රටේ අද තිබෙන තත්ත්වය ගැන සලකා බලා අපේ සමාජයට, අපේ රටට ගැලපෙන අන්දමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අවංකව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කටයුතු කරනවා නම් අපේ සම්පූර්ණ සහ යෝගය දෙන්නට අපි සූදානම්. එහෙත්, මේ කරන්න හදන වැයම දේශපාලන අතින් සුළු වාසියක් ලබා ගැනීමට කරන වැයමක් මිස මා සඳහන් කළ අන්දමේ සත්‍ය ලෙස අවංකව ගන්නා වැයමක් නොවෙයි. දේශපාලනය අතින් සුළු වාසියක් තකා මේ රජය කිසිම පැකිළීමක් නැතිව මෙවැනි දේවල් කරන බව අපට නොයෙක් වර පෙනිගොස් තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් වෙලාව 12 යි. අද 1 වන තුරු රැස් වීම පැවැත්වීමට කලින් තීරණයක් ගත්ත.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Now it is not necessary.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙමනම් අපරභාග 2 වන තුරු රැස්වීම තාවකාලිකව අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු කථානායකතුමනි, මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ තව විනාඩි සවලපයක් පමණයි. මේ ඒකාබද්ධ විශේෂ කාරක සභාව පත් කිරීමේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට පෙර මේ කාරණය සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ නායකයින් අතරත්, විරුද්ධ පාර්ශවයේ නායකයින් අතරත්, දීර්ඝ වශයෙන් සාකච්ඡා ඇති වූ බව තමුන්නාන්සේත් දන්නවා ඇති. එමෙන්ම, මා කලිනුත් සඳහන් කළ පරිදි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් යම් වෙනස්කම් කළ යුතුය කියන කරුණ ගැන නම් දෙපක්ෂයම එකඟ වුණා. ඒ සම්බන්ධව අප දෙපක්ෂය අතර තිබුණු මූලික මතභේදය නම් මෙයයි: අද අප භාවිතා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික පදනම කරගෙන එහි සංශෝධනයක් කළ යුතුය කියන එකයි, ආණ්ඩු පක්ෂය කියා හිටියේ. එහෙත්, විරුද්ධ පාර්ශවය කියා හිටියේ, වර්තමාන තත්ත්වයට හා මේ රටට ගැලපෙන පරිදි සම්පූර්ණයෙන්ම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුතුය යන්නයි. මේ අදහස් දෙක අතර ගැඹුරු වෙනසක් තිබුණත් සාකච්ඡා මාර්ගයෙන් ඒ අදහස් දෙක අතර සම තත්ත්වයක් ඇති කර ගැනීමට ඉඩකඩ තිබුණාය කියා මා විශ්වාස කරනවා. මේ යෝජනාවේ හැටියට, සමූහාණ්ඩුවක් පිහිටුවීමේ ප්‍රශ්නය මේ කාරක සභා මගින් සාකච්ඡා කළ යුතුය කියා ආණ්ඩු පක්ෂය කියනවා. අපි ඊට වඩා දුර යනවා. එහෙත්, ප්‍රතිපත්තියක් වශයෙන් අපේ ප්‍රතිපත්තියට විරුද්ධ වීමට ආණ්ඩු පක්ෂයට පුළුවන්ය කියා මම හිතන්නෙ නැහැ. අපි කිව්වේ සම්පූර්ණ ස්වාධිපත්‍ය හා පූර්ණ බලධාරී ආණ්ඩුවක් පිහිටුවීමට හැකිවන අන්දමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුතුය කියලයි. යම් යම් රහස් හේතූන් තිබෙනවා නම් මිස —ඒ ගැන පසුව සඳහන් කරන්නම්—ප්‍රතිපත්තියක් වශයෙන් මෙයට විරුද්ධ වන්නට හේතුවක් ආණ්ඩු පක්ෂයට තිබෙනවාය කියා මා හිතන්නෙ නැහැ.

රටවැසියන්ගේ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම ගැන ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ සඳහන් වෙනවා. අපි එයට සම්පූර්ණයෙන්ම එකඟයි. මේ රටේ සෑම කෙනෙකුටම, සෑම පුරවැසියකුටම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වැනි වගන්තියේ තිබෙන අයිතිවාසිකම් අනුව, ඊටත් වඩා පුළුල්, ඊටත් වඩා ගැඹුරු විධියට, අද සමාජයට ගැලපෙන අන්දමින්, ඒ මූලික අයිතිවාසිකම් සහතික කළ යුතුය කියන එක අපිත් කියනවා. එමෙන්ම සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා පත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය ගැන පරීක්ෂා කර බැලිය යුතුය කියලත් ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කර ඇති මේ යෝජනාවේ තිබෙනවා. ඒ සම්බන්ධවත් අප අතර විශාල මතභේදයක් තිබෙනවා. අවුරුදු 18ක් හෝ 19ක් තිස්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙනෙට් සභාව කටයුතු කර තිබෙන ආකාරයත්, එය පත් කර ඇති ආකාරයත් දෙස බලන විට ඒ මණ්ඩලයෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද කියන එක ගැන මේ ගරු සභාවෙත් රටෙත් හුඟදෙනකු තුළ සැකයක් ඇති වී තිබෙනවා. ඒ සම්බන්ධව ආණ්ඩු පක්ෂය කියා සිටින්නේ, ඒ ගැන පරීක්ෂා කර බැලිය යුතුය කියන එකයි. එහෙත්, ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කළ යුතුය කියා අපි කියනවා.

තවත් ප්‍රශ්නයක් නම් රජයේ සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිළිබඳ ප්‍රශ්නයයි. ඒක ඒ තරම් වැදගත් ප්‍රශ්නයක්ය කියා මා හිතන්නෙ නැහැ. ඒ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වෙන්නෙ නැහැ.

ඊළඟට අපේ යෝජනාවෙන් කියා තිබෙන්නෙ කුමක්ද? එම යෝජනාවෙ සඳහන් කරුණු කීපයක් අතුරෙන්, "ශ්‍රී ලංකා ජනතාවගේ සමාජවාදී අරමුණු ප්‍රකාශ කිරීම හා කථා කිරීමේ නිදහස, සමිති සමාගම් පැවැත්වීමේ, රැස්වීමේ, ආගම් ඇදහීමේ, සියලු දෙනාටම වැඩ කිරීමේ අයිතිවාසිකම් වැනි මූලික ප්‍රජාතන්ත්‍රවාදී හා අනිකුත් අයිතිවාසිකම් සහතික කිරීම" යන කරුණු පැහැදිලි වශයෙන් දක්වා තිබෙනවා. **අවංකවම කල්පනා කර** නවා නම් මේ මූලික කරුණු කීපය උඩම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීම සඳහා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙත්—සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ අය තමන්ගෙ බෙල්ලෙ වැල දමා ගන්න සූදානම් වේවිද කියා මා දන්නෙ නැහැ, ඒ කෙසේ වෙතත්—සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේත් විශේෂ කාරක සභාවක් පත් කර කටයුතු කිරීමට එකඟත්වයක් ඇති කර ගැනීමට නොහැකි වේය කියා මා විශ්වාස කරන්නෙ නැහැ. නමුත් යම් හේතුවක් නිසා මේ ආණ්ඩුව ඒ කිසිවකට කැමති නොවී ආණ්ඩු පක්ෂයේ අදහස පිළිඅරගෙන කටයුතු කළ යුතුය කියා තරයේම කියා සිටිනවා. මට පෙනෙන හැටියට ඒකට මූලික හේතුව මේකයි. අද පවත්නා මේ ආණ්ඩුව යම් යම් පරස්පර විරෝධී පරමාර්ථයන් ඇති කණ්ඩායම් කීපයකින් සමන්විත ආණ්ඩුවක්. මේ ආණ්ඩුවේ මේ පරස්පර විරෝධී කොටස්වල එකඟත්වය අපේ මේ යෝජනාවේ සඳහන් සමහර දේවලට නොලැබෙන හේතුව නිසා, ඒ කියන්නෙ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් සකස් කරන ලද වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන යම් යම් ආරක්ෂාවන් යම් විධියකින් වැනසේය යන බියෙන්—ඇත්ත වශයෙන්ම විරුද්ධ පක්ෂය කවදාවත් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම්වත්, ආගම් ඇදහීමේ නිදහසවත් වෙනත් අයිතිවාසිකම්වත් නැති කිරීමට සූදානම් නැති බව සහතික කර කියන්ට පුළුවන්—නමුත් අර සැකය උඩ පමණක් අප කියන ආකාරයට පළල් පිළිවෙළට සාකච්ඡා කර අළුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට සූදානම් නැති හේතුව නිසා අද මේ පිළිවෙළට සීමාවන් ඇතිව මේ යෝජනාව ඉදිරිපත් කර ඉදිරියට ගමන් කරන්ට බැරි තැනකට මේ ආණ්ඩුව පැමිණ තිබෙනවා. එසේ නම් අප සියලු දෙනාගේම සම්පූර්ණ සහයෝගය නැතිව මේක කරන්ට බැරි බව දන දැනත් ඇයි මේ අන්දමට මේ යෝජනාව ඉදිරිපත් කර සම්මත කර ගන්නට උත්සාහ කරන්නෙ? මේ කරන්නෙ දේශපාලන කපටි කමක්ය කියා මා තුළ විශ්වාසයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, දැනට මාස එකහමාරකට දෙකකට පෙර විරුද්ධ පක්ෂයේ අයිතිවාසිකම් නැති වේය යන බියක් උඩ අපේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා එක්තරා අඩියක් ගත් බව තමුන්නාන්සේට මතක ඇති. අප ටික දවසක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කටයුතුවලට සහභාගි නොවී සිටියා. ඒ කාලයේදී පැවති අතුරු මැතිවරණවලදී, ආණ්ඩුව විසින් ඉදිරිපත් කර තිබෙන නින්දගම් කෙටුම්පත් පනතකට අප විරුද්ධ නිසා, නින්දගම් ක්‍රමය නැති කරනවාට අප විරුද්ධ නිසා විරුද්ධ පක්ෂය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නොපැමිණෙනවාය කියා ආණ්ඩුව විරුඬ පක්ෂයට චෝදනාවක් එල්ල කළා. එය සම්පූර්ණයෙන්ම බොරු චෝදනාවක්. ආණ්ඩු පක්ෂයේ වගකිවයුතු මූලික පුද්ගලයාගේ කටින්ම ඒ චෝදනාව පිටවුණා. ඒ අන්දමට මේ ගරු සභාවට ඉදිරිපත් කරන යම් යම් යෝජනා සම්බන්ධව අප ගන්නා පියවරවල් පිළිබඳව මහජනතාව තුළ වැරදි අවබෝධයක් ඇති කරනීමට උත්සාහ කළා. අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙත් අපේ ආණ්ඩුක්‍රම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

ව්‍යවස්ථාව සංශෝධනය කිරීමටවත් අළුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමටවත් නොවෙයි; දේශපාලන වාසියක් ගැනීමටයි. මහජනය මේව නොපිළිගන්න නමුත් මෝඩ දේශපාලනඥයෝ නවමත් මෙවැනි අදහස් උඩ වැඩ කරනව. ඇයි මේ බොරු කරන්නෙ? වැඩි දෙනෙක් ඉන්නෙ තමන්ගේ පැත්තෙ යයි ගරු රාජ්‍ය ඇමතිතුමා බොහොම උදම්ව, බොහොම උඩඟුවෙන් කියා සිටිය. එවැනි බලයක් තියෙද්දි මේ වගේ සැක සහිත, අවිශ්වාස සහගත ක්‍රියාවක් කරන්නෙ ඇයි? වැඩි දෙනාගෙ කැමැත්ත අනුව අලුත් ව්‍යවස්ථාවක් සකස් කරනව නම් අපට ඒ ගැන සලකා බලන්න පුළුවනි. ඇත්ත කියා එක එල්ලේම ඒ පිළිවෙළට වැඩ නොකර මේ කරන්න යන පිළිවෙළ සුදුසු නැහැ.

මේ පාර්ලිමේන්තුවෙ සම්මතියක් ඇතිව, හැම පක්ෂයකම සහයෝගය ඇතිව, සුදුසු පිළිවෙළකට අලුතෙන්ම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට අපි කටයුතු කරමු. දැනට තියෙන ව්‍යවස්ථාවට එහෙන් මෙහෙන් පැලැස්තර දමා අතනින් මෙතනින් පිළියම් කොට එය අලුත් ව්‍යවස්ථාවක් හැටියට ඉදිරිපත් කිරීම ගැන අපි මොහොතකටවත් එකඟ වන්නෙ නෑ.

මේ රටේ සම්පූර්ණ බලය ලන්ඩන් නුවර යටත් විජිත පාලනය පිළිබඳ අමාත්‍යාංශයට හිමි වී තිබුණු කාලයෙදීත් අවුරුදු 10කට 15 කට වරක් රාජකීය කොමිසමක් යටත් විජිතවලට යවා ඒ වායෙ ආණ්ඩුක්‍රම සංශෝධනය කිරීමේ සිරිතක් සම්ප්‍රදායයක් තිබුණ. ඒ අනුව අපේ රටෙත් 1924 දී ප්‍රතිසංස්කරණයක් ඇති වුණා. ඊට පසුව 1929 දී ඩොනමෝර් සාමිගෙ නායකත්වයෙන් යුත් කොමිසමක් ලංකාවට පැමිණ ආණ්ඩු ක්‍රම සංශෝධනයක් කළා. ඊටත් පසුව සෝල්බරි සාමිගෙ නායකත්වයෙන් යුත් තවත් කොමිසමක් ලංකාවට ආව. ඉන්දියාවෙ "මින්ටර් රිෆෝම්ස්" "කෙම්ස් පර්ඩ් රිෆෝම්" ආදී වශයෙන් නොයෙක් විධියෙ ප්‍රතිසංස්කරණ සිදු වුණා. යටත් විජිත පාලනය යටතේ තිබුණු ඒ ප්‍රතිපත්ති අනුගමනය කරන්න ඕනෑයයි මම කියන්නෙ නෑ. නමුත්, පසුගිය අවුරුදු 25 ඇතුලත මේ රටේ ඇති වී තිබෙන වෙනස දෙස බලන විට, 1930 ගණන්වල ඇති කළ යෝජනා අනුව සකස් කරන ලද ව්‍යවස්ථාවකින් මේ රටේ පාලනය ගෙනයන්න බැරි බව අපට පෙනෙනව. සහමුලින්ම ඊට වෙනස් ව්‍යවස්ථාවක් අද මේ රටට වුවමනායි. ඒම නිසා අද තිබෙන තත්ත්වය අනුව, අපගේ සර්වබලධාරී තත්ත්වය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරගන්න පුළුවන් අන්දමට අලුත්ම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පමණක් අපි කැමැති වන බව කියමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 2.15

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We are debating the following Motion :

"That a Select Committee of fifteen Members be appointed to join with a Select Committee to be appointed by the Senate as a Joint Select Committee to consider the revision of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, and other written law with reference to the following among such other matters as the Committee may consider necessary. . . ."

My argument today deals with this question : Why cannot we form a part of the Joint Select Committee for the purpose of the revision of the Ceylon Constitution ? Those are the words used here : "revision of the Ceylon Constitution".

Now, I want to make it clear that this is not a new situation. May I take your mind back to 1947. When the late Mr. D. S. Senanayake introduced the new Constitution for the consideration of this House a number of members of my party expressed grave doubt about the completeness of the independence that we have been granted. We stated, for two reasons, that we could not accept that as complete independence. One was the treaty rights, the so-called agreement by which the Government was able to draw upon the British Government and bring in soldiers if they wanted ; the other was the question of the territorial rights that the British enjoyed over Trincomalee. Another

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

point was the general position whether we have the full rights that we ought to enjoy as a free nation.

Subsequent events remedied some of these defects. We are grateful to the late Mr. S. W. R. D. Bandaranaike. He made an inroad into the Constitution in so far as he removed the extra-territorial rights that the old Constitution provided: Trincomalee was taken over, Katunayake was taken over, and our sovereignty so far as those two areas were concerned was completely established. And this remains—I am going to tell you what. What we have not yet changed is the Constitution—completely.

Now, in this respect, may I draw your attention to a very important factor.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

What about the military pact?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That was also one of the things about which we expressed doubts in 1947.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Still there?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

They are still there, but subsequent events have shown that the military pact has not the force that we thought it had.—[*Interruption*] Granted. It is not denied.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

The bases were removed.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Once the bases were moved, perhaps, the pact was weakened.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We had the power to remove the bases.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The late Mr. S. W. R. D. Bandaranaike tried to establish our sovereignty completely by changing the Constitution. He was the person who first set up a Select Committee. The United National Party cannot claim any credit for this position. They took for granted that the existing Constitution was the best. Mr. Bandaranaike did not accept that position. He introduced for the first time a Joint Select Committee for the purpose of revising the Constitution. On that occasion this is what I stated. I am reading at column 1463 of the proceedings of this House of 26th November 1957. This is what I said on the occasion when the Motion regarding the revision of the Constitution came up:

"But there is a much more fundamental point about which I have certain doubts in my own mind. Now assuming for a moment that we are going to have a Republic: it means a fundamental change in the present position. A Republic would mean that the source of power has been completely changed. If you look up the Constitution you will find that the source of power in our Constitution is Her Majesty the Queen." [OFFICIAL REPORT, 26th November 1957; Vol. 30, c. 1463.]

Today the source of power in the Constitution of Ceylon is Her Majesty the Queen. That is the big difference. The fundamental position is this: have we the right to change that source of power? Have we, in this Parliament, seated in the places we are now, the right to change that source of power? That is the doubt I raised on that occasion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

I go on :

"Now a Republic would mean that the source of power will completely change and the source of power will be the people."

That is the big difference in this whole set-up. This is not a small matter as my Friend thinks—merely a question of all of us sitting round a table and trying to devise a series of small changes in the Constitution. Our position is that this is a futile attempt on the part of this Government. This is going to be a farce. This whole concept has to change. We have to consider this position from the larger point of view and that of the source of power. I went on to say this :

"Under a Republic, the preamble to the republican form of Government will have to say, 'We, the people of Ceylon, in our wisdom,'—or whatever it is—[*laughter*] —You might call it unwise or folly."—

කෙනෙමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

He laughs at the idea that power should belong to the people.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

—" 'have decided to have this particular form of Government guaranteeing certain fundamental rights to be recognized,' and so on. If that is so, can we by merely changing the Constitution remove the source of power, except by getting that power from the people direct ?"

In other words, can we here now change the source of power without going back to the people who can give us that power ? That is the fundamental question that we have to decide. That has come to a head because of a decision given in the Privy Council recently. There is no use my Friend talking like this. We can fashion any Constitution we like and anyone can appeal against that before the Privy Council tomorrow, especially at a time when there are a large number of people who are interested in carving out a federal Constitution. I will quote that judgment of the Privy Council.

What we are trying to enact here is a farce. We must go back to the people and ask the people to give us the power to enact a new Constitution. I will also read out to you what other countries have done. I have said further :

"Therefore, it is a very moot legal point, whether in point of fact we can transform ourselves into a republican form of Government without going to the people and getting the source of power from the people." [OFFICIAL REPORT, 26th November 1957 ; Vol. 30, cc. 1463-4.]

That is what I said in 1957. I feel justified in saying now that I have been proved right. My fears have materialized. I have with me the full judgment of the Privy Council. It is in Appeal No. 25 of 1965. I will read it out presently.

It is not an accident that countries like India, Malaysia, Indonesia, Pakistan and other countries that became free particularly after the last war, countries that threw off their shackles of imperialism gave up their colonial status and became independent, have set up entirely new constitutions by virtue of constituent assemblies. I will read out to you a few of the types I have in mind. Take, for instance, the Constitution of the People's Republic of China. This is what the Preamble says :

"The National Assembly of the Republic of China : by virtue of the mandate received from the whole body of citizens the sovereignty of the Republic of China shall vest in the whole body of citizens. There shall be equality among the various racial groups. . . ."

The important point is that they hark back to the fact that the power comes to them from the people of China.

The Constitution of the Czechoslovakian Republic says :

"We the people of Czechoslovakia declare that we are firmly resolved to build a people's democracy in our liberated country which will ensure us a peaceful road to socialism."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Article I states :

"The Czechoslovakian State is a people's democratic republic."

Article 2 states :

"The people shall be the sole source of all power in the State."

Therefore, you cannot now go and shift the source of power by merely revising the Constitution as my good Friend tries to do. By so doing he cannot set up an entirely new source of power in Ceylon. That is why we are opposing this Motion. That is why we think this is a futile exercise in constitution-making unless the Hon. Minister of State wants to spend a little time in the healthy exercise of constitution-building for the pleasure of, shall I say, posterity.

The Soviet Constitution says :

"All power in the Union of the Socialist Soviet Republics belong to the working people of town and country as represented by the Soviet working people's deputies."

Everywhere, whether it is these constitutions or others that have been set up since the war, particularly after colonialism has been abolished in these countries, constituent assemblies have been set up. They have gone to a new source of power, that is the people, directly, and then framed their own constitutions. That is what we are now asking you to do.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

It is not in your Motion.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Why not ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

We have said that sovereignty should belong to the people. Read our Motion.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I think you find it in the Order Book.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Our Motion starts by saying :

"to establish a completely independent and sovereign Republic in which all power will be derived from the people of Sri Lanka ;"

We want the Committee to draft a new Constitution.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

See the last sentence : to report to the House.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Report on how they are proceeding with the draft. Read the first sentence :

"That this House is opinion that a Select Committee of this House should be appointed to prepare a draft of a new Constitution of Sri Lanka...."

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Then withdraw your Motion and accept ours.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Our Motion speaks of drafting a new Constitution and not of a revision of the Constitution. Your Motion states :

"That this House is of opinion that a Select Committee of this House should be appointed to prepare a draft of a new Constitution of Sri Lanka which will among other matters : ...."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

How are we to make it legal ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Our Motion was to establish a completely independent republic in which all power is derived from the people of Sri Lanka. In other words, we will only prepare a draft which will have to be put before the people.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We will do that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

But you are asking us to revise the Constitution. You are not asking us to draw up a new Constitution. You are taking the present Constitution as the base and you are asking us to revise the Constitution, some minor things in it. The Hon. Minister of State has forgotten that when we had a discussion in your room, Sir, the hon. Member for Jaffna took up a fundamental position. He said that there is a fundamental difference in the approach to this whole question. I argued and said that we did not accept that position. Please do not misunderstand, and I do not want the minority Members to misunderstand. We are quite prepared to grant the minorities all the safeguards that they want in the Constitution safeguards for their minority rights. We are prepared to do that by all means, but we must have a fundamental change in the basis of power.

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා.
(අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)
(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice)

And freedom for the country.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I will quote to you, if you want, all the safeguards that the socialist countries have given their minorities in their constitutions, and they are perhaps much more fundamental and more far-reaching than any safeguards found in any other constitution. We are prepared to embody all those safeguards that you want. There is no question about that. So far as we are concerned, we have never denied you your religious rights, your minority linguistic rights, or your cultural rights. We do not want to deprive you of them, and we have never attempted to deny that position. We have all got to live together in this country.

You are now asking us to do something which will only end in stultifying ourselves in the face of what we have recently had to face through the decisions of the Privy Council. There is a fundamental difference in this position. One of the major defects in this Constitution that we have got today is that it is a written Constitution without any provision for the interpretation of the dependent on somebody completely outside who has no concept of our traditions, of our culture, of our heritage.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

That can be put right when we amend it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

How are you going to put it right by merely revising the Constitution ? Unless you are prepared to make a fundamental change in the whole source of power, how are you going to do it ? I hope the Hon. Leader of the House will appreciate the point I am making.

The position is this : Today our source of power is the Queen. For this country to be really independent and to be a republic this has to be removed. How can we deprive the Queen of her source of power ? Can we deprive the Queen of her source of power except by declaring openly here, that the power comes from the people and not from the Queen ? We must sever our connections as India has done. That is a completely different approach. You have to say that no longer is the source of power the Queen. In India, the source of power is the people.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Cannot the different parties—

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

They cannot. That power has to come from the people.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

If the House approves ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

This House has no mandate for that. We must go back to the people to set up a Constituent Assembly.

නයිනා මරික්කාර් මයා.
(ஜனாப் நயினா மரிக்கார்)
(Mr. Naina Marikar)

So, we will do that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We can prepare a draft which will have to go before the people.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

That can be done.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

If you are prepared to accept the draft of an entirely new Constitution with the people as the source of power, we are quite prepared to sit with you and approve it. We have no objection.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

So, sit with us.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

If you accept our Motion.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is why we are asking you to remove the words "revision of the Constitution".

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Accept our Motion and sit with us.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Your Motion excludes us.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

How can we create a republic without amending the whole source—

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I hope the Hon. Minister of State has read his own Motion.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

This is a Motion which all of you accepted.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Lots of things have happened since then. A lot of water has flowed under the bridge since then.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

But the Constitution has not changed. That is the point.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is precisely what we are saying. We want a complete change of the Constitution.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

The Privy Council has given a number of decisions since then.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

If you sit with us we can discuss the whole question. How can we debate it here ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We cannot.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Join our Committee. That is my appeal to you.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

My Friend was not in the Joint Select Committee that was appointed earlier. I sat in that Committee and I did a good deal of work with Mr. Bandaranaike.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

That is why we want you.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Most of the work was finished—[*Interruption*]. I am not prepared to just stultify myself—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

You will not.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

—because you are asking me to agree to something else.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

We do not mind making a fool of you but we do not want to make fools of ourselves.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The whole question arose as a result of two Privy Council judgments, admittedly—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

That is the point. Do not accept that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It is no use my good Friend saying " do not accept ". Suppose, in point of fact, we draft a Constitution which removes the source of power, the Queen, and say that the source of power hereafter will be the people. What will happen then ? The Member for Nallur (Dr. Naganathan) will take us before the Privy Council—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

There will be no Privy Council.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What do you mean by saying that there will be no Privy Council ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

It will be abolished.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It is not as simple as we think. How can you do things like that without getting the—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Without getting what ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Without any sanction from the people.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We will do that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Where is the sanction ? You and I have no sanction to do that.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We will create the sanction.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We must go before the people and ask them for the sanction. We must have a Constituent Assembly set up before going to the people to ask for their sanction.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We will have a referendum.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Whether you have a referendum or a General Election it will mean the same thing. You can have a referendum if you like.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Shall we go into Committee ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Do not forget Mr. Gratiaen's argument. I am reading from the Privy Council Appeal No. 25 of 1965 : " Don John Francis Douglas Liyanage and others, appellants, *vs.* the Queen, respondent ; an appeal from the Supreme Court of Ceylon. Reasons for the Report of Their Lordships of the Judicial Committee of the Privy Council, delivered on the 2nd of December 1965." I am reading from the document from the Privy Council. Present at the hearing were Lord Morris, Lord Guest, Lord Pearce and Lord Pearson. The judgment was delivered by Lord Pearce. The important thing is this. Mr. Gratiaen's argument was, first, that as the Ceylon Parliament is limited by inability to pass legislation which is contrary to the fundamental principles of justice——

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)
(டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்)
(Dr. E. M. V. Naganathan—Nallur)

Hear, hear !

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There you are ! That is precisely what I am saying.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

The hon. Member does not understand what " fundamental principles of justice " are.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

No, I do not. I grant my Friend's omniscience. That is precisely my point. He will be the first Member who will go to the Privy Council and say, " You have violated the fundamental principles of justice. You have now removed the power of the Queen, and you have granted power to the people of Ceylon which you have no right to do ". And then, where are we ?

කෙනමන් මයා.
එෆ්පෙඩරල් පක්ෂය අද කියන්නෙ මොකක්ද? මේ රටේ සුළු ජාතියක් වන ද්‍රවිඩ ජනතාවගෙ අයිතිවාසිකම් රැක ගන්නට පුළුවන් වන්නෙ එෆ්පෙඩරල් ක්‍රමය කින්ම පමණක් බවයි ඒ පක්ෂය පැහැදිලිවම කියා සිටින්නෙ. තමාගෙ අදහස අවංකව ප්‍රකාශ කිරීම ගැන අපි ඒ ගරු මන්ත්‍රීතුමාට ගරු කරනවා. තිරුචෙල්වම් ඇමතිතුමාත් ඒ අදහස ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එෆ්පෙඩරල් ක්‍රමය නැතිව ද්‍රවිඩ ජනතාවගෙ අයිතිවාසිකම් ආරක්ෂා කරගත හැකිය යන විශ්වාසයක්වත් පිළිගැනීමක්වත් එෆ්පෙඩරල් පක්ෂයට නැහැ. ඊයෙ ආණ්ඩු පක්ෂයෙ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමෙදීත් එෆ්පෙඩරල් පක්ෂය මේ අදහස කිව්වනේද? ඒ ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ අවංක අදහස කෙළින්ම ප්‍රකාශ කර තිබෙනවා. මෙසේ ප්‍රකාශ කිරීම ගැන තිරුචෙල්වම් ඇමතිතුමාට දොස් පවරන්න පවා ගරු අගමැතිතුමාට සිදුවී තිබෙනවා. නමුත් ඒක ඇත්තක්. ඇත්ත කීම ගැන අපි ගරුකළ යුතුයි. ඇත්ත කීම ගැන දොස් පවරන්න උවමනාවක් නැහැ. අපි දේශපාලනඥයින් වශයෙන් මහජනයා ඉදිරියට යන්නෙ අවංක හිතින් ඇත්ත ප්‍රකාශ කිරීමටයි. එෆ්පෙඩරල් පක්ෂය ඉතාමත් අවංකව තමන්ගේ අදහස ප්‍රකාශ කරනවා. රට බෙදන්න තමන් කිසිම උත්සාහයක් නොකරන බවත් එෆ්පෙඩරල් පක්ෂය පැහැදිලිව කියන ගමන්ම රටේ නියම එක්සත් කමක් ඇති කරන්න පුළුවන් වන්නෙ එෆ්පෙඩරල් ක්‍රමයෙන් බවත් ප්‍රකාශ කරනවා. මෙය සිංහල ජනතාවට කිසි සේත් පිළිගත නොහැකි තර්කයක්. අපි කොහොමවත් මෙය පිළිගන්නෙ නෑ. රටි නොයෙක් නොයෙක් "අරසු" වලට බෙදා හැරීමෙන් ලංකාව එක්සත් වෙනවයයි කීම විරුද්ධ පක්ෂය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කරන බව මේ අවස්ථාවේ දී ප්‍රසිද්ධියෙ ප්‍රකාශ කරනවා. "අරසු" යන වචනය යොදා හෝ "රට සභා" යන වචනය යොදා හෝ රට කොටස්වලට බෙදා ඒ කොටස්වලට විශෙෂ ආණ්ඩු බලතල පවරා දීමට ආණ්ඩුව උත්සාහ දරතත් විරුද්ධ පක්ෂය ඊට සම්පූර්ණ විරුද්ධත්වය පළ කරනවා.

ගරු අගමැතිතුමත් ගරු රාජ්‍ය ඇමතිතුමත් එක්සත් ජාතික පක්ෂයෙ අනෙක් මැති ඇමතිවරුනුත් ප්‍රකාශ කළේ එෆ්පෙඩරල් ප්‍රතිපත්ති පිළිගන්නෙ නැති බවයි. කතාව එහෙමයි; නමුත් ක්‍රියාව කොහොමද? අපට පෙනෙන හැටියට නම්, එෆ්පෙඩරල් ක්‍රමය මේ රටේ අඟලින් අඟලට ක්‍රමානුකූලව මුල් බැසගෙන යනවා. සිංහල භාෂාව මුළු රටේම රාජ්‍ය භාෂාව වශයෙන් එෆ්පෙඩරල් පක්ෂයත් පිළිගන්න බව ගරු රාජ්‍ය ඇමතිතුමා බොහොම ආඩම්බරයෙන් ප්‍රකාශ කළා පසුගිය දවස්වල. පළමුවැනි වතාවට උතුරු නැගෙනහිර පළාත්වල සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගෙන හමාර බව එතුමා කියා ගෙන ගියා. ජනවාරි 8 වැනිදා කිව්වෙ එහෙමයි. ඒ කීම කොයි විධියට ක්‍රියාත්මක වේද යන වග අපිත් බලාගෙන හිටිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

නමුත් අද තත්ත්වය මොකක්ද? උතුරු නැගෙනහිර පළාත්වල එකම ළමයකුට වත් සිංහල ඉගෙන ගන්න අවසරයක් නෑ. ඒ පළාත්වල ඉතාම කුඩා පාසල් ශිෂ්‍යයාට පවා තහනමක් පනවා තිබෙනවා. කාගෙ තහනමද? ෆෙඩරල් පක්ෂයෙ තහනම. හැබැයි, ෆෙඩරල් පක්ෂය උතුරු නැගෙනහිර පළාත්වල සිටින මුස්ලිම් ළමයින්ට නම් සිංහල ඉගෙන ගන්න අවසරදී තිබෙනවා. ෆෙඩරල් පක්ෂයෙ පිහිටෙන් අද ඒ ළමයින්ට සිංහල දැනීම ඇති කර ගන්න පුළුවන් වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුව ජාතික සමගියක් සහිතව එක්සත් රටක් ඇති කිරීමට ගෙන යන වැඩ පිළිවෙළ මේකයි.

උතුරු පළාතටත් නැගෙනහිර පළාතටත් සිංහල ගුරුවරුන් යවන්න තමුන්නාන්සේලාගෙ අදහසක් තිබෙනවැයි පසුගිය අයවැය විවාදයෙදී මම ගරු අගමැතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නයට එතුමා පිළිතුරු දුන්නෙ කොහොමද? ගරු අගමැතිතුමා දුන් පිළිතුර මොකක්ද? මම වෙල්වනායගම් මහත්මයාගෙන් අහල බලන්නම්; වෙල්වනායගම් මහත්මය අවසර දෙනවනම් මම සිංහල ගුරුවරු යවන්න කැමතියි කිව්ව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ගරු අගමැතිවරුන්ට මේ රටේ යම්කිසි පළාතකට සිංහල ගුරුවරුන් යවන්න පුළුවන් එක්තරා පක්ෂයක නායකතුමකුගේ අවසරය පිට පමණක් නම්, අප කල්පනා කරන්නේ අපේ නිදහසත් ඉවරය කියායි. මේ වාගේ තර්ක අප ඉදිරිපත් කරන විට මේ අය ජාතිභේද අවුස්සන උදවියය කියායි, අපට කියන්නෙ. මගේ තර්කයේ වැරැද්දක් තියෙනවද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? සිංහල මනුෂ්‍යයන් හැටියට අපට අයිතිවාසිකමක් නැද්ද, මෙවැනි ප්‍රශ්න මතු කරන්නට? එක්සත් ජාතික පක්ෂයේ පත්‍රවලින් ඉස්සර කිව්වා වගේ අපි 'මරව්, මරව්' කියන්නෙ නැහැ. අපි මිනිසුන් පොළඹවන්නෙ නැහැ, පෙවිරල් දමා මිනිසුන්ව පුච්චන්න. ඔය වගේ ද්‍රෝහී වැඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කෙරෙන්නෙ නැහැ. පසුගිය දවස්වල ඇති වූ සිද්ධීන් මම මේ අවස්ථාවේදී මතු කරන්න උත්සාහ කරන්නෙ නැහැ. මා මේ සඳහන් කරන්නේ එක්සත් ජාතික පක්ෂය දැනට ගෙන යන ව්‍යාපාරය ගැනයි. එක්සත් ජාතික පක්ෂයට ෆෙඩරල් පක්ෂයේ ආධාරය ලබා ගැනීම අවශ්‍ය බව අපි කව්රුත් පිළිගන්නවා. ඒ ආධාරය සදාකාලිකව ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. නමුත් අපේ සිංහල අයිතිවාසිකම් මොන අදහසක් උඩවත් කාටවත් පාවාදෙන්නට අප සූදානම් නැති බව මම මුළු විරුද්ධ පාර්ශ්වයම වෙනුවෙන් ප්‍රසිද්ධියේම කියා සිටින්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙල්වනායගම් මහතාගේ අවසරය පිට සිංහල භාෂාව අපේ ලංකාවේ තැන්පත් කරවා ගන්න අපට වුවමනාවක් නැහැ. නීතියෙන් සිංහල භාෂා පනත ක්‍රියාත්මක කරවීමයි, අපේ බලාපොරොත්තුව. එක්කොා නීතියක් තියෙනවා; නැත්නම් නීතියක් නැහැ. මුස්ලිම් ළමයින්ට සිංහල ඉගෙන ගන්න අවසරයක් වුවමනා නම්, දෙමළ ළමයින්ට කොහොමටවත් සිංහල ඉගෙන ගැනීම තහනම් නම් මොනවද, අප කරන මේ විකාර? 29 වැනි වගන්තියවත් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි බලපාන්නෙ. රාජ්‍ය භාෂා පනතත් නොවෙයි බලපාන්නෙ. මෙය මේ ආණ්ඩුව ගෙන යන සම්පූර්ණ කපටි ව්‍යාපාරයක් බව මම මේ අවස්ථාවේදී කියා සිටින්න කැමතියි. අපි වචන දෙකක් කථා කරන මිනිස්සු නොවෙයි. සුළු ජාතිකයන් ගැන තමුන්නාන්සේලාගේ අදහස මොකක්ද කියා අපෙන් ඇහුවොත් අපි එය ප්‍රසිද්ධියේ කියා සිටින්න ලැස්තියි. අපි සැම දෙනාම ලාංකිකයෝ. සිංහල හෝ වේවා, ද්‍රවිඩ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා බර්ගර් හෝ වේවා අපි සියළු දෙනාම ලාංකිකයෝ; මේ රටේ උරුමක්කාරයෝ. අප කාටත් මේ රටේ අයිතිවාසිකම් තියෙන්න ඕනෑ. අප අතර වෙනස්කම්—ජාති භේද ප්‍රශ්න, කුල භේද ප්‍රශ්න—වුවමනා නැහැ. විරුද්ධ පාර්ශ්වය ඔය ප්‍රශ්න ගැන සලකන්නෙ ඒ විදියටයි. සියළු දෙනාම එක සමානය කියා අපි පිළිගන්නවා. නමුත් එක වෙනසක් තියෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ක්‍රිස්තියානි කාරයෙක්. තමුන්නාන්සෙත් ක්‍රිස්තියානිකාරයෙක්. මම ඔය නැහැ, ඒක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රසිද්ධියේම කියන්න. මගේ ඡන්ද දායකයන්ගෙන් සියයට 98 ක්ම බෞද්ධයෝ. නමුත් සුළු ආගමිකයන් හැටියට අප පිළිගන්න ඕනෑ, මේ රටේ වැඩි දෙනා බෞද්ධයන් බව. බෞද්ධයන්ගේ ප්‍රයෝජනය සඳහා පෝය දින නිවාඩු දින කිරීම ට යෝජනා කළ අවස්ථාවේදී මම ක්‍රිස්තියානිකාරයෙක් හැටියට ඊට විරුද්ධ වුනේ නැහැ; මම ඊට ඉතාමත්ම සතුටු වුනා. අපේ ආගම රැක ගැනීමට අප කට යුතු කරන අවස්ථාවලදී අප කව්රුත් පිළිගන්න ඕනෑ, වැඩි දෙනාගේ අසිති වාසිකම් නැති වන්නෙ නැති හැටියට අප ක්‍රියා කළ යුතු බව. අපේ ද්‍රවිඩ මහත්වරුන්ටත් අප කියා සිටින්නෙ ඒකයි. සිංහල නොදන්න විශාල දෙමළ ජනතාවක් මේ ලංකාවේ ඉන්න බව අපි පිළිගන්නව. එවැනි අය ආණ්ඩුවේ සේවයට බැඳී සිටින බව අපි පිළිගන්නව. ඒ අයගෙන් සමහර දෙනකුට කවදාවත් සිංහල භාවිතා කරන්නට වුවමනාවක් ඇති වුනේ නැහැ. ඒ අයට අප හදිසියෙන් කිව්වොත් හෙට අනිද්දා සිංහල ඉගෙන ගන්න ඕනෑය, සිංහල ප්‍රවීණතාවක් ලබා ගන්න ඕනෑය කියා එක කරන්න බැරි දෙයක්. ඒක අපි කව්රුත් පිළිගන්නව. ඒ සමගම අපි කව්රුත් පිළිගන්නව, අනාගත පරම්පරාවට ඒ ප්‍රශ්නය නැති බව. දැන් සිටින කුඩා ළමයින්ට කිසිම අමාරුවක් නැතිව සිංහල භාෂාව ඉගෙන ගන්න පුළුවන්කම තියෙනවනේද? සිංහල භාෂාව මේ රටේ වැඩි දෙනාගේ භාෂාව හැටියට පිළිගෙන එය ඉගෙන ගන්ට අනාගතයෙදි පාසැල්වලට ඇතුළත්වන ද්‍රවිඩ ළමයින්ට බැරි මොකද? එම අදහසට ෆෙඩරල් පක්ෂය විරුද්ධයි. ඔවුන් කියනව ඊට ලෑස්ති නැති බව. සිංහල භාෂාව ඉගෙනගන්න අපේ එක ම එක ළමයෙකුටවත් ඉඩ දෙන්න අපි කැමති නැතෙයි කියා ඔවුන් කියනව. මහජාතියේ අසිතිවාසිකම් ආරක්ෂා කරන්න අපි ලෑස්ති නැතෙයි කියා සුළු ජාතියක් කියා සිටිනවා නම් කෙසේද ඔවුන් සමග එකතු වී කථා කොට මහජාතියේ ප්‍රශ්න විසඳා ගන්නේ? අපි කවදාවත් සිංහල ඉගෙන ගන්න ලෑස්ති නැතෙයි කියා ඔවුන් කියන විට එසේ කරන්නෙ කොහොමද? එසේ නොකියා, "වයස 45, 50 පැනපු අයට සිංහල ඉගෙන ගන්නය කියා බල කරන්න එපා; කරුණාකර ඒ අයට අනුකම්පා කරන්න" යනුවෙන් කියනව නම් එම තර්කය අප කාටත් පිළිගත හැකි දෙයක්. වයස 45, 50 පසු කළ අයට අමුතු භාෂාවක් ඉගෙන ගන්න ටිකක් අමාරුයි. මටත් දැන් ඒ වයසට කිට්ටු වේගෙන එනව. පුරුදු මදි නිසා මෙම ගරු සභාව ඉදිරියෙ සිංහල භාෂාවෙන් කතා කරනවිට විශෙෂ වෑයමක්, උත්සාහයක් ගෙන කතා කරන්න මටත් සිදු වෙනව.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
දැන් හොඳයි.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப் ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
බෙහොම ස්තුතියි. "අපි ලෑස්ති නැහැ සිංහල භාෂාව ඉගෙන ගන්න" යනුවෙන් එම පිරිස කියනව නම් අපි එම පිරිසට කියන්නෙ මෙයයි: "තමුන්නාන්සෙලා ගෙ අදහස අපට පිළිගන්න බැහැ. එය අපි ප්‍රතික්ෂෙප කරනව; ඊට විරුද්ධව සටන් කරන්ට අපට සිදු වෙනව."

රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අහනව, ඇයි තමුන්නාන්සෙල අපත් සමග එකට එකතු වී මේසයක් වටේ වාඩි වෙලා මේ ගැන සාකච්ඡා නොකරන්නෙ යනුවෙන්. ෆෙඩරල් වාදය පිළිබඳව ආණ්ඩු පක්ෂය තුළවත් පැහැදිලි අදහසක් තියෙනවද කියන ප්‍රශ්නය මා අහන්ට ඕනෑ. තමුන්නාන්සෙලත් නිතර නිතර මේස වටේ ඉඳගෙන කතා කරනව. [බාධා කිරීමක්] කැබිනට් මේසෙ එහෙම. දින පතා සතිපතා කරනව. මොනව ගැනද ඒ කතා කරන්නෙ? ෆෙඩරල් වාදය පිළිබඳව තමුන්නාන්සෙලගෙ අදහස කුමක්ද? ඒ අයගෙ අදහස් තමුන්නාන්සෙල පිළිගන්නවද, නැද්ද? රටේ ප්‍රශ්න විසඳන්ට පුළුවන් වන්නෙ ෆෙඩරල් ක්‍රමයෙන් පමණය කියා පළාත් පාලන ඇමතිතුමා කියනව. නමුත් ගරු අගමැතිතුමා කියනව, තමුන්නාන්සෙ ඔවැනි ප්‍රකාශ කිරීම නිසා මට හිසේ රදය ඇති වෙනවය යනුවෙන්. [බාධා කිරීමක්] බඩේ අමාරුව. ආණ්ඩු පක්ෂය තුළවත් විසඳගන්ට බැරි වී තිබෙන මෙම ප්‍රශ්නය විරුද්ධ පාර්ශ්වයෙ සහයෝගයෙන් විසඳගන්ට පුළුවන් වන්නෙ කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

අපි ලැස්තියි, අපේ අදහස පැහැදිලිව කියන්ට. ඒ අය සිංහල ඉගෙනීමට සූදානමින් සිටින බව කියනව නම් ද්‍රවිඩ ජනතාවත් සමග ඇති ප්‍රශ්න සියයට සිය යක්ම බේරා ගන්ට අපට පුළුවන් වෙනව ඇති. කන්කසන්තුරෙයිහි ගරු මන්ත්‍රීතුමා (චෙල්වනායගම් මයා.) සහ එතුමගෙ අනිකුත් මිත්‍ර මන්ත්‍රීතුමන්ල එකතු වී අනාගතයෙදි එය කරන්ට සූදානම්ය කියා ප්‍රකාශ කරනව නම් ඉතිරි කටයුතු සියල්ලක්ම බේරා ගන්ට අපට හැකි වෙනව ඇති කිසිම අමාරුවක් නැතුව. ආණ්ඩුවෙ රෙගුලාසි, රජයේ සේවකයන්ගෙ ප්‍රවීණතා ප්‍රශ්න යනාදි සියල්ලක්ම බොහොම ලෙහෙසියෙන් බේරගන්ට අපට පුළුවනි. නමුත් "අපි කවදාවත් සිංහල අකුරක්වත් ඉගෙන ගන්ට සූදානම් නැත; අපේ ළමයින්ට සිංහල හෝඩියවත් උගන්වනවට අපි විරුද්ධය" කියා ද්‍රවිඩ පිරිස කියා සිටිනව නම් කෙසේද අපි අපේ ලංකාව තුළ එකම රටවැසියන් වශයෙන් ආඩම්බරයෙන් අපේ ජීවිත ගත කිරීමේ නිදහස ආරක්ෂා කර ගන්නෙ? ඒකයි, ප්‍රශ්නය. අපි මෙහෙම කියන විට "තමුන්නාන්සෙල ජාති බේද අවුස්සන මිනිස්සු" කියා අපට විරුද්ධව නඩු පවරන්න සූදානම් වෙනව. නමුත් අපි ඒ නඩුවලින් ගැලවෙනව.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
බැරි වුණොත් හිරේ යනව.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

බැරි වුණොත් හිරේ යනව. ඒකට කමක් නැහැ. නමුත් අපේ ජාතික අයිති වාසිකම් මේ අන්දමේ විකාර තත්ත්වයකින් කාගෙවත් ඔන්නකමකට අනුව පාවා දෙන්ට අපි ලැස්ති නැහැ. ඒක කෙරෙන්නෙ නැහැ. නමුත් අපෙන් අහනව, ඇයි මේව බේරගන්න අපි ලැස්ති නැත්තෙ යනුවෙන්. මූලික ප්‍රතිපත්ති භාර නොගෙන නිකම් මේස වටේ වාඩි වෙලා කතා කළාට වැඩක් නැහැ. දැන්වත් දෙමළ ළමයින්ට සිංහල ඉගැන්වීමට ආණ්ඩුවෙ ප්‍රතිපත්තියක් නැද්ද? දැන් මුස්ලිම් ළමයින්ට [illegible] එය ප්‍රතිපත්තියක් වෙලා තියෙනව චෙල්වනායගම් මැතිතුමාගෙ අවසරය පිට. මුස්ලිම් ජනතාවට එම අයිතිය ගන්ට චෙල්වනායගම් මැතිතුමාගෙ අවසරය වුව මනා නැහැ. මුස්ලිම් ජනතාව සදාකාලිකවම පිළිගෙන හමාරයි ඒ අය ලාංකිකයන් වශයෙන් සිංහල ජනතාව සමග එකට ජීවත් වන්නට සිටින බව. අපි ඒ අයට ගරු කළ යුතුයි. අපි ඒ අය ගැන ආඩම්බර විය යුතුයි. සටන්කොට එම අයිතිය ලබාගැනීම ගැන සෑම පක්ෂයකම සිටින—ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය සහ ෆෙඩරල් පක්ෂය වැනි සෑම පක්ෂය කම—මුස්ලිම් මන්ත්‍රීවරුන්ට ප්‍රශංසා කළ යුතුයි. මූලික අයිතිවාසිකම් ගැන අපෙන් අහනවා. මූලික අයිතිවාසිකම් අවශ්‍ය බව ඇත්තයි. එහෙත් මෙවැනි තත්ත්වයක් තිබෙද්දී අපේ ජාතීන් දෙක මූලික අයිති වාසිකම් පිළිබඳ ප්‍රශ්නයක් මතු කරන්නෙ කොහොමද? මේ භේද නැති කර ගැනීමට අපට වුවමනාවක් තිබෙනවා නම් එය කළ හැක්කේ සාකච්ඡාවෙන් බව ඇත්තයි. එසේ වුවද ආණ්ඩුව තුළම මේ ප්‍රශ්නය විසඳා ගන්නට ආණ්ඩුවට බැරි කමක් තිබෙනවා නම් අපත් සමඟ සාකච්ඡා කිරීමෙන් එය පුළුවන් වන්නෙ කොහොමද? අපත් ඇඳා ගැනීමෙන් ඒ ගොල්ලන් බලාපොරොත්තු වන්නෙ වෙනත් දෙයකුයි. ඒ ගොල්ලන්ට බේරෙන්නට බැරි නිසා අපත් මේකෙ කොණකට ගාවා ගන්නටයි, මේ උත්සාහ කරන්නෙ. දෙගොල්ලන්ම වාඩි වෙලා කථා කළොත් මේකට ගැවෙන්නෙ ඒ ගොල්ලන් පමණක් නොවෙයි. අද ඔය විධියට කථා කරන අය එදා ක්‍රියා කෙළේ කොහොමද? එදා පුළුවන් තරම් දුරට උත්සාහ කෙළේ අප පමණක් ගාවන්නයි. එදා විරුද්ධ පාර්ශ්වය ඒකමතිකව සිට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පරාජයට පත් කළ බව ඇත්තයි. අප එදා ඒ විධියට කළ නිසා රට බෙදීම දක්වන සිතියම් ඇඳ ඒවා පෙට්රල් ෂෙඩ්ස් ගාණෙත් තව තව තැන් වලත් ප්‍රදර්ශනය කරන්නට පටන් ගත්තා නේද? රට හැම තැනම ගොස් කීවේ, "අන්න සිරිම චෙල්වනායගම්ට කේක් කෑල්ලෙන් වැඩි හරියක් [illegible]" කියලයි.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

එදා බණ්ඩාරනායක—වෙල්වනායගම් ගිවිසුමට විරුද්ධව එක්සත් ජාතික පක්ෂයේ මහා යෝධයා වශයෙන් සිටින රාජ්‍ය ඇමතිතුමා දළදා මාලිගාව කරා යෑමට පෙළපාලියක් සූදානම් කළා නේද? ඒ පෙළපාලිය පටන් ගත්තේ කැළණි පාලම ළඟිනුයි. පෙළපාලිය ටික දුරක් ගියා. ලංකාව පාගාගෙන සිටින සිතියමකුත් ප්‍රදර්ශනය කරමිනුයි එසේ ගියේ. ඉතින් කවුද ජාතිභේදය ඇවිස්සුවේ? "මරව් මරව්" යනුවෙන් ලීවේ කවුද? "මරව් මරව්" යනුවෙන් ලීවේ "සියරට" පත්‍රය නේද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නම් ඒ පත්‍රය සමඟ සම්බන්ධකමක් නැහැ. එදා ඒ විධියට ක්‍රියා කළ අය අද උපාසක අම්මලා මෙන් වාඩි වී අපට බණ දේශනා කරනවා. "ඇයි අප සමඟ එකතු වන්නෙ නැත්තෙ?" යනුවෙන් අපෙන් ප්‍රශ්න කරනවා.

විරුද්ධ පාර්ශ්වය ෆෙඩරල් පක්ෂයත් සමඟ එකතු වී එදා එක්සත් ජාතික පක්ෂයේ ආණඩුව පරාජයට පත් කළා. ඊළඟට ඇති වූ මහා මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණඩුවක් පිහිටුවන්නට පුළුවන් වුණා. ඉතින් ඒ ආණඩුව සිංහල ජාතිය පාවා දුන්නාද? රට බෙදුවාද? රට පාවා දුන්නාද? පාවා දීමක් සිදු වුණා යයි යම් කොටසක් කියා සිටියා නම් එසේ කියා සිටියේ ෆෙඩරල් පක්ෂයේ උදවියයි. අපට විරුද්ධව පාවා දීමේ චෝදනා එල්ල කළා නම් එසේ කෙළේ ෆෙඩරල් පක්ෂයයි. ඒ කාරණා ගැන මීට පෙර ඕනෑ තරම් කථා කර තිබෙනවා. අපේ අදහස් ප්‍රසිද්ධියේම ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශ කර තිබෙනවා. අප කවදාවත් පාවා දීමේ පොරොන්දුවක් ඇති කර ගත්තේ නැහැ. ෆෙඩරල් පක්ෂය සමඟ පොරොන්දුවක් ඇති කර ගත්තේ නැහැ. අප ප්‍රසිද්ධියේ ඒ ගැන කරුණු ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා 1957 දී වෙල්වනායගම් මහතාත් සමඟ ගිවිසුමක් ඇති කර ගත් බව අප දන්නවා. බණ්ඩාරනායක මහතා ඒ ගිවිසුම ඇති කර ගත්තායින් පසු හැංගිමුත්තන් ක්‍රීඩාවක යෙදුණේ නැහැ. එතුමා ගිවිසුමකට අත්සන් තැබුවා නම් ඊට පසු ප්‍රථමයෙන්ම කෙළේ එය මහජනතාවට පෙන්නීමයි. "මෙන්න මගේ ගිවිසුම. මේක ගැන මැනලා කිරලා බලන්න" යනුවෙන් ප්‍රකාශ කොට එතුමා ඒ ගිවිසුම ප්‍රසිද්ධියට පත් කළා. ඒ මිස එතුමා කවදාවත් ඒ ගිවිසුම හොර රහසේ කොට්ටය අස්සේ ගසා තැබුවේ නැහැ. වර්තමාන අගමැතිතුමා වගේ ඒ ගිවිසුම කොට්ටය අස්සේ ගසා තැබුවේ නැහැ. අපේ වර්තමාන අගමැතිතුමාගේ ගිවිසුම දැන් තිබෙන්නේ සේප්පුවෙයි. ඒ ගිවිසුම මේ ගරු සභාවට පෙන්වන්නෙත් නැහැ. නමුත් දැන් අපට කියන්නේ රට පාවා දී නැති බවයි. මෙවැනි අදහස් දරණ ආණඩුවක් සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් අපේ සිංහල ජාතියේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්නට පුළුවන් වෙතැයි අප විශ්වාස කරන්නෙ කොහොමද? ඒ විශ්වාසය උඩ අප කටයුතු කර ගෙන යන්නෙ කොහොමද? ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා, යෝජනාව සංශෝධනය කරන්ට කැමතියි කියා. මා අහන්ට කැමතියි, මොකද අපේ යෝජනාවෙ තිබෙන වරද කියා. අපේ සිංහල ජාතියේ අයිතිවාසිකම් රැක ගැනීමට අවශ්‍ය සෑම වාක්‍යයක්ම ඇතුළත් කරලයි, මුළු විරුද්ධ පාර්ශ්වයම වෙනුවෙන් අපි අපේ යෝජනාව ඉදිරිපත් කළේ. සිංහල ජාතියට කිසිම හානියක් නොවන විධියට අකුරෙන් අකුර ගැන කල්පනා කර බලලයි අපේ යෝජනාව අපි සකස් කර ඉදිරිපත් කළේ. එහෙත්, අපේ යෝජනාව නරකලු! අපේ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. මේ යෝජනාව හොඳයි! මේ යෝජනාව එහෙන් මෙහෙන් සංශෝධනය කරන්ටත් ගරු රාජ්‍ය ඇමතිතුමා ලැහැස්තියි. ඇයි? මම කියන්නම් යෝජනා දෙකේ තිබෙන වෙනස. ආණඩුව ඉදිරිපත් කර තිබෙන යෝජනාව අනුව ඕනෑම වෙනසක් කර ගන්ටත් පුළුවන්; ඒ වගේම ඕනෑම දෙයක් ඉතුරු කර ගන්ටත් පුළුවන්. දැන් පවතින ආණ්ඩු ක්‍රමය කිසිම වෙනසක් නැතිව තබා ගන්ට බලාපොරොත්තු වෙනව නම් මේ යෝජනාව යටතෙ ඒකත් කළ හැකියි. 29 වැනි වගන්තිය වෙනස් නොකරන්ට අදහස් කරනව නම්, ඒකත් වෙනස් නොකර ඉන්ට පුළුවන්කම තිබෙනව. රාජ්‍ය ඇමතිතුමා හදා තිබෙන යෝජනාවේ අඟය ඒකයි. වෙල්වනායගම් මහත්මයාට අවශ්‍ය සියල්ලක්ම දිය හැකි යෝජනාවක් ඒක. ෆෙඩරල් ක්‍රමයක් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

රටේ ක්‍රියාත්මක කරවන්ට වුවමනාවක් තිබෙනව නම් මෙන්න යෝජනාව ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකයි, අප මේකට විරුද්ධ වෙන්නෙ.

අපේ යෝජනාවට ගරු රාජ්‍ය ඇමතිතුමා විරුද්ධ වෙන්නෙ ඇයි කියා මා දන්නව. අපේ යෝජනාව ආණ්ඩුව පිළිගත්තොත් ෆෙඩරල් පක්ෂයට ඉන්ට බැහැ. ඒ බව එතුමා හොඳහැටි දන්නව. එහෙම වුණොත් ෆෙඩරල් පක්ෂයට ඉන්ට බැහැ. ඒ වගේම ෆෙඩරල් ක්‍රමයක් කවදාවත් ලංකාවේ ඇති වෙන්නෙ නැහැ, අපේ යෝජනාව අනුව. ඒකයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. රාජ්‍ය ඇමතිතුමා දිගට-හරහට කථා කරල කියනව, තමුන්නාන්සේලාගේ සහයෝගය අප බලාපොරොත්තු වෙනව කියා. සහයෝගය නොලැබුණොත් අපි තමුන්නාන්සේලා අදහස් කළ වැඩේම කරනවා යයි කියනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අදහස් කරන වැඩේ රාජ්‍ය ඇමතිතුමාට කවදාවත් කරන්ට බැහැ. ෆෙඩරල් පක්ෂය විරුද්ධයි. කොහොමද ඒක කරන්නෙ? උන්නැහේගේ අත-පය දෙකම බැඳල; හෙළ වෙන්ටවත් බැහැ. උන්නැහේට හෙළ වෙන්ට පුළුවන්කම තිබෙන්නෙ සතොස ගබඩාවෙ පමණයි. පෞද්ගලික අංශයත් සතොස ගබඩාව තුළ හොළවන්ට පුළුවන්. එච්චරයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේට එච්චරවත් බැහැ.

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මට ඕනෑත් නැහැ. අපි ඒ සෙල්ලම් කළේ හුගක් කාලයකට ඉස්සර වෙලා. දැන් වයස ගිහින් වැඩියි. ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා කොතරම් දුරට කථා කරන්ට උත්සාහ දැරුවත් එතුමා හොඳින්ම දන්නව, මේක නොකෙරෙන වැඩක් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේට මතකද, එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයේ තිබුණු දේවල්? තමුන්නාන්සෙත් ඒක උඩනෙ, හළාවත ආසනය දිනල ආවෙ. ඒ මැතිවරණ ප්‍රකාශනයේ භාෂා ප්‍රශ්නය ගැන මොකක් ද කියල තිබුණේ? වට මේස සාකච්ඡාවක් පවත්වා භාෂා ප්‍රශ්නය විසඳන්ටයි, එක්සත් ජාතික පක්ෂය උත්සාහ දරන්නෙ කියා එහි සඳහන් කර තිබුණ. කෝ වට මේස සාකච්ඡාව? වට මේස සාකච්ඡාවට මොක ද වුණේ? අපි දන්නව, වුණු වැඩේ මොකක්ද කියා. මා කලින් මතක් කළ රහස් ගිවිසුම ඇති කර ගත්ත. ඒව වට මේස සාකච්ඡාවලින් නොවෙයි කර ගත්තෙ; ඇඳන් යට නැත්නම් මේස යටයි. එහෙම කර ගෙන භාෂා ප්‍රශ්නය උඩ රාජ්‍ය ඇමතිවරයයි අගමැතිවරයයි සම්පූර්ණයෙන්ම සිංහලයන්ගේ අයිතිවාසිකම් පාවා දුන්න, ෆෙඩරල් පක්ෂයට. හොඳයි, ප්‍රජාතන්ත්‍රවාදය ඒක නම් අපි පිළිගන්නම්; අපිත් ලැහැස්තියි, ප්‍රජාතන්ත්‍රවාදය භුක්ති විඳින්ට. නමුත් ප්‍රජාතන්ත්‍රවාදයෙන් ලැබෙන පිළිතුරු දැන් අතුරු මැතිවරණවලින් පසුව එක්සත් ජාතික පක්ෂයට ටිකක් ඉව වැටිගෙන එනව. අනාගතයේදී ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිඵල තවදුරටත් ලැබෙයි. අතුරු මැතිවරණ තවත් එනව. ආසන අහිමි වන ප්‍රමාණයට අපිත් ලැස්තියි, සටන් කරල සිංහලයා වෙනුවෙන් ජය ගන්න. අපි සිංහල ප්‍රශ්නය මුල් කර ගෙනයි, අපේ මැතිවරණ ව්‍යාපාර සියල්ලක්ම ගෙන යන්නෙ. අපි හංගාගෙන නොවෙයි, කථා කරන්නෙ. අපි එදා හැම තැනම ප්‍රසිද්ධියේ කිව්ව. බෙන්තර-ඇල්පිටියෙත් කිව්ව. බේරුවලටත් හුළඟ ටිකක් වැදිල තිබෙනව.

නියෝජ්‍ය කථානායකතුමනි, අපේ යාපනේ මන්ත්‍රීතුමාත් (ජී. ජී. පොන්නම්බලම් මයා.) වට මේස සාකච්ඡාවක් ගැන කථා කළා, එදා. උන්නැහෙට ඕනෑවෙලා තිබෙන්නෙ, තමන්ට පක්ෂ අයගෙන් සැදුණු වට මේස සාකච්ඡාවක් පමණයි. හරියට එක්සත් ජාතීන්ගෙ සංවිධානයෙදි වගේ, අප්පුඩි ගහන පිරිසක් පමණයි එතුමා බලාපොරොත්තු වන්නෙ. උන්නැහෙගෙ කථාවලට අප්පුඩි ගහනව නම් උන්නැහෙට සෑම දෙයක්ම ජොලි. අප්පුඩි ගහන්නෙ නැතුව රවල බලනව නම්, මේ වට මේස සාකච්ඡාවලින් උන්නැහෙට වැඩක් නැහැ.

උන්නැහෙ මේ ළඟකදි පාර්ලිමේන්තුවේදි කිව්ව නේද, පිෆලික්ස් ඩයස් බණ්ඩාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නායක මහත්මය පාර්ලිමේන්තුවේ ඉන්න තුරු මම වට මේස සාකච්ඡාවකට යන්නෙ නැත කියල? එතුමා දන්නව මම රැව ටෙන්නෙ නැති බව. එතුමා දක්ෂ කෙනෙක් බව මම පිළිගන්නව. නියෝජ්‍ය කථානායකතුමනි, උන්නැහෙ දවස් 9 ක් තිස්සෙ මගෙන් හරස් ප්‍රශ්න ඇහුවත් බැරුව ගියා ඕනෑ කරන දේ කියව ගන්න.

හිතට එකඟව මේ රටේ ප්‍රශ්න විසඳන්ට තමුන්නාන්සෙලගෙ බලාපොරොත්තුවක් නැත්නම්, අපි ලෑස්ති නෑ තමුන්නාන්සෙලට සහාය වෙන්න. අපේ රටේ ජනතාව වෙනුවෙන් අප තුළ සාධාරණ බියක් තිබෙනව. මේ වගෙ වැඩ පිළිවෙළක් මේ රටේ ගෙන යන්න ඉඩ දුන්නොත් අපි යටත් වන්නෙ, ෆැසිස්ට් ක්‍රමයකටයි. ඒ නිසා අපි ඊට ඉඩ දෙන්නෙ නැහැ. තමුන්නාන්සෙල අපෙන් අහනව, සාකච්ඡාවකට එන්න ලෑස්තිද කියල. තමුන්නාන්සෙල උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ළමයින්ට සිංහල උගැන්වීම පටන් ගන්න දවසෙ පටන් තමුන්නාන්සෙල කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබල, තමුන්නාන්සෙලාට සෑම ආධාරයක්ම දෙන්න අපි ලෑස්ති බව කෙළින්ම කියන්න කැමතියි. හැබැයි, එතෙක් බැහැ.

පළමු වැනි වරට සිංහල භාෂාව උතුරු නැගෙනහිර පළාත් වාසින් පිළිගෙන තිබෙන බව රාජ්‍ය ඇමතිතුමා කිව්ව. කවුද පිළිගත්තෙ? සපත්තු පහරිනුයි, පිළිගත්තෙ. රහස් ගිවිසුම නිසා චෙල්වනායගම් මහත්මයාගෙන් අවසර ගන්නෙ නැතුව ඒකවත් කරන්ට බැහැ. ඒ නිසා එක දෙමළ ළමයකුටවත් සිංහල උගන්වන්ට බැරි වුණා.

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපෙන් සහයෝගය ඉල්ලනව. අපි ඕවට ගෑවෙන්නෙ නැහැ. අපි එන්නෙත් නෑ, සාකච්ඡා සභාවෙ කොටස්කාරයන් වන්නෙත් නෑ. තමුන්නාන්සේලාගෙ වැඩි ඡන්දයෙන් රෙගුලාසි සම්මත කර ගන්නය කියල අපි ප්‍රසිද්ධියෙ කියනව. එහෙම සම්මත කර ගත්තාට පස්සෙ ඊළඟට බලන්න, රට පිළිගන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන්ට තමුන්නාන්සෙලාට පුළුවන්ද කියා. ඒක රට පිළිගන්නවද නැද්ද කියල ඊට පස්සෙ අපි සෝදිසි කර බලමු. ආණ්ඩු බලය ලබා ගෙන අවුරුදු 1 1/2 කට පස්සෙ එක අතුරු මැතිවරණයක්වත් දිනන්න බැරි වුණු ආණ්ඩුවක් කථා කරනව, රටේ පිළිගැනීම ගැන.

කොහොමද, මේක මනින්න යන්නෙ? මහ මැතිවරණයක් තිබ්බොත්? එහෙත් ඒ බවක් අපට පෙනෙන්න නැහැ. බාගවෙලා වට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්ට වෙයි, මැතිවරණයක් නැතිව ආණ්ඩුව දිගටම ගෙනියන්න. ඒකයි සිද්ධ වන්නෙ. මට පෙනෙනව, වත්තල ගරු මන්ත්‍රීතුමා (ෂෙල්ටන් ජයසිංහ මයා.) ඒක බොහොම සතුටින් පිළිගන්න බව. ඔලුව වන වනා පිළිගන්නව. වත්තල ආසනය බේරගන්ට අවශ්‍ය නම් ඒක තමයි, හොඳම ක්‍රමය. නැත්නම් ඉතුරු කෙස් ටිකත් යයි.

සිදු වන දේවල් අපිට පෙනෙනව. ඇයි, අපේ මූලික ප්‍රශ්න පිළිගන්නෙ නැත්තෙ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනව නම්, ඉස්සෙල්ලාම අපේ ජනතාව ගැන කල්පනා නොකරන්නෙ ඇයි? මොකක්ද, අපේ මූලික ප්‍රශ්නය? රැකීරක්ෂා ප්‍රශ්නය. රාජ්‍ය ඇමතිතුමා රැට හුගක් පොත් කියවනව ඇති. මාත් කියවනව. ඒ පොත්වල තිබෙන්නෙ මොකක්ද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
රැට වෙන වැඩ තිබෙනව.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
පෞද්ගලික අංශයෙ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සෙට බැරි දේවල්.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
ඒව, මම කරන්නෙ නැති දේවල්.

රාජ්‍ය ඇමතිතුමා කියවා ඇති, සමාජවාදී රටවල තිබෙන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා. ආණ්ඩුවක පළමු වැනි යුතුකම් සෑම රටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

වැසියකුටම රක්ෂාවක් ලබා දීම ඔව් වයෙ සඳහන් කර තිබෙනවා. රුසියාවෙත්, වෙනත් සමාජවාදී රටවල් කීපයකමත් මූලික අදහස ඒකයි. අපේ වර්තමාන සමාජවාදී එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුවට එහෙම අදහසක් තවම ඇති වුණේ නැහැ.

එය පමණක්ද? දැන් කල්පනා කරගෙන යනවා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා පණතක් හදන්න. එංගලන්තයේ සිටින නෛක ශ්‍රීන් විරාජමාන දෙවන එලිසබෙත් මහා රාජිනිය මරා දමන්න යනවය කියනවා මේ නීතියෙන්. අප කාටවත් වුවමනා කරන්නෙ නැහැ මහා රාජිනිය නැති කරන්න. ඒ කොයි හැටි වෙතත්, එක යල් පැනපු ස්ථාවර නියෝගයක්වත් මේ ගරු සභාවෙන් ඉවත් කරන්න මේ ආණ්ඩුව සූදානම් නැහැ. "සුඛී හුඩිචේ" කියන අදහස තවමත් ඒ විධියටම ආරක්ෂා කරගෙන ඉන්නට. මේවා ඔය ආකාරයට ආරක්ෂා කර ගන්න අතරම අපට කියන්නෙ ඒ උදවිය සමාජවාදයට හරවන්න සූදානමින් ඉන්න බවයි. ඒ විධියට කිව්වට විතරක් සෑහෙනවද?

සිංහල භාෂාව සම්බන්ධයෙන් තමුන්නාන්සෙලා දරණ අදහස මොකක්දැයි අහන්න කැමතියි. සිංහල භාෂාව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ඇතුළත තැන්පත් කරන්න—ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් විරුද්ධත්වයක් ඇති නොවන තත්ත්වයක් ලබා දෙන්න—තමුන්නාන්සෙලා ලෑස්තිද? ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවලට විරුද්ධ නොවන දෙයක් හැටියට බෞද්ධාගම රාජ්‍යාගම හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ තැන්පත් කරන්න තමුන්නාන්සෙලා ලෑස්තිද? මේ ප්‍රශ්නවලට පැහැදිලි පිළිතුරු වුවමනා කරනවා. මුළු රටම ඒ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා. විරුද්ධ පාර්ශ්වයේ ඉන්න අපේ අදහස නම් ඉතාමත් පැහැදිලි අන්දමට දැනටමත් ප්‍රකාශ කර තිබෙනවා. මීට පෙර රාජාසන කථාවලින් සහ වෙනත් ක්‍රමවලින් මේ ගරු සභාව මගින් මුළු රටටම ඒ ගැන පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබෙනවා. නොයෙක් අවස්ථාවලදී නොයෙක් තැන්වලදී අපේ තත්ත්වය පැහැදිලි කරමින් අප නිකුත් කළ ප්‍රකාශන තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් අපේ ප්‍රතිපත්ති සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කරන්න අපට බැරි වූ බව ඇත්තයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ අගය ගැන කියා පාමින් තමුන්නාන්සෙල එවකට අප සමග යිටි සී. පී. ද සිල්වා උන්නැහේව තමුන්නාන්සෙලාගෙ පැත්තට ගත් නිසා අපට ඒවා ඒ විධියට කරගෙන යන්ට බැරි වුණා. අපේ අදහස් අප ඉදිරිපත් කර තිබෙනවා. ඉතින් ඒ ගැන තමුන්නාන්සෙලාගෙ අදහස් මොනවද?

දැන් ඔය පැත්තෙ කටවල් හතකින් කථා කරනවා, මේ හත් හවුලෙ මාර්ගයෙන්. ඔය අතරෙ පොන්නම්බලම් මැතිතුමා කියනවා, ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථා පණතේ 29 වැනි වගන්තිය එක අකුරකින්වත් වෙනස් කරන්න ඉඩ දෙන්නෙ නැහැ කියල. නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්‍යී නාගනාතන්) කියන්නෙ මොනවද? එතුමා කියන දේ අපට දැන ගන්න ලැබෙනවා. එතුමා කියන හැටියට මේ රටේ ප්‍රශ්න විසඳන්න පුළුවන් වන්නෙ ෆෙඩරල් ක්‍රමයකින් පමණක් බවයි හිතාගන්න තිබෙන්නෙ. ඔය මා ඉදිරිපත් කළ අදහස ඒ අය පැහැදිලිවම කියා තිබෙනවා. එය මුළු රටම දන්නවා. නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට එක් වචනයකින් පමණයි පිළිතුරු දෙන්න තිබෙන්නෙ. එය ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් වෙන්නෙ Thy Kingdom come කියලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නිකම් බොරුවට මෙහි සිට අප අතර කිසිම වෙනසක් නැතැයි මහජනයට පෙන්නුම් කර දෙන්න බලනවා නම් එය හරිද? මෙය සුළු දෙයක්ය, එහෙත් විරුද්ධ පාර්ශ්වය නිකම් බොරුවටයි මීට විරුද්ධ වන්නෙ, යන අදහසක් මහජනයට දෙන්න උත්සාහ කරනවා නම් එය හරිද? මට මේ අවස්ථාවෙදි මොන්ටෙස්කිව්, ඇලෙක්සැන්ඩර් ඩයිසි වැනි උදවිය කියා තිබෙන දේවල් මතක් වෙනවා. ටිකක් වෙනස් කරනවද, හුඟක් වෙනස් කරනවද කියන ප්‍රශ්නයක් නොවෙයි මෙහි තිබෙන්නෙ. රට, ජාතිය ආරක්ෂා වන හැටියට ආණ්ඩුව ක්‍රියා නොකරනවා නම් මේ ආණ්ඩුවට කොහොමද සහයෝගය දෙන්නෙ? මූලික කරුණු සම්බන්ධයෙන් එකඟත්වයක් නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස් කිරීම කරන්න බැරි දෙයක්. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉදිරිපත් කළ අදහස මාත් පිළිගන්නවා. ආණ්ඩුවක් හැදීමට, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා පණතක් හැදීමට, නෛකශ්‍රින් විරාජමාන දෙවන එලිසබෙත් මහා රාණියගෙන් ලැබෙන බලතල උඩ නොවෙයි සූදානම් විය යුත්තෙ. අපට වුවමනා දේවල් ඉටු කර ගැනීමට තරම් ශක්තිමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදීමට අප ඉදිරිපත් විය යුත්තෙ අපේ ලංකාවේ සිටින මහජනතාව ගේ බලතල උඩයි. එය ඇත්තයි. ඒ ගැන තවත් සැකයක් ඇති වෙන්න වුවමනාවක් නැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා, මේ වැඩ පිළිවෙළ සතුටුදායකය කියා. මේ කම්වුව පත් කළාට පස්සෙ මහජනයාගෙන් අපට බලය ලබා ගන්න බැරි ඇයිදැයි එතුමා අහනවා. ඒකත් ඇත්ත. මාත් එය පිළිගන්නවා. මම මේ ආකාරයට කියන්නම්: තමුන්නාන්සේල නීතිය හදාගෙන මහජනයා ඉදිරියට යන්න. අපි කල් ඉල්ලන්නෙ නැහැ. මේ දක්වාම අපි කල් ඉල්ලා නැහැ.

අවශ්‍යයයි තමන් කල්පනා කරන ඕනෑම නීතියක් මේ ගරු සභාවට ගෙන එන්න වුවමනා නම්, ආණ්ඩු පක්ෂයට ඒ සඳහා සම්පූර්ණ බලය තිබෙනවා. එක්තරා තීරණයක් ගැන විරුද්ධ පාර්ශ්වයේ ඉන්න අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්න අප උත්සාහ දරුවා. ඊට අපට ඉඩක් නොලැබුණු නිසා අපි ගියා යන්න. ඊට පසු ආණ්ඩුවට ඕනෑම දෙයක් කර ගන්න නිදහස තිබුණා. ආණ්ඩුවට ඕනෑම නීතියක් පනවා ගන්න ඉඩ තිබුණා. මාස දෙකහමාරක කාලයක් ඒ සඳහා ආණ්ඩුවට තිබුණා. ඕනෑම නීතියක් පාස් කරවා ගන්න ආණ්ඩුව අදහස් කළා නම් ඊට ඉඩ තිබුණා. ඒ ගැන අපේ විරුද්ධත්වයක් තිබුණේ නැහැ. ඉතින් කර තිබෙන්නෙ මොනවද? කොයි තරම් ලක්ෂණට ඒ කාලයේදී රටේ ප්‍රශ්න විසඳා තිබෙනවද? හැබැයි ඒ කාලෙ නේස්ප්‍රේ කිරිපිටි හිඟය මඟ හැරී ගියේ නැහැ. අපේ වැඩ නිසාද එහෙම වුණේ? අප නිසාද බඩු හිඟයක් ඇති වුණේ? විරුද්ධ පාර්ශ්වය නැති වූ නිසාද බඩු නැතිව ගියෙ? ප්‍රශ්න විසඳීමට ඕනෑම නීතියක් පාස් කරවා ගන්න තිබුණා. නින්දගම් පණතක් ලොකුවට ගෙනාවෙ අප නොසිටි අවස්ථාවෙ නේද? අද දක්වා එය පාස් කර ගන්න බැරි වුණා. අමිර්තලිංගම් මහත්මයත් පොන්නම් බලම් මහත්මයත් කියන්නෙ අපි දොම්පෙ මන්ත්‍රීතුමාගේ අදහස් පිළිගන්නෙ නැහැ කියායි. ඒ පක්ෂ මේ රටේ රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල භාෂාව පමණක් පිළිගන්නෙ නැති බව මම දන්නවා. මම කොපමණ කතා කළත් ඒ උදව්ය අපේ පැත්තට හරවා ගන්න බැරි බවත් මම දන්නවා. ඒ වගෙම, පෙඩරල් පක්ෂය මට කොපමණ බණ කිව්වත් මම ඒ අයගෙ පැත්තට හැරෙන්නෙත් නැහැ. මෙය මගෙ පෞද්ගලික අදහසක් නොව මුළු විරුද්ධ පක්ෂයෙම අදහසයි. එම නිසා ආණ්ඩු පක්ෂයෙ අයත් සමග එකතු වී මේ ගැන කතා කරමින් කාලවේලාව ගත කරන්න වුවමනාවක් නෑ. තමුන්නාන්සෙලම එකතු වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන හැටි කථා කරගන්න. කොමිටියට වුවමනා කරන 15 දෙනාම තමුන්නාන්සේලාගේ පැත්තෙන්ම පත් කර ගන්න. ආණ්ඩුවට පක්ෂ 7ක්ම තියෙන නිසා ඒක ලේසියෙන් කරන්න පුළුවනි. එසේ එකතු වී තමුන්නාන්සේලාට ඕනෑ පිළිවෙළකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදාගෙන ඊට පසු එය පාර්ලිමේන්තුවටත් මහජනතාවටත් ඉදිරිපත් කරන්න. ඒ පිළිවෙළට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම සම්බන්ධයෙන් රටේ පක්ෂපාත පිළිගැනීමක් ලබා ගන්න තමුන්නාන්සෙලාට පුළුවන්. නමුත් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නෑ. හැබැයි එවැනි ක්‍රමයක් මහජනතාවට ඉදිරිපත් කළ දාට තමුන්නාන්සේලාට පහර වැදෙනවට කිසිම සැකයක් නෑ. අපි ඒ පහරින් බේරෙන්න ඕනෑ නිසයි තමුන්නාන්සෙලගෙ මේ යෝජනාවට අපි මේ අවස්ථාවේදී විරුද්ධ වන්නෙ. මෙය නීති ප්‍රශ්නයක් පමණක් නොවෙයි; මුළු රටටම බල පාන මූලික දේශපාලන ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ උතුරු නැගෙනහිර පළාත්වල යුද්ධ හමුදාව ඉවත් කරගෙන තිබෙනවා. යුද හමුදාව එහි සිටින දවස්වල, සොල්දාදුවන් නිසා බවලත් කෙනෙකුටවත් පරීක්ෂණයක් මහ පාරෙ යන්න බැරිය ආදී වශයෙන් නොයෙක් විධියේ චෝදනා පැතුරුණා. අද, ඉන්දියාවෙන් එන කල්ල තෝනීත් වළක්වන්නවත්, ඔවුන් අල්ලන්නවත් කිසිම උත්සාහයක් නෑ. සමහර විටක කල්ලතෝනියකු අහු වුණත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ඔහු වැල්ලෙදි අහු වුණු කෙනකු නොව කලින් ඇවිත් සිටි කෙනෙක්. මේ රජයේ අදහස ලංකාව එකම රටක් හැටියට ආරක්ෂා කරගෙන තියා ගන්නද? එසේ නැත්නම්, කොටස් වශයෙන් පුංචි පුංචි "අරසු" වලට කඩා වෙන් කරන්නද? ඒකයි අද කල්පනා කරන්න තියෙන ප්‍රශ්නය. විරුද්ධ පක්ෂයෙ අපි කවදාවත් ඒ අදහසට රුකුල් නොදෙන බව මේ අවස්ථාවෙදි විශෙෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි, මේ ආණ්ඩුවෙ ඉති ඇමතිවරුන්ගෙ දැන ගැනීම පිණිස.

මේ යෝජනාව අමුතු එකක් නොවන බවත්, දිවංගත ගරු බණ්ඩාරනායක අග මැතිතුමා මේ වචනවලින්ම මෙය ඉදිරිපත් කළ බවත්, ඊට පසුව සී. පී. ද සිල්වා ගරු ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙ සිටි කාලයෙදිත් මේ යෝජනාව මේ වචනවලින්ම ඉදිරිපත් කළ බවත් ගරු රාජ්‍ය ඇමතිතුමා නිතරම කියනවා. බණ්ඩාරනායක අගමැතිතුමාට මෙය හොඳ නම්, සී. පී. ද සිල්වා ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මෙය ඉදිරිපත් කළ විට එය හොඳනම්, බණ්ඩාරනායක මැතිණියගෙ පක්ෂයට දැන් මේ වචන නරක ඇයිදැයි ගරු රාජ්‍ය ඇමතිතුමා අපෙන් ප්‍රශ්න කරනවා. ඒකට දෙන්න තියෙන පිළිතුර මේකයි. එදා ඉදිරිපත් වුණු යෝජනාවලත් මේ යෝජනාවෙත් විශාල වෙනසක් තිබෙනවා. බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කාලයෙදි එෆ්පෙඩරල් පක්ෂයෙ මන්ත්‍රීවරු ඇමතිකම් දරාගෙන එෆ්පෙඩරල් වාදය ගැන කථා කරගෙන ගියෙ නෑ; එෆ්පෙඩරල් අදහස් ප්‍රකාශ කළේ නෑ. එදා මහජනයගෙ හිතේ බියක් තිබුණෙ නෑ ආණ්ඩුව ගෙනයන ව්‍යාපාරයකින් රට විනාශ වන බවට. නමුත් දැන් ඒ බිය මහජනයා තුළ ඇති වී තිබෙනවා. රහස් ගිවිසුම් ඇති කරගෙන, තුනම නැති වුණත් මඟුලක් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න එෆ්පෙඩරල් පක්ෂයත් සමඟ මේ රජය ඉදිරිපත් වන විට අපට බියක් ඇති වීම පුදුමයක්ද? මේ යෝජනාවේ තිබෙන්නේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ වචනයි කියා කිව්වට තදියන්නෙ නැහැ. බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේ නම් මේ වචනවලින් රටට කිසිඳු හානියක් වෙන්නට ඉඩක් තිබුණේ නැත කියන එක කවුරුත් පිළිගන්නවා. බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු කාලයේදී ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා මේ අදහස ඉදිරිපත් කළත්, එයිනුත් රටට හානියක් වන්නට ඉඩක් තිබුණේ නැහැ. එහෙත්, අද තත්ත්වය එයට හාත්පසින්ම වෙනස්. එෆ්පෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා වල් අනුව සිතන විට, අද තත්ත්වය අනුව මෙයින් රටට හානියක් සිදු වන එක ගැන කිසිම සැකයක් නැහැ. උතුරු නැගෙනහිර පළාත්වල දෙමළ ළමයින් සිංහල හෝඩිය ඉගෙනීම ගැනත් එෆ්පෙඩරල් පක්ෂය විරුද්ධ වුණා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

උතුරු නැගෙනහිර පළාත්වලට සිංහල ගුරුවරුන් යවා සිටිනවා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මුස්ලිම් ළමයින්ට උගන්වන්න වෙල්වනායගම් මහතාගේ අවසරය පිට යවා තිබෙනවා. කොහේද, මොන දෙමළ ළමයද සිංහල ඉගෙන ගන්නේ කියා කරුණාකර පෙන්වා දෙන්න. තමුන්නාන්සේ දන්නා කියන දෙමළ අයත් ඉන්නවානේ. ඒ අයවත් තවම සිංහල ඉගෙන ගන්නෙ නැහැ. ඊරියගොල්ල ඇමතිතුමා එඩිතරව ක්‍රියා කළ නිසා සිංහල ගුරුවරුන් කීප දෙනෙක් උතුරු නැගෙනහිර පළාත්වලට යවන්නට තමුන්නාන්සේලාට පුළුවන් වුණා. ඒ ඇමතිතුමා තම අදහසෙහි නොසෙල්වී සිටි නිසා තමයි, මුස්ලිම් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා වෙල්වනායගම් මහත්මයගෙන් ඒ විකවත් ලබා ගන්න පුළුවන් වුණේ. ඊරියගොල්ල ඇමතිතුමාගේ අනිකුත් ක්‍රියාවන් වැරදිවුණත් එතුමා සිංහල ජනතාවගේ අයිතිවාසිකම් සඳහා මේ අවස්ථාවේදී සටන් කළ කෙනෙක් බව නම් මා පිළිගන්නවා. ගුරුමාරු ආදී දේවල් පිළිබඳව එතුමාට අපි දොස් කියන එක ඇත්තයි. එහෙත්, සිංහල ගුරුවරුන් උතුරු නැගෙනහිර පළාත්වලට යැවීමේ ප්‍රශ්නයේදී එතුමා එඩිතරව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිංහලයෙක් හැටියට ක්‍රියා කළා. තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමාත් (එදිරිසූරිය මයා.) —එතුමා මේ අවස්ථාවේ මෙහි නැහැ—එදා නැටුවේත්—කොකා පෙන්වන්නට ලැහැස්ති වුණෙත්—සිංහල ජනතාව වෙනුවෙනුයි. ඒ නිසා මෙය සැලකිල්ලෙන් කල්පනා කළ යුතු දෙයක්. "මේ යෝජනාවේ තිබෙන්නේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ වචනයි, ඒ නිසා මෙය නොපිළිගන්නේ ඇයි" කියා කියන නමුත් ෆෙඩරල් පක්ෂයක් ඒ කාලයේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුවට ගෑවිලා නොසිටි බව කියන්න ඕනෑ. අන්න ඒ නිසා දැන් වෙනසක් ඇති වී තිබෙනවා. දැන් තමුන්නාන්සේලාට ආණ්ඩු කරන්නට සිදු වී තිබෙන්නේ වෙල්වනායගම් මහතාගේ අවසරය ඇතිවයි. පසුගිය කාලයේ දවසක අධ්‍යාපන වැය ශීර්ෂය ගැන සඳහන් කළ අවස්ථාවක ගරු අගමැතිතුමා දුන් පිළිතුරක් ගැන මට මතකයි. ඒතුරු නැගෙනහිර පළාත්වලට සිංහල ගුරුවරුන් යවන්නේ කවදාදැයි මා ඇසූ විට අගමැතිතුමා දුන් පිළිතුර කුමක්ද? වෙල්නායගම් මහත්මයාගෙන් අසාබලා අවසර දුන්නොත් යවන්නම් කිව්ව. [බාධා කිරීමක්] මම බොරුවක් නොවෙයි කියන්නෙ. තමුන්නාන්සේ හිටියද නැද්ද මම දන්නෙ නැහැ.

I raised the question in the last Budget Debate during the discussion of the Education Votes.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
I am surprised.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
I will show you the HANSARD. I can assure you that you were not more surprised than I was.

අගමැතිතුමා එවැනි වචනයක් කී විට මා පුදුම වුණා. අපි ඒ තරම්ම පහළ තත්ත්වයකට වැටී සිටිනවාය කියන එක ඒ දක්වාම මා විශ්වාස කළේ නැහැ. අවස්ථාවේ හැටියට මෙවැනි දේවල් පිළිනොගැනීම පුදුමයක් නොවෙයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මම සොයා බලන්නම්.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
තමුන්නාන්සෙට විශ්වාස නැත්නම් මම හැන්සාඩ් වාර්තාව ගෙනැවිත් පෙන්වන්නම්. [බාධා කිරීමක්] එය පෙන්නුවොත් තමුන්නාන්සේ ආපසු මේ පැත්තට එනවද?

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
මෙහාට නම් එපා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
ඔය විධියේ ප්‍රශ්න උඩ කොතරම් දක්ෂ අන්දමින් අපට කථා කළත්, රීති ප්‍රශ්න මතුකර වාද විවාදවලින් බේරුණත්, රාජ්‍ය ඇමතිතුමා මොනවා කිවත්, ඔවැනි ක්‍රියා මාර්ගවලින් සිංහල ජනතාව පාවාදීමක් සිදු වන බව නම් කියන්නට ඕනෑ. මෙවැනි ප්‍රශ්නවලදී විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය තමුන්නාන්සේලාට නොදීමෙන් එවැනි පාවාදීම්වලට තමුන්නාන්සේලාට අවස්ථාවක් නොසැලසෙන බව ප්‍රකාශ කරන අතරම, එවැනි පාවාදීම්වලට අපි ඉඩ නොදෙන බවත් කියන්න ඕනෑ. ඒකයි පිළිතුර. අපි තමුන්නාන්සෙලට අවස්ථාවක් දෙන්නෙ නැහැ. නායකයන්ට එහෙම හිතුනත් බලය තහවුරු කර ගැනීමට අපි අවස්ථාවක් දෙන්නෙ නැහැ. එවැනි අවස්ථාවක් තමුන්නාන්සේලට ලැබෙන්නෙ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
පාවා දෙන්නෙ නැහැ කවුරුවත්.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
තමුන්නාන්සෙට ලැජ්ජ නැද්ද? මම වෙල්වනායගම් මහත්මයගෙන් අවසරය ලබාගෙන ගුරුවරුන් යවනවාය කියා අග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

මැතිතුමා කියනවා. තමුන්නාන්සෙ කියනවා පාවාදීමක් නැත කියා. තමුන්නාන්සෙ පාවා දී හමාරයි. තමුන්නාන්සේට ඒ රහස් ගිවිසුම පෙන්නුවෙත් නැහැ. තමුන්නාන්සෙට ඒ රහස් ගිවිසුම පෙන්වන්න ඕනෑකමකුත් නැහැ. තමුන්නාන්සෙ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර හමාරයි. තමුන්නාන්සෙගෙන් ගන්න තියෙන හරිය අරගෙන හමාරයි. වෙල්වනායගම් මහත්මයත් සමග එදා කළ ඒ සාකච්ඡාවේ ලියකියවිලි තමුන්නාන්සෙට පෙන්නුවෙත් නැහැ. ඒකයි තත්ත්වය. අප කියන්නෙ ජාතික අයිතිවාසිකම් අප කාටත් ඉතාමත් වටිනා උරුමයක් බවයි. පොළොන්නරුවේ හිටියත් මින්නේරියෙ හිටියත් දොම්පෙ හිටියත් බෙලිඅත්තෙ හිටියත් මැද කොළඹ හිටියත් අප කවුරුත් මේ අවස්ථාවේදී සිංහලයින් හැටියට කල්පනා කළ යුතුයි. ජාතික සමගිය කල්පනා කරන්ටත් ප්‍රථම යෙන් අපි පළමුකොටම සිංහල මනුෂ්‍යයින් හැටියට කල්පනා කරන්ට ඕනෑ. මා මේ අවස්ථාවේදී කථා කරන්නේ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව හෝ තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව හෝ නොවෙයි. මා කථා කරන්නෙ පළමුකොටම සිංහල මනුෂ්‍යයකු හැටියට හා සිංහල ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියටයි. මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නෙ මගේ ඡන්දදායක කොට්ඨාශයෙ ඡන්දදායකයන්ගෙ අදහසුයි. ඇත්ත වශයෙන්ම අප තුළ සැහෙන බියක් නිබෙනව ඇමතිතුමනි. ඒක බොරුවක් නොවෙයි. ටිකක් සොයා බැලුවොත් තමුන්නාන්සේට එය පෙනේවි. ළඟදී දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) ඇසූ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය එක්තරා ඉඩම් ලැයිස්තුවක් ඉදිරිපත් කළා. ඒ ඉඩම් ලැයිස්තුව දෙස නැවත වරක් බලන්න ඇමතිතුමනි. තමුන්නාන්සෙ එය දුටුවාද කියා මා දන්නෙ නැහැ.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

අක්කර 14,000 කින් අක්කර 1,000 ක් වත් සිංහල මිනිසුන්ට ලැබී නැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

තමුන්නාන්සෙ බෙදා දුන් ඉඩම්වලින්, අක්කර 14,000 කින් අක්කර 1,000 ක් වත් සිංහල මිනිසුන්ට ලැබී නැහැ. ඒකයි වර්තමාන තත්ත්වය. මෙවැනි දේවල් සිදුවන විට අපේ මිනිසුන් භයවීම පුදුමයක් නොවෙයි. අක්කර 14,000කින් සිංහල මිනිසුන්ට අක්කර 1,000ක්වත් ලැබී නැහැ.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

That is a lie.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

நீங்கள்தாம் இதெல்லாம் கெடுத்தது; இந்த மோசமெல்லாம் செய்தது.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

To whom was the balance land alienated ?

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

அவருக்குத் தமிழ் தெரியாது.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට එතුමාගේ භාෂාවෙන් පිළිතුරු දෙන්න මා ඒ භාෂාව දන්නෙ නැහැ. මා ඒ භාෂාව ඉගෙන ගත් දවසක ඉතාමත් සතුටින් එතුමාට පිළිතුරු දෙන්ට ලැස්තියි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

එයා දෙමළ දන්නෙත් නැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මට සිංහල ඉගෙන ගන්න පුලුවන් වුණා නම් නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට අනාගතයේදී දෙමළ පමණක් නොවෙයි සිංහලත් ඉගෙන ගන්න පුලුවන්ය කියා මා විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි සාකච්ඡාවලදී අපේ මූලික ප්‍රශ්න විසඳා ගන්න අප උත්සාහ දරණවාද? දැන් අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්ට කල්පනා කරනවා. එසේ නම් දැන් තිබෙන ව්‍යවස්ථාවෙ තිබෙන වරද කුමක්ද? මේ ගරු සභාවේ අප දෙපාර්ශ්වය කියනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්ට වුවමනාය කියා. ඇයි මේ ව්‍යවස්ථාව වෙනස් කරන්නෙ? මේක වෙනස් කළයුතු නම් වරදක් තියෙන්න ඕනෑ නේද? මේ පාර්ලිමේන්තු සභාවත් ව්‍යවස්ථාවට අදාළයි. මේ පාර්ලිමේන්තු සභාව ගැන මොකක්ද අපේ අදහස? මේ සභාව ලොකු වැඩිය කියා අපි සිතනවාද? නැත්නම් මේ සභාව පුංචිය කියා අපි සිතනවාද? මේ පාර්ලිමේන්තු සභාවට තිබෙන බලතල වෙනස් කළයුතුය කියා අපි සිතනවාද? සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය ගැන නම් අප දෙපාර්ශ්වයේම එතරම් විශ්වාසයක් නැහැ. අපේ මීරිගම ගරු මන්ත්‍රීතුමිය (ජේ. පී. ඔබේසේකර මිය.) කැනඩාවේදී සෙනෙට් සභාවට ටොක්කකුත් ඇන තිබෙනව. සමහර විට ඒ ටොක්ක ඇන්නෙ එතුමියගෙ මහත්මයට වෙන්නත් ඇති. මේ පාර්ලිමේන්තු සභාව හොඳ මදි නම් අපි මේක වෙනස් කරන්නෙ කොහොමද කියා මා ප්‍රශ්න කරන්ට සතුටුයි. අපේ අදහස මම කෙළින්ම කියන්න ලැස්තියි. අප කල්පනා කරන හැටියට පාර්ලිමේන්තු සභාවේ ප්‍රශ්නයක් නැහැ. පාර්ලිමේන්තු සභාවට ආ යුත්තේ ජන්ද යෙන් පත් වන මන්ත්‍රීවරුයි. ඒක වෙනස් කරන්න අපි කල්පනා කරන්නෙ නැහැ. නමුත් මේ යල් පැනපු ස්ථාවර නියෝග පොත, දොඩම්පෙ මුදලාලි ජනේලයෙන් වීසි කළා වගේම වීසි කළ යුතුයි. මේවා තියා ගැනීම නිසා තමයි, අපට ලෙඩ බෝ වන්නෙ. තමුන්නාන්සෙගෙ වරදක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තමුන්නාන්සෙටත් මේ පොත අනුව තමයි, වැඩ කරන්න සිදු වන්නෙ. මේ පොත ඉරා දමන්න ඕනෑ.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

එතකොට වෙන පොතක් ගන්න ඕනෑ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

වෙන පොතක් ගන්න නොවෙයි, මා කියන්නෙ. රෙගුලාසි අනුව නොවෙයි, මහ ජනතාවගේ අවශ්‍යතා අනුව අපේ සාකච්ඡා ගෙන යන්නයි, අපි කල්පනා කරන්නෙ. පොතේ හැටියට වැඩ කරන්න නොවෙයි, අපි කියන්නෙ. අප පත් කරල තියෙන්නෙ ජන්දදායකයෝ. අප පත් කර තිබෙන ඒ ජන්දදායක යන්ට වුවමනා හැටියටයි, අප ඒ අය නියෝජනය කරන්න ඕනෑ. එංගලන්තයේ සෑදූ අනවශ්‍ය රෙගුලාසි අනුව නොවෙයි, අප කටයුතු කළ යුත්තේ. නඩුවක් තිබුනත් නැතත්, බොරුවට නඩුව කට අදාළය කියා මේ ගරු සභාවේ ඇති වන සාකච්ඡා වැළැක්වීම නොවෙයි, කළ යුත්තේ. අපේ හැඟීමේ හැටියට, යම් කිසි ප්‍රශ්නයක් මතු කරන්න—යම් කිසි ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කරන්න—මහ ජනතාවට අවශ්‍යතාවයක් තියෙනව නම්, නීති රීති පැත්තකින් තියෙද්දි, ඒක කරන්න මේ ගරු සභාවේ ඉඩ තිබෙන්න ඕනෑ.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

අදත් ඔය පොත අපව කාල දැම්මා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

අද පොත නිසා නොවෙයි, අපිත් සුළු වරදක් කළා. නමුත් අපේ හැඟීමේ හැටියට අදත් පොත කියෙව්වා වැරදියි. අද තිබුණු යෝජනාව "මෝෂන්" එකක් හැටියට ගණන් ගත්ත නිසා වැරදියි. 39 වැනි වගන්තියෙ හැටියට ඒක "ඔඩර් ඔෆ් ද ඩේ" හැටියට ගණන් ගත්ත නම් හරි.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You do not want me to go into that matter. Look at Standing Order 21 (2).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

Of course, you cannot go into that matter. ඇත්තෙන්ම තමුන්නාන්සෙට ඒක නැවත මතු කරන්න බැහැ. ඒක ගරු කථානායකතුමාගේ තීරණයක්. අපි කව්රුත් ඒකට යටත් වෙනව. අපි ඒකට විරුද්ධ නැහැ. ගරු කථානායකතුමා අවංකවම ඒ තීරණය කළ බවයි, අපි කල්පනා කරන්නෙ. අපි ඒ තීරණය නිසා වර්ජනයක් කළෙත් නැහැ. අපි ඒ තීරණය සම්පූර්ණයෙන්ම පිළිගත්ත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ස්ථාවර නියෝග එක කාරණයක්. දෙවැනි කරුණ මොකක්ද? අපි මෙය කෙළින්ම කියා සිටිනව: මේ මන්ත්‍රීවරුන් පත් කළ යුත්තේ පොදුවේ රටේ යහපතට ගැළපෙන හැටියට කටයුතු කරන්න පොරොන්දු වෙනවය කියා දිවුරුම් අරගෙනයි; නෙකශ්‍රීන් විරාජමාන දෙවැනි එළිසබෙත් මහ රැජිනට කීකරු වෙනවය කියා නොවෙයි. රටට ලැදිව කටයුතු කරන බවට විශේෂ පොරොන්දුවක් මන්ත්‍රීවරුන් දිය යුතුයි. පාර්ලිමේන්තුව තුළදී හෝ පාර්ලිමේන්තුවෙන් පිටතදී හෝ රට දෙකට තුනට බෙදන්නට ක්‍රියා කරන්නෙ නැත කියා විශේෂ පොරොන්දුවක් දිය යුතුයි.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

How about the oath of loyalty to the Prime Minister who was in the Senate?

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

තමුන්නාන්සේ එවැනි දිවුරුම් නොයෙකුත් අවස්ථාවලදී දීල තියෙනව; මේ පාර්ලිමේන්තුව තුළදි නොවෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

When there are interruptions like that, you will realize the usefulness of the Standing Orders.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

ස්ථාවර නියෝග නැතුව නල්ලුර්හි මන්ත්‍රීතුමා සමග ඕවා බේරා ගන්න මට පුළුවන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට වඩා හොඳ ලොකු පොල්ලක් මගේ අතේ තියෙනව.

මේ රටේ එක්සත්කම නැති කරන්නට කටයුතු කරන, මේ රටේ නිදහසට සහ මේ රටේ පොදු ජනතාවගේ අයිතිවාසිකම්වලට විරුද්ධව නැගී සිටින, පිරිසක් සිටිනවා නම්, පාර්ලිමේන්තුවට පත්වී පාර්ලිමේන්තු ක්‍රමය නැති කරන්න උත්සාහ දරන පිරිසක් සිටිනවා නම්, එවැනි පිරිස්වලට—එවැනි පක්ෂවලට—අපේ ලංකාවේ ඉඩක් නොතිබිය යුතු බවයි අපේ කල්පනාව. සාමාන්‍යයෙන් වෙනත් රටක එවැනි දෙයක් සිදු වෙනවා නම්—රට දෙකට තුනට කඩන්නට උත්සාහ කරන අය සිටිනවා නම්—කුමන්ත්‍රණ කරුවන් හැටියට අල්ලා නඩු දමා නීත්‍යානුකූලව ක්‍රියා කර ඒ අය හිරේ දමනව. නමුත් අපේ රටේ අපි නීතියෙන් ඉඩ දී තිබෙනව, රට කොටස් කරන්න උත්සාහ කරන අයට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට "අරසු" කිපයකට බෙදන්න අපි කවදාවත් ඉඩ දෙන්නෙ නැහැ. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න ලැස්ති බව තමුන්නාන්සෙල හැමදාම කියනව. කොහොමද වෙනස් කරන්නෙ? මොනවද තමුන්නාන්සෙලගෙ අදහස්? ගරු රාජ්‍ය ඇමතිතුමා හැමදාම කියනව, අපි වාඩි වෙලා මේ ගැන කථා කරමු කියා. නමුත් මේ ගරු සභාවේ ඒ අදහස් කියන්න ලැස්ති නැහැ. ඇයි? රජය වෙනුවෙන් තමුන්නාන්සෙලගෙ අදහස කුමක්ද කියා අපි අහනව. තමුන්නාන්සෙල ෆෙඩරල් වාදය පිළිගන්නවද, නැද්ද?

ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

No! සම්පූර්ණයෙන් විරුද්ධයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

බොහොම සන්තෝෂයි. වැලිගම පළාතෙ උදවිය රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට ගරු කරාවි සදාකාලිකවම, එතුමා ෆේපඩ රල් වාදයට විරුද්ධව ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කළ නිසා.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
ඔව්.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මාත් ගරු කරනව තමුන්නාන්සෙට. නමුත් තමුන්නාන්සෙත් සමග සහෝදරත්වයෙන් සිටින පළාත් පාලන ඇමතිතුමා අනික් අතට කතා කරන විට සිදු වන තත්ත්වය කුමක්ද? එතකොට කවුද ආණ්ඩු කරන්නෙ? පළාත් පාලන ඇමතිතුමාද, තමුන්නාන්සෙද? ඒකයි, අපි අහන ප්‍රශ්නය.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
That is his private view.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

Private view නොවෙයි. Private view කියල හරියන්නෙ නැහැ. "මේස වටේ වාඩි වෙලා සාකච්ඡා කොට මෙම ප්‍රශ්නය බේරුම් කරන්ට තමුන්නාන්සෙල ඉදිරිපත් නොවන්නෙ ඇයි" කියා අපෙන් අහනව. තමුන්නාන්සෙ වාගෙ උදවියත් සමග නම් අපට පුළුවනි සාකච්ඡා මගින් මෙම ප්‍රශ්නය බේරුම් කර ගන්න. "මගෙ අදහස තමයි හරි; තිරුවෙල්වම් මහතා කියන්නෙ ඒ මහතාගෙ පුද්ගලික අදහසයි" යනුවෙන් තමුන්නාන්සෙ කොතරම් දුරට කීවත් අපි එය විශ්වාස කරන්නෙ කොහොමද? ඒ කතාව ප්‍රසිද්ධියෙ කියයුත්තෙ ගරු අගමැතිතුමයි. "උතුරු නැගෙනහිර පළාත්වලට සිංහල ගුරුවරුන් යවන්නම් චෙල්වනායගම් මහත්මයාගෙන් අහල; ඔහුගෙන් අවසර ලබාගෙන" යනුවෙන් තමයි එතුමා කියන්නෙ. එසේ කතා කරන විට අපේ විශ්වාසය පහත බහිනව. එතකොට අපට තේරෙනව තමුන්නාන්සෙට තිබෙන බලය වැලිගමට පමණක් සීමා වී තිබෙන බව.

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)

Why did you not send the teachers to the North and the East when you were in power?

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

අපි යැව්වෙ නැත්තෙ ඇයි? [බාධා කිරීම්] කච්චේරිය වට කර ගෙන සිටිද්දී [බාධා කිරීම්] ඉස්සෙල්ලම තමුන්නාන්සෙල කච්චේරියෙන් ඉවත් කරන්න සිදු වුණා. කොහොමද මිනිස්සු යවන්නෙ? තමුන්නාන්සෙල එලවා දමන්නෙ නැතුව හාල් සලාකය වත් බෙදා දෙන්න බැරි වුණා. [බාධා කිරීම්] අපි විභාග පැවැත්තුව. තමුන්නාන්සෙල ඉවත් කරන එක බොහොම ලෙහෙසි වැඩක්. ඔක්කොම එවෙලෙම පැනල දිව්ව.

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. Sivasithamparam)

I was there and I still bear the marks of what your soldiers did to me that night outside the kachcheri. I did not run away.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

එක රාත්‍රියෙන් වැඩේ හරි. පාර වැදුනාම ගියා. [බාධා කිරීම්] මේ දැන් තමුන්නාන්සෙලට රත් වේගෙන එන්නෙ. 4.30 කිට්ටු වේගෙන එන නිසයි. මම අද ඉවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ්ඒ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

කරන්නෙ නැහැ, මගෙ කතාව. මම මීළඟ දවසෙත් කතා කරනව. මම ඒ බව ප්‍රසිද්ධියෙ කියනව. මේ මන්ත්‍රීවරු නැගිටල කොච්චර ඝෝෂා කළත් මම කලබල වෙලා වාඩි වෙන්න අදහස් කරන්නෙ නැහැ.

මම මුලින් තමුන්නාන්සෙලට ප්‍රකාශ කළ පරිදි එක්තරා කාරණයක් දැන් ඔප්පු කරන්ට ලැස්තියි. සිංහල ගුරුවරුන් සම්බන්ධව ගරු අගමැතිතුමා දරණ අදහසක් පිළිබඳව මා කිව. ඒකට ඉඩම් ඇමතිතුමා පුදුම වුණා, ඩඩ්ලි සේනානායක මැතිතුමා එවැනි පොරොන්දුවක් දේවිද කියන සැකය උඩ. එම නිසා මම ඒ ප්‍රකාශය දැන්මම ඉදිරිපත් කරන්ට ලැස්තියි. මේ හැන්සාඩ් වාර්තාවක තියෙනව. [බාධා කිරීම්] මට තව කාලය දෙනවා නම්, ඉඩ දෙනවා නම්, මම සොයා දෙන්නම්. එහෙම නැති නම් මට තව දවසකට ඉඩ දෙන්න. මගේ මතකය වරදින්න විධියක් නැහැ. 1966 ජූලි 21 වනදා පළ වුණු 67 වන කාණ්ඩයෙ නිල වාර්තාව අරගෙන බැලුවොත් මම සඳහන් කළ කාරණය ගැන බලා ගැනීමට පුළුවනි. [බාධා කිරීම්] මම ඔය අභියෝග කවදත් භාර ගන්න ලැහැස්තියි. මම වැරදි නම් මෙම ගරු සභාවෙදී කියන්නේ නැහැ.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මොනවද ඔව්වු, ආසනයට ආසනය ඔව්වු වට තබමු.

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1966 දෙසැම්බර් 6 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 4.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

விவாதம், 1966 டிசம்பர் 6 ஆம் திகதி, செவ்வாய்க் கிழமை மீள ஆரம்பமாகும்.

It being 4.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Tuesday, 6th December 1966.

කල් තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு வினா எடுத்தியம்பப் பெற்றது.

Motion made and Question proposed,
"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

ඒ්. ලතීිෆ් සින්න ලෙබ්බෙ මයා. (මඩකලපුව දෙවන මන්ත්‍රී)
(ஜனாப் ஏ. லதிப் சின்னலெப்பை—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. Latiff Sinnalebbe—Second Batticaloa)

I wish to raise a certain matter with the Hon. Minister of Land, Irrigation and Power. It is an issue which is the subject of a severe campaign by certain sections of the press. It appears that they seek to discredit the National Government by casting aspersions on a particular Member of the Cabinet. I refer to the appointment of the Chief Valuer in the Valuation Department.

It is usual for a departmental officer to succeed to the vacancy caused by the retirement or vacation of office of the head of the department whose work is of a specialized nature. The post is not advertised except under exceptional circumstances.

In this connection I would refer to the fact that when this post fell vacant the deputy head of the department was not allowed to act in the post. May I ask the Hon. Minister why the deputy, that is the Senior Assistant Valuer, was not permitted to act? Was he found wanting or was he inefficient? I am also reliably informed that the department, in other words, the Ministry—and especially the Permanent Secretary—had made recommendations that the age limit must be altered.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

In this connection I would like to refer to the requirement which says that as far as the post of Chief Valuer is concerned the age qualification is that he should be between 21 and 30 years. The upper age limit for those holding qualifications such as B.Sc. (Estate Management) of the London University, B.A. (Estate Management) of the Cambridge University, Final Examination of the Royal Institution of Chartered Surveyors (Valuation Division), etc., is 35 years. Now this has been the accepted code according to which the past appointments had been made. Why and on whose recommendation did they want to alter this? Was it done in order to see that this post was given to a particular officer who may be in the favour of somebody in a particular Ministry?

I am told that the Public Service Commission on representations made by one Mr. D. P. Abeygunawardene of the Valuation Department——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You cannot refer to Public Service Commission matters here.

ලතීෆ් සින්නලෙබ්බේ මයා.
(ஜனூப் லதீப் சின்னலெப்பை)
(Mr. Latiff Sinnalebbe)

I am sorry, but this is something I am asking the Hon. Minister.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You can ask the Minister.

ලතීෆ් සින්නලෙබ්බේ මයා.
(ஜனூப் லதீப் சின்னலெப்பை)
(Mr. Latiff Sinnalebbe)

It pertains to his Ministry.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Who is the Minister concerned?

ලතීෆ් සින්නලෙබ්බේ මයා.
(ஜனூப் லதீப் சின்னலெப்பை)
(Mr. Latiff Sinnalebbe)

The Minister of Land, Irrigation and Power.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

It is a matter for the Public Service Commission.

ලතීෆ් සින්නලෙබ්බේ මයා.
(ஜனூப் லதீப் சின்னலெப்பை)
(Mr. Latiff Sinnalebbe)

I must congratulate the Public Service Commission for this reason: they have now altered the age qualification and made the upper age limit 35 years again.

